# දෙසතිය

පුවත් සඟරාව
2024 අගෝස්තු



# ඉඩමට සින්නක්කර අයිතිය

# කේරලයේ කඳුළු

දකුණු ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ ඇති වූ ධාරානිපාත වැසි හේතුවෙන් සිදු වූ නායයෑම් ඇති කළ බලපෑම අතිවිශාල බව විදෙස් මාධ්‍ය වාර්තා කරයි. 2024 ජුලි 30 දින අලුයම නිවැසියන් නිද සිටියදී මේ නායයාම සිදු වී ඇති අතර මෙය ලියන මොහොත වන විට ජීවිත හානි 400 ඉක්මවා ගොස් තිබිණි. 2018 වසරේ ගංවතුර හේතුවෙන් පුද්ගලයන් 400කට වැඩි පිරිසක් මිය ගිය පසු කේරළයට බලපෑ දරුණුතම ව්‍යසනය මෙය බව ද සඳහන් ය.

බටහිර ඝාට්ස් කඳු පන්තියට අයත් වයනාඩ් (Wayanad) දිස්ත්‍රික්කය මෝසම් සමයේදී නායයෑම්වලට ගොදුරු වන කඳුකර දිස්ත්‍රික්කයක් බව වාර්තා වේ. මෙහි මුන්දක්කායි (Mundakkai), අත්තමාල (Attamala), චූරල්මල (Chooralmala ) සහ කුන්හෝම් (Kunhome) ඇතුළු ප්‍රදේශ කිහිපයක් නාය ගොස් ඇත.

ඉන්දියාවේ වඩාත් ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස සැලකෙන මෙහි තේ, එනසාල් සහ කුඩා ජනාවාස දක්නට ලැබෙන අතර මියගිය පිරිසෙන් වැඩි දෙනකු තේ වතු කම්කරුවන් ය. නායයෑමට පෙර දින දෙකක් තුළ මිලිමීටර් 572ක පමණ වර්ෂාවක් හටගෙන ඇත.

**චන්දන මාරසිංහ**



# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 46, කලාපය 08,
2024 අගෝස්තු

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
**දිනිත් චින්තක කරුණාරත්න**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**
46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න
**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව




20 ඉඩමට සින්නක්කර අයිතිය


15 අභ්‍යවකාශ ජනාවාසකරණයේ ලකුණු


03 රන්දොර උරුමය


34 වැඩිහිටියන් ළමයින්ට ඇඳීම


05 ශාක සුරක්ෂාව



40 ඔලිම්පික් සිරි අසිරි

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ........................................

Address ........................................

........................................

........................................

........................................

ID Number ........................ Tel / Mobile ........................

Signature ........................ Date........................

දෙසතිය සඟරා දායකත්වය

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලාබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය........................ හා ........................ දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් ''ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්'' නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05


# බුද්ධිමත් ජනමතයකට මාධ්‍ය සම්බිමක්

නිදහස් ශ්‍රී ලංකාවේ 09 වැනි ජනාධිපතිවරණය 2024 සැප්තැම්බර් මස 21 දින පැවැත්වෙන බව රජය නිල වශයෙන් ප්‍රකාශ කර ඇත. ප්‍රධාන දේශපාලන පක්ෂ ඇතුළු ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් ඡන්ද අපේක්ෂකයෝ රැසක් ඊට තරග කරති.

මැතිවරණ උණුසුම දිනෙන් දින වැඩිවෙමින් පවතින මොහොතක ඡන්ද අපේක්ෂකයන් දිනවීමට මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය දියත් වීම සාමාන්‍ය කරුණකි. එහිදී මාධ්‍ය සිදු කරන බලපෑම සුළුපටු නොවේ. එය පවතින ආණ්ඩු වෙනස් කිරීම සහ නව ආණ්ඩු බලයට පත් කිරීම දක්වා වන පොදු කරුණකි. විද්‍යුත් මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය මෙන් ම සමාජ මාධ්‍ය ලෙස සිදු කරන මෙම බලපෑම සිය මාධ්‍ය වපසරිය තුළ වෙනස් වෙයි. මෙහිදී කැපී පෙනෙන කාරණය වන්නේ විශේෂයෙන් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන හිමිකාරිත්වය දරන දේශපාලන දැක්ම මත මාධ්‍ය හැසිරීම සිදු වන අතර ඡන්ද දායකයාගේ තීරණය එය මත දෝලනය වීම ය. එනම් ජනමතය තීරණය කරන ප්‍රධාන සාධකයක් බවට ජනමාධ්‍ය පත් ව ඇත. එසේ ම සමාජ මාධ්‍ය ද මේ කාර්යයේදී කැපී පෙනේ.

එබැවින් ජනතා පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට අපක්ෂපාතී මාධ්‍ය ප්‍රචාරණය වැදගත් බව පිළිගත් මතයයි. එවැන්නක අවශ්‍යතාව පැන නැගෙන්නේ විශේෂයෙන් මැතිවරණ සමයේ පුද්ගල ප්‍රතිරූප ගොඩනැගීම මත මාධ්‍ය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර ම එය සැබෑ ජනමතය ප්‍රකාශ වීමට ඇතැම් විට අහිතකර ව බලපාන බැවිනි.

එම නිසා මෙවර ජනාධිපතිවරණය සඳහා ද මැතිවරණ කොමිෂන් සභාව මාධ්‍ය උපමාන ඉදිරිපත් කර තිබේ. එයින් කියැවෙන්නේ ඡන්ද විමසීම පැවැත්වෙන කාලසීමාවේදී විද්‍යුත් මාධ්‍ය ආයතන, අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වෙබ් අඩවි පරිපාලකයන් මෙන් ම මුද්‍රිත මාධ්‍ය ආයතන අපක්ෂපාතී ව සිය මාධ්‍යකරණයෙහි නිරත විය යුතු බව ය. මාධ්‍ය ආචාරධර්මවලට අනුකූල වෙමින් ඒවායින් බැඳී ක්‍රියා කිරීම සිය මාධ්‍ය ආයතනවල වගකීම වන බව ය.

මෙම කාර්යය නිසි ලෙස සිදු වන්නේ ද යන්න නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීමේ නියෝජිත කමිටුවක් පත් කිරීමට ද පියවර ගෙන තිබේ. එයින් පෙනී යන්නේ මෙසමයේ මාධ්‍ය සිය වාර්තාකරණයේදී ඉතා සැලකිලිමත් විය යුතු බව ය. විශේෂයෙන් තම මාධ්‍ය ආයතනය කුමන දේශපාලන මතයක් දැරුව ද සියලු ඡන්ද අපේක්ෂකයන් සඳහා ජනතාව ආමන්ත්‍රණය කිරීමට සම්බිමක් නිර්මාණය කර දීමට එම මාධ්‍ය ආයතනවලට සිදු වනු ඇත. එවිට ඡන්ද දායකයාට තම බුද්ධිමත් තීරණයක් ගැනීමට එය වේදිකාවක් වනු ඇති නිසා රටේ ඉදිරි නායකත්වය ද බුද්ධිමත් ජනතා තේරීමක් වනු ඇත.

මාලා මල්කාන්ති ජයරත්නගෙ

\- සංස්කාරක -

# රන්දොර උරුමය



**කාංචනා සිරිවර්ධන**

කොළඹ නගරයේ මහල් නිවාසවල ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් 50,000කට සින්නක්කර ඔප්පු ලබාදීමේ 'රන්දොර උරුමය' ජාතික වැඩසටහන ක්‍රියාවට නැංවුණේ ජනාධිපතිගේ ප්‍රධානත්වයෙන් 2024 ජුලි මස 17 දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී හිමිකම් ඔප්පු 1117ක් ප්‍රදානය කිරීමෙනි. ඒ, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති නිවාස 937ක් සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ඇති නිවාස 180ක් වශයෙනි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියට අයත් මිහිඳු සෙත්පුර, සිරිසර උයන, මෙට්‍රෝ නිවාස සංකීර්ණවල නිවැසියන්ට හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ඇති මහල් නිවාස 31ක නිවැසියන්ට 'රන්දොර උරුමය' හිමිකම් ඔප්පු ලැබිණි.

කොළඹ නගරය ඇතුළු ව දිවයිනේ අඩු ආදායම්ලාභී මහල් නිවාස හිමියන් වෙත ඔප්පු ප්‍රදානය කිරීමේ ජාතික වැඩසටහනේ ආරම්භය සිදු වී ඇත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කොළඹ මහල් නිවාසවල ජීවත් වන පුරවැසියන් 130 දෙනකු සඳහා 'රන්දොර උරුමය' නිවාස ඔප්පු ලබාදීමෙනි. ඉන් පසුව එහි ප්‍රධාන ජාතික වැඩසටහන මෙලෙස සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

මහල් නිවාසවල ජීවත් වන අඩු ආදායම්ලාභීන් වෙත නොමිලයේ සින්නක්කර ඔප්පු ලබාදීමේ වැඩසටහන යනු 2024 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් වූ එක් විශේෂ ව්‍යාපෘතියකි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යන ආයතන මේ සඳහා එක් ව සිටියි.

**මහල් නිවාසවල ජීවත් වන අඩු ආදායම්ලාභීන් වෙත නොමිලයේ සින්නක්කර ඔප්පු ලබාදීමේ වැඩසටහන යනු 2024 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් වූ එක් විශේෂ ව්‍යාපෘතියකි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යන ආයතන මේ සඳහා එක් ව සිටියි.**

අදහස් දක්වන  නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලිව්. එස්. සත්‍යානන්ද; "වසර ගණනාවක් තිස්සේ දිවයිනේ අඩු ආදායම්ලාභී නිවාස හිමියන් වෙත ඔවුන්ට හිමි සින්නක්කර ඔප්පුව ලබාගැනීමේ බාධාවක් තිබුණා. ඒ සඳහා බලපෑ විවිධ ප්‍රතිපත්තිමය කරුණු, නීතිමය කරුණු හේතුවෙන් එම ඔප්පු ලබාදීමේ වැඩසටහන ප්‍රමාද වී තිබුණා. අයවැය කතාවේදී මේ වැඩසටහන පිළිබඳ පළමු නිවේදනය නිකුත් කළ අවස්ථාවේ සිට නීතිපති දෙපාර්තමේන්තුව, අමාත්‍ය මණ්ඩලය, මුදල් අමාත්‍යාංශය ඇතුළු අදාළ ආයතන එක් ව ඒ සඳහා බලපාන නීතිමය තත්ත්වය ලිහිල් කරගැනීමට අවශ්‍ය පියවර ගත්තා. නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය තමන්ගේ අණපනත්වල ඒ සඳහා සුවිශේෂ වූ නීතිමය කරුණු සහ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය කරමින් මේ වැඩසටහනට අවශ්‍ය වන නීතිමය රාමුව සකස් කරගත්තේ ඒ අනුවයි."

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රජීව් සූරියආරච්චි පවසන්නේ මේ කර්තව්‍යයේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියට විශාල වගකීමක් පැවරී ඇති බව ය. අදහස් දක්වන සභාපතිවරයා; "'රන්දොර උරුමය' ඔප්පු ප්‍රදානය කිරීමේ වැඩසටහනේදී කොළඹින් පිටත ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ සිට ම ක්‍රියාත්මක වුණු ගම්උදාව වැඩසටහන්වල විවිධ කාලවකවානුවලදී ඉදිකරන ලද නිවාස සඳහා ඔප්පු 34000ක් පමණ 2025 වසර මැද වන විට ලබා දීමට අපට ඉලක්කයක් ලැබී තිබෙනවා. මේ නිවාසවල අවුරුදු 40ක් තිස්සේ පදිංචිවූවන් සිටිනවා තමන්ට කිසිම අයිතිවාසිකමක් නොමැති ව. ඔවුන්ට මේ වැඩපිළිවෙළ යටතේ ස්ථිර ව තමන්ට මෙන් ම තම දරුවන්ට දායාද

කළ හැකි පරිදි අයිතිය පැවරෙන ඔප්පුවක් අප නිකුත් කරනවා.”

ඔහු පවසන පරිදි එක් එක් අදියරවලදී ‘ගම්උදාව’ ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙන් ඉඩම් ලබා දී තිබුණත් ඒවා නිසි පරිදි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරී නොමැත. ප්‍රාදේශීය ලේකම්වරු සතු ව තිබෙන හෝ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය වැවිලි සංස්ථාව වැනි විවිධ ආයතනවලට අයිති ඉඩම්වල හෝ බොහෝ නිවාස ඉදි කර ඇති අතර ඒවා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරෙමින් තිබේ. විශේෂයෙන් ‘රන්දොර උරුමය’ ඔප්පු ප්‍රදානය කිරීමේ වැඩසටහන ඇරඹුණු පසු එම ආයතනවල ප්‍රධානීන් ඇතුළත් විශේෂ කමිටුවක් ජනාධිපතිගේ මූලිකත්වයෙන් පත් කර ඇත්තේ එම වැඩසටහන සහ අදාළ ඔප්පු නිකුත් කිරීම වේගවත් කිරීමට ය. ඒ අනුව හැකි ඉක්මනින් ඔප්පු ජනතාව අතට පත් කළ හැකි බව සභාපති රජීව් සූරියආරච්චි තහවුරු කරන කාරණයකි.

නාගරික සංවර්ධනය මෙන් ම නාගරික පුනර්ජීවනය රටක කිසි ලෙසකත් නොසලකා හැරිය නොහැකි කාරණා ය. නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ නාගරික සංවර්ධන අධිකාරිය 2011 වසරේදී සිදු කළ අධ්‍යයනයක් අනුව කියැවෙන්නේ රටේ අක්කර 900ක් ඇතුළත ජනාවාස 1499ක පවුල් 68,000ක් ජීවත් වන බව ය. නාගරික සංවර්ධන අධිකාරිය, මහ භාණ්ඩාගාරය සමග එක් වී නාගරික පුනර්ජීවන වැඩසටහන ආරම්භ කරන්නේ මේ සංඛ්‍යා දත්ත පදනම් කරගෙන ය. 2014 වසරේ සිට මේ දක්වා අඛණ්ඩ ව ක්‍රියාත්මක වන එම වැඩසටහනෙන් අද වනවිට මහල් නිවාස 22ක පවුල් ඒකක 13,600කට වඩා වැඩි සංඛ්‍යාවක් පදිංචි කර තිබේ. එම නිවැසියන් වෙත ද ‘රන්දොර උරුමය’ ඔප්පු ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ.

ඒ පිළිබඳ අදහස් දක්වන නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත්; “නාගරික ජනාවාස යනු රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචි ව සිටින මෙරට ජන කොටසක්. ඔවුන් නැවත පදිංචි කරන්නේ රුපියල් මිලියනයක් (ලක්ෂ 10ක්) අවුරුදු 30ක් ඇතුළත ගෙවීමේ ක්‍රමයක් අනුව. එනම් මසකට රුපියල් 3000කට වඩා අවම මුදලක් එක් නිවසකින් අය කර ගන්නවා. එම කොන්දේසිමය වටිනාකම ඔවුන් ගෙවා නොතිබුණහොත් ඔවුන්ට ඔප්පුවක් ලබාගැනීමේ හැකියාවක් නැහැ. නමුත් 2024 අයවැය යෝජනාවෙන් මිලියනයක මුදල ලක්ෂ 3 1/2ක් දක්වා අඩු කර තිබෙනවා.

**මහල් නිවාසවල පදිංචිකරුවන් එම මුදල් මාසික ව නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතුයි. 2023 දෙසැම්බර් 31 දින දක්වා හිඟයක් නොමැති ව මේ බිල් සෑම නිවෙස් හිමියකු ම අපට ගෙවා තිබිය යුතුයි ඔප්පු ලබාගැනීමට. මේ මහල් නිවාසවල අයිතිය ඒවායේ පදිංචිකරුවන්ට ම පවරා දුන් පසු නඩත්තුව පවත්වාගෙන යෑම සඳහා, සෑම නිවෙස් හිමියකුගෙන් ම රුපියල් 50,000ක් අය කරගෙන නිධන්ගත අරමුදලකට තැන්පත් කරනවා. එම අරමුදල අප සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ලබාදෙනවා මහල් නිවාස පවත්වාගෙන යෑම සඳහා.**

නිදසුනක් ලෙස ලක්ෂ 1 1/2ක් ගෙවා ඇති අයකු ඉතිරි ලක්ෂ දෙක ගෙවූ පසු ඔප්පු ලබාගැනීමට සුදුසුකම් ලබනවා. මේ මහල් නිවාසවලට ජල සහ විදුලිය බිල්පත් ගෙවා තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරිය. මහල් නිවාසවල පදිංචිකරුවන් එම මුදල් මාසික ව නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතුයි. 2023 දෙසැම්බර් 31 දින දක්වා හිඟයක් නොමැති ව මේ බිල් සෑම නිවෙස් හිමියකු ම අපට ගෙවා තිබිය යුතුයි ඔප්පු ලබාගැනීමට. මේ මහල් නිවාසවල අයිතිය ඒවායේ පදිංචිකරුවන්ට ම පවරා දුන් පසු නඩත්තුව පවත්වාගෙන යෑම සඳහා, සෑම නිවෙස් හිමියකුගෙන් ම රුපියල් 50,000ක් අය කරගෙන නිධන්ගත අරමුදලකට තැන්පත් කරනවා. එම අරමුදල අප සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ලබාදෙනවා මහල් නිවාස පවත්වාගෙන යෑම සඳහා.”

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නීතිමය තත්ත්වය අනුව යම් මහල් නිවාසයක පදිංචිකරුවන් විසින් තෝරාගනු ලබන කළමනාකරණ මණ්ඩලයකින් එම මහල් නිවාසයේ නඩත්තුව සිදු වේ. මහල් නිවාසවල මෙතෙක් කලක් එවැනි කළමනාකරණ මණ්ඩල පත් කරගැනීමට යම් බාධාවක් පැවැතිණි. එනම් සභාධිපත්‍ය කළමනාකරණ පනත අනුව කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය ලබාගැනීමට ඕනෑ ම මහල් නිවාසයක පදිංචි නිවැසියන්ගෙන් 50%කට සින්නක්කර ඔප්පු ලැබී තිබිය යුතුයි. ‘රන්දොර උරුමය’ ඔප්පු ප්‍රදානය කිරීමේ වැඩසටහන ඔස්සේ එම බාධාව ඉවත් වී කළමනාකරණ සංගම් පිහිටුවීමට ඉඩ ලැබී ඇත. මෙතෙක් කලක් නාගරික සංවර්ධන අධිකාරිය හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හෝ කළමනාකරණ සංගම් නොමැති ව අතුරු කළමනාකරණ සංගම් පිහිටුවා, එම අධිකාරීවල අරමුදල් යොදවමින් මේ මහල් නිවාසවල නඩත්තුව සිදු කර ඇත. මින් ඉදිරියට එම කාර්ය මහල් නිවාසවල පදිංචිකරුවන් අතට ම පත්වන්නේ අවශ්‍ය විට නාගරික සංවර්ධන අධිකාරියේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහයෝගය ද ලැබෙන පරිද්දෙනි.

# ශාක සුරක්ෂාව

රංගිකා අබේසේකර

අධ්‍යාපනික, පාරිසරික, ආර්ථික හා සාමාජීය වශයෙන් තිරසර ඉලක්ක කරා යන ගමනේදී ශ්‍රී ලංකාවට නව උද්භිද උද්‍යාන සංකල්පය තීරණාත්මක සාධකයකි. ජාතික මූලික අධ්‍යයන ආයතනයේ පර්යේෂණ මහාචාර්ය සිරිල් විජේසුන්දර සඳහන් කරන පරිදි උද්භිද උද්‍යානයක් යනු විද්‍යාත්මක පර්යේෂණ, සංරක්ෂණය, ප්‍රදර්ශනය හා අධ්‍යාපනය පිණිස උද්‍යාන විද්‍යාත්මක ව නම් කර ඇති ශාක එකතුවකි.

නොබෝදා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේ මෙරට උද්භිද උද්‍යාන 10ක් ගාල්ල අක්මීමන කඩොලාන උද්භිද උද්‍යානය හා වවුනියාව, අම්පාර, පොළොන්නරුව, දෙනියාය යන ප්‍රදේශ ආශ්‍රිත නව උද්භිද උද්‍යාන ආදී වශයෙන් ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබෙන බවයි. ඒ, වර්තමානය වන විට ඉදි කර ඇති උද්භිද උද්‍යාන 5ට අමතර ව දේශගුණික කලාප අනුව නව උද්භිද උද්‍යාන 5ක් ස්ථාපිත කිරීමෙනි. මෙරට දේශගුණික කලාප සංඛ්‍යාව 15කි.

විවිධ අවස්ථාවල යටත්විජිත සමයේ ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන ඉදිකර තිබේ. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඉදි කර ඇති උද්භිද උද්‍යාන ගණන 5කි. ඒ, පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හග්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1976), හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානය (2013), අවිස්සාවේල්ල ඉලුක්ඕවිට තෙත් කලාපීය උද්භිද උද්‍යානය (2015) ලෙස ය.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සංවර්ධන) එම්. එම්. ඩී. ජේ සේනාරත්න පවසන්නේ නව උද්භිද උද්‍යාන 05 සැකසීම විෂය හා ක්ෂේත්‍ර දැනුම සහිත විද්වතුන්ගෙන් උපදෙස් හා අදහස් ලබාගනිමින් සිදු කරන බව ය. ඒවා ස්ථාපිත වන්නේ වෙරළාරක්ෂිත ව ඇති කඩොලාන සහිත ප්‍රදේශයක, උතුරු හා නැගෙනහිර පළාතට අයත් ප්‍රදේශවල, අතරමැදි කලාපයට හා නකල්ස් ප්‍රදේශය ආශ්‍රිත ව ය. මේ වන විට අක්කර 50කින් යුතු ගාල්ල අක්මීමන කඩොලාන උද්භිද උද්‍යානයේ වැඩ ආරම්භ කර තිබේ.

උද්භිද උද්‍යාන පිහිටුවීමට පෙර ඒ සඳහා සුදුසු ඉඩම් සොයා ගැනීම කළ යුත්තකි. විශේෂයෙන් ඒ සඳහා පෞද්ගලික සහ රජයට අයත් ඉඩම් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම අවශ්‍ය වේ. මේ පිළිබඳ අදහස් දක්වන එම්. එම්. ඩී. ජේ සේනාරත්න; 'උද්භිද උද්‍යාන ස්ථාපිත කිරීමට සුදුසු  ඉඩම් පිළිබඳ විමසීම් කරන්නේ දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන්. විශේෂයෙන් එහිදී සලකා බලන්නේ ජලය ලබා ගැනීමේ පහසුව හා ප්‍රධාන මාර්ග ආසන්නයේ පිහිටීම වැනි කරුණු. දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ දැනුවත් කිරීම අනුව එවැනි හඳුනාගත් ස්ථාන 7-8ක් තිබුණත් ඇතැම් ඉඩම් උද්‍යාන ස්ථාපිත කිරීම වෙනුවෙන් නිදහස් කර ගැනීමට ගැටලු මතු ව තිබෙනවා. කිලිනොච්චිය ඉරණමඩු ප්‍රදේශයේ, වවුනියාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අක්කර 100ක ඉඩමක් සම්බන්ධ ව වාර්තා ලැබී තිබෙනවා. ඇතැම් දිත්‍රික්කවල ඉඩම් නිදහස් කර ගැනීම හා පැවරීම් කරමින් තිබෙනවා. පෞද්ගලික වතු සමාගම්වලට අයත් ඉඩම් ද ඒ අතරට අයත්."

බ්‍රිතාන්‍ය පාලකයන් ඔවුන්ගේ යටත්විජිතවල උද්භිද උද්‍යාන පිහිටු වූයේ ආර්ථික භෝග පිළිබඳ පර්යේෂණ පැවැත්වීමට ය. ඒ සඳහා රබර්, සිංකෝනා, කොකෝවා, විවිධ පලතුරු භෝග, දැව වර්ග උද්භිද උද්‍යාන මාර්ග යෙන් ලංකාවට ගෙන්වී ය. එම ශාක වගා කිරීමට ප්‍රථම සියලු පර්යේෂණ සිදු කළේ උද්භිද උද්‍යාන තුළදී ය. මේ වන විට විදේශවලින් මෙරටට ගෙනෙන ලද ශාක විශේෂ 4500ක් පමණ ඇති බව පර්යේෂණ මහාචාර්ය සිරිල් විජේසුන්දර ප්‍රකාශ කරයි.

1970 ගණන්වල සිට බටහිර ජර්මානු ආධාර හා තාක්ෂණ දැනුම ලබාගනිමින් උද්භිද උද්‍යාන මෙරට මල් වගා කර්මාන්තයට මූලික අඩිතාලම දැමී ය. ඒ සඳහා මෙරට ප්‍රථම පටක රෝපණ විද්‍යාගාරය පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පිහිටුවමින් නව ප්‍රභේද නිෂ්පාදනය, ශෂ්‍ය විද්‍යා,



ව්‍යාධි විද්‍යා හා පසුඅස්වනු ක්‍රම ආදිය ගැන පර්යේෂණ මෙන් ම තාක්ෂණ දැනුම ලබාදීම ද උද්භිද උද්‍යානවල සිදු කරයි.

මෙරට සියලු ම ශාක නාමකරණය කර ග්‍රන්ථාරූඪ කිරීම ද උද්භිද උද්‍යානවල සුවිශේෂ කාර්යයකි. ඒ යටතේ ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වී ඇති විවෘත බීජ, ආවෘත බීජ, මීවන හා පර්ණාංග ශාක සියල්ල ම වෙළුම් 16කින් සමන්විත ශාක සංග්‍රහයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. එමගින් ශාකය පිළිබඳ නිවැරදි තොරතුරු ලබාගත හැකි ය. වර්තමානය වන විට එවැනි ශාක නිදර්ශක 168,000කට අධික සංඛ්‍යාවක් ජාතික ශාබාගාරයේ තැන්පත් කර තිබේ. මේ ශාක ගවේෂණයට අමතර ව ශ්‍රී ලංකාවේ දේශීය ශාක පිළිබඳ රතු දත්ත පොත සැකසීම ද සිදුවන්නේ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ජාතික ශාබාගාරය කේන්ද්‍ර කරගෙන ය. එයට අනුව ශ්‍රී ලංකාවේ දේශීය සපුෂ්ප ශාක විශේෂ 3,154කි. මේවා ආරක්ෂා කිරීමට ඇති සුදුසුම ක්‍රමය ඒවා දක්නට ලැබෙන ස්වාභාවික පරිසර පද්ධති ආරක්ෂා කර ගැනීම හා විතැන් සංරක්ෂණයයි. විතැන් සංරක්ෂණය උද්භිද උද්‍යානවල ප්‍රධාන කාර්යභාරයකි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය සිරිල් විජේසුන්දර; 'ස්වාභාවික පරිසර පද්ධතියෙන් ශාක පිටතට ගෙනැවිත් උද්භිද උද්‍යාන වැනි සුදුසු පරිසරයක ස්ථාපිත කර සංරක්ෂණය කිරීම විතැන් සංරක්ෂණයයි. එය කාලීන අවශ්‍යතාවක්. ඒ ක්‍රියාවලිය නිසා මෙරටට ආවේණික ශාක වර්ග කිහිපයක් අද වන විට මිහිපිට දකින්නට ලැබෙන්නේ පේරාදෙණියේ උද්භිද උද්‍යානයේ පමණයි. විතැන් සංරක්ෂණයෙන් මෙරට ශාක සංරක්ෂණය කිරීමට උද්භිද උද්‍යාන පිහිටුවීම අවශ්‍ය වුවක්. මෙරට විවිධාකාර දේශගුණ කලාපවල විවිධ ශාක වර්ග දක්නට ලැබීමයි ඊට හේතුව. ඉන් අදහස් කරන්නේ නැහැ හම්බන්තොට, අනුරාධපුර ප්‍රදේශවල ඇති ශාක හග්ගල උද්‍යානයේ වැවීමටත් මස්කෙළිය ප්‍රදේශයේ ඇති ශාක ගම්පහ උද්‍යානයේ වැවීමටත් සුදුසු බව. නිදහසින් පසු ආරම්භ කරන ලද ප්‍රථම උද්භිද උද්‍යානය අක්කර 300ක භූමියක් සහිත හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානයයි. වියළි කලාපයක කුමන ශාක වවන්නේදැයි යන මතය දරනවාට වඩා මෙරට වියළි කලාපයට හා අර්ධ ශුෂ්ක වියළි කලාපයට ආවේණික ශාක රැක ගැනීම අරමුණු කර ගනිමින් එය ස්ථාපිත කිරීම රටකට විශාල වටිනාකමක් එක් කරනවා."

දෛනික ව උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් ගණන මිලියන 2කට ආසන්න ය. එයින් පෙනී යන්නේ උද්භිද උද්‍යාන ආර්ථිකයට සෘජු ව ම දායක වන බව ය. උද්භිද උද්‍යාන සමග ම සාකච්ඡාවට යොමු වන කරුණක් වන්නේ රටේ ආර්ථිකය, සංචාරක ආකර්ෂණය හා එයින් උපයාගත හැකි මුදල් ප්‍රමාණ පිළිබඳ ව ය. එහෙත් මහාචාර්ය සිරිල් විජේසුන්දර සඳහන් කරන්නේ ආදායමෙන් පමණක් උද්භිද උද්‍යානයක වැදගත්කම මැනිය නොහැකි බවයි. උද්‍යාන, විද්‍යාත්මක මූලධර්ම අනුව නොයෙකුත් විචිත්‍ර ශාක අලංකාර ව සකසා ඇති නිසාත් ඒවා ස්ථාපිත කර ඇති පරිසරය මනාව නඩත්තු කර ඇති නිසාත් උද්භිද උද්‍යාන අනිවාර්යයෙන් ම සුන්දර ස්ථාන බවට පත් වේ. කනගාටුවට කරුණ වන්නේ මෙරට බොහෝ දෙනා මතුපිට සුන්දරත්වය මිස ඒ පිළිබද අවබෝධයක් නොමැති ව ක්‍රියා කිරීම බව මහාචාර්යවරයා අවධාරණය කරන කරුණකි.

නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා වැයවන මුදල සම්බන්ධයෙන් විවිධ මතිමතාන්තර පැවතියත් මේවායෙහි ඇති විද්‍යාත්මක වටිනාකම්වලට ඒවා යටත් වන නිසා මහාචාර්ය බුද්ධි මාරඹේ පවසන්නේ බොහෝ රටවල් උද්භිද උද්‍යානවල වටිනාකම් හඳුනාගනිමින් තිබෙන පසුබිමක අප ද ඒ සඳහා වැඩි අවධානයක් යොමු කරමින් සහ නිශ්චිත ඉලක්ක හඳුනා ගනිමින් ඒ සඳහා මූලිකත්වය ලබා දිය යුතු බව ය.

# රන්මසු ගෙනෙන ඉස්සන්

බිනූ දිලාරා ගමගේ

ඉස්සන් වගාව යනු වෙරළබඩ ප්‍රදේශවල ස්වාභාවික පරිසරයෙන් බොහෝදුරට වියුක්ත ව එම ප්‍රදේශවල ජෛව පද්ධතියට බලපෑමක් ඇති නොවන පරිදි සිදු කරගෙන යන වගා ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව සඳහා යෝග්‍ය වන ප්‍රදේශ උපරිම භූමි පරිභෝජනයෙන් යුතු ව වගා කෙරෙන පසුබිමක උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල නව ඉස්සන් වගා ව්‍යාපෘති කෙරෙහි ද රජයේ අවධානය යොමු ව තිබීම ඉතා වැදගත් ය. උතුරු ප්‍රදේශයේ පවතින සුවිශේෂ භූ විෂමතා සමග ඉස්සන් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩි හැකියාවක් පවතින බව ධීවර අමාත්‍යාංශය අවධාරණය කරන්නේ වඩාත් විධිමත් ඉස්සන් වගා බිමක් නිර්මාණය කිරීමට ඇති ඉහළ හැකියාව ද පෙන්වා දෙමිනි.

2018 වසරේ උතුරු පළාතේ මන්නාරම දිස්ත්‍රික්කයේ අක්කර 54ක පමණ පෞද්ගලික ඉඩමකින් පළමු ඉස්සන් වගාව ආරම්භ වීම සිදුවන අතර 2024 ජූලි මස 14 දින කිලිනොච්චි දිස්ත්‍රික්කය පළමු මහා පරිමාණ ඉස්සන් වගා ව්‍යාපෘතිය ඇරඹුවේ ය. ඒ, කවුදානමුනෙයි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මිනාරිඔඩෙයි ගම්මානය කේන්ද්‍ර කරගනිමින් රජයේ මගපෙන්වීම ඇති ව පෞද්ගලික ව්‍යවසායකත්වයක් යටතේ ය.

අක්කර 10ක ප්‍රදේශයක ව්‍යාප්ත ව පවතින මේ ඉස්සන් ගොවිපොළ සඳහා ආයෝජනය රුපියල් කෝටි 07ක් පමණ වේ. එහි අරමුණ වසරකට මෙට්‍රික් ටොන් 100ක පමණ නිෂ්පාදනයක් ලබා ගැනීමයි. නවීන තාක්ෂණික ක්‍රම භාවිත කරමින් වගා සිදුවන මේ ඉස්සන් ගොවිපොළේ පළමු අස්වැන්න වශයෙන් මෙට්‍රික් ටොන් 50ක ප්‍රමාණයක වගාවක් අපේක්ෂා කළ හැකි බව උතුරු පළාත් වෙරළබඩ ජලජීවී වගා අධීක්ෂණ සහකාර අධ්‍යක්ෂ බාලචන්ද්‍රන් නිරුපරාජ් ප්‍රකාශ කරයි.

ශ්‍රී ලංකාවේ ස්වාභාවික ඉස්සන් ගහනයට අමතර ව ඉස්සන් නිෂ්පාදනය වගා ක්‍රමයක් වශයෙන් ආරම්භ වන්නේ පුත්තලම් දිස්ත්‍රික්කය මුල් කරගෙන ය. එය මුල්කාලීන ව අවිධිමත් ඉස්සන් වගා භූමියක් වශයෙන් දැක ගන්නට ලැබී ඇත. 1998 වසරෙන් පසුව ඉස්සන් වගාව සඳහා ක්‍රමයෙන් රාජ්‍ය මැදිහත් වීම සිදු වේ. වර්තමානයේ මෙරට ඉස්සන් නිෂ්පාදනය ගොවිපොළ 755ක සිදු වන බව වෙරළබඩ ජලජීවී වගා සංවර්ධන සහකාර අධ්‍යක්ෂ ආර්.එම්.එන්.ටී.කේ. රණතුංග පවසයි. ඒ, පුත්තලම් දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 1904.09ක ඉස්සන් ගොවිපොළ 669ක්, මඩකලපු දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 165.8 ප්‍රදේශයක් ආවරණය කරමින් ඉස්සන් ගොවිපොළ 49ක්, මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉස්සන් ගොවිපොළ 6ක් හෙක්ටයාර 47ක සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 17.25ක එක් ඉස්සන් ගොවිපොළක් වශයෙනි.

දේශීය ඉස්සන් වගාවෙන් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ඉස්සන් පරිභෝජනයට මෙට්‍රික් ටොන් 10ක සැපයුමක් සහ මෙට්‍රික් ටොන් තුනක ප්‍රමාණයක් හෝටල් පරිභෝජනය සඳහා දෛනික ව වෙන් කරන බව ප්‍රකාශ කරන සහකාර අධ්‍යක්ෂ ආර්.එම්.එන්.ටී.කේ. රණතුංග; "මෙරට දේශීය වෙළෙඳපොළේ ඉස්සන් සඳහා පවතින්නේ මත්ස්‍යය වෙළෙඳපොළ මත රඳා පවතින වක්‍ර ඉල්ලුමක්. එම නිසා මත්ස්‍යය මිල ගණන් අඩුවන කාලවලදී මත්ස්‍යයන් මිල දී ගැනීමට පැමිණෙන පාරිභෝගිකයා ඉස්සන් සඳහා දේශීය වෙළෙඳපොළේ වැඩි ඉල්ලුම නිර්මාණය කරනවා"

ලොව ඉස්සන් විශේෂ 1200ක් පමණ හඳුනාගෙන ඇතත් ඉන් වගා කර්මාන්තය සඳහා වර්ග 20කටත් අඩු









සංඛ්‍යාවක් පමණක් යොදා ගනියි. ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව සඳහා මූලික ව යොදා ගැනෙන්නේ *litopenaeus vannamei* යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන 'වැනමි' හෙවත් 'පැසිෆික් කිරි ඉස්සා' (White shrimp) සහ *penaeus monodon* විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන 'කරාඩු ඉස්සා' (Tiger Shrimp) ය. ඉස්සන් වගාව සඳහා අවශ්‍ය පරිසරයේ අන්තර්ගත විය යුතු සුවිශේෂ සාධක කිහිපයක් නිසා ලෝකයේ ඉතා සීමිත රටවල් කිහිපයක පමණක් මේ ඉස්සන් වගාව සිදුවෙයි. එහිදී ජලයේ pH අගය 8-8.5 අතර දෛනික වෙනස් වීම 0.5ට අඩු අගයක පැවතිය යුතු අතර දිනකට 5 pptකට වඩා අඩුවෙන් වෙනස් වන 15-25 ppt ක ලවණතාවක් සහ 4 ppmට වඩා අඩු නොවිය යුතු ද්‍රාවීය ඔක්සිජන් ප්‍රමාණයක් සහිත කිවුල් ජලයක් පැවතිය යුතු වෙයි. වැලි සහ මැටි මිශ්‍ර ලෝම පසක් සහිත තැනිතලා භූමියක් සහ උෂ්ණත්වය 28-30C° අතර අගයක පැවතීමත් එයට වැදගත් ය.

ශ්‍රී ලංකාවේ ඉස්සන් අභිජනනය කිරීමට රජයේ ලියාපදිංචි මධ්‍යස්ථාන 56ක SPF (Specific Pathogen Free) ක්‍රමවේදය හෙවත් ආනයනය කරන ලද මව් සතුන්ගේ බිත්තරවලින් ලබා ගන්නා කීටයන් (nauplius) ගොවිපොළට බෙදා හැරීමෙන් සිදු වෙයි. ඒ අතර ඉස්සන් අභිජනනයේ මූලික කීට අවස්ථාව (nauplius) තෙක් රැකබලා ගන්නා එක් අභිජනන මධ්‍යස්ථානයක් (Nauplius Center) සහ පසු කීට අවස්ථාව (nauplius V) තෙක් රැකබලා ගන්නා අභිජනන මධ්‍යස්ථාන 06ක් (වැනමි ඉස්සන් සඳහා මධ්‍යස්ථාන 05ක් සහ කරාඩු ඉස්සන් සඳහා මධ්‍යස්ථාන 02ක් වශයෙන්) ඉරණවිල-අඹකඳවිල, මීගමුව සහ මඩකලපුව ප්‍රදේශවල ඇත. සෙසු අභිජනන මධ්‍යස්ථාන කීට අවස්ථාවේ සිට වැඩුණු ඉස්සන් (post-larval stage) දක්වා රැකබලා ගනියි. ඉස්සන් වගාවේදී යොදා ගන්නා ගෘහාශ්‍රිත තාක්ෂණික ක්‍රමවේදය (Intensive Farming System) පරිසරයට අවම හානියක් වන ආකාරයෙන් සිදු කිරීමත් වගාවෙන් ඉවත් කරන අපද්‍රව්‍ය නැවතත් පොල් වගාව සහ අනෙකුත් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා භාවිත කිරීමත් මෙහිදී සිදු වෙයි.

මෙරට ඉස්සන්ට පමණක් ආවේණික වූ රසය නිසා ශක්තිමත් කරගත හැකි පුළුල් අපනයන වෙළෙඳපොළක් ද ශ්‍රී ලංකාව සතු වෙයි. විශේෂයෙන් මෙරට ඉස්සන් සඳහා යුරෝපානු කලාපයේ සහ ජපානය, චීනය වැනි රටවල පවතින වෙළෙඳපොළ ඉල්ලුම පිළිබඳ ව සලකා බලමින් සහකාර අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කරන්නේ මෙරට ඉස්සන් තරගකාරී ජාත්‍යන්තර වෙළෙඳපොළ කරා ගෙනයාමට පවතින ප්‍රධාන අභියෝගය නම් ඉස්සන් වගාව සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී දරන්නට සිදුවන අධික නිෂ්පාදන පිරිවැය බවයි. අදහස් දක්වන ඔහු; "දේශගුණික වෙනස්වීම් නිසා දැඩි බලපෑමකට ලක් ව තිබෙන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව දැඩි තර්ජනයකට මුහුණදෙමින් තිබෙනවා. ඇතැම් කාලවලදී පුත්තලම වැනි ප්‍රදේශවලට ඇතිවන ගංවතුර තත්ත්ව නිසා ඉස්සන් ගොවිපොළ විනාශ වීමත් ගොවිපොළවල ඉස්සන්ට වැළඳෙන විවිධ වසංගත රෝග තත්ත්ව නිසාත් නිෂ්පාදනයේ අඩු වීමක් දක්නට ලැබෙනවා. මෙයට විසඳුමක් ලෙස තෝරාගත් ඉස්සන් වගා පොකුණුවල ගහන ඝනත්වය අඩු කර කෙටිකාලීන ව වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වන 'Stocking Density of Shrimp Farming' වැනි ක්‍රමවේද අනුගමනය කරන්නට පෞද්ගලික ව්‍යවසායකයන් යොමු කර තිබෙනවා"

ඉස්සන් වගාව මෙරටට විදේශ විනිමය රැගෙන ඒමට, විදේශ ආයෝජකයන් ගෙන්වා ගැනීමට සහ දේශීය වශයෙන් ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමටත් (Food Safety) හැකි ප්‍රධාන මාර්ගයකි. ඉස්සන් වගාවේ නියුක්ත ප්‍රදේශවල ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීමටත් ලාංකේය සන්නාමය සහිත ව මෙරට ඉස්සන් නිෂ්පාදන ජාත්‍යන්තර වෙළෙඳපොළ කරා ගෙනයමින් ප්‍රවර්ධනය කිරීමටත් විවිධාංගීකරණයක් සහිත ව ජාත්‍යන්තර වෙළෙඳපොළ සමග තරග කළ හැකි Sri Lankan Jumbo Shrimp වැනි වෙළෙඳ වටිනාකමින් ඉහළ ලොකු ඉස්සන් (bigger sized) නිෂ්පාදන සිදු කිරීමටත් සැලසුම් කරන බව සහකාර අධ්‍යක්ෂ ආර්.එම්.එන්.ටී.කේ. රණතුංග ප්‍රකාශ කරයි. FAO (Food and Agriculture Organization) වැනි ජාත්‍යන්තර සංවිධාන හා ඉස්සන් වගාව පිළිබඳ තාක්ෂණික දැනුම ලබා ගත හැකි තායිලන්තය, කොරියාව, වියට්නාමය, ඉන්දියාව වැනි රටවල් සමග යහපත් සබඳතා පවත්වාගෙන යමින් ඉස්සන් වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් දැනුම හුවමාරු කර ගැනීමටත් නව ගෝලීය ප්‍රවණතා සහ ප්‍රමිතිවලට අනුගත ව දේශීය ඉස්සන් වගාව ගුණාත්මක කිරීමටත් සහ ඒ ඔස්සේ දේශීය ගොවියා සවිබල ගන්වමින් අවශ්‍ය නියාමනය ක්‍රියාත්මක කිරීමත් සිදු වෙයි.

# කෘත්‍රිම බුද්ධිය සොයා

# කොරියානු දේශයට




ජනමාධ්‍යකරණය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය පිළිබඳ සහයෝගිතා වැඩසටහනට සහභාගි වූ තෙවැනි කණ්ඩායම

**සංදීප පෙරේරා**


පරිගණකයත් ගෝලීයකරණයත් සමග නවීන ලෝකය නොසිතූවිරූ මාන වෙත පිය නගමින් සිටියි. මිනිසා විසින් ම දියුණු කරනු ලැබූ තාක්ෂණය වර්තමානයේ මිනිසාට ම අභියෝගයක් ව ඇත්තේ මානව වංශකතාවේ නව ඉසව් අප සොයා යා යුතු බව පසක් කරමිනි. මීට දශක කිහිපයකට පෙර යන්ත්‍රසූත්‍රවල සිදු වූ අධිතාක්ෂණික වර්ධනයත් සමග මිනිසුන් කිහිපදෙනකුගේ ශ්‍රමය එක් යන්ත්‍රයකට ආදේශ විය. එහෙත් මිනිසා මෙන් ම සිතමින්, මිනිසා සතු මිනිසාට ම ආවේණික නිර්මාණශීලීත්වය ද සොරා ගනිමින් මිනිස් මොළයෙන් සිදු කළ දෑ, කෘත්‍රිම බුද්ධියෙන් සිදු කරනන්ට තරම් අද ලෝකය ඉදිරියට ගොස් ඇත. මිනිසා අවශ්‍ය වන්නේ සිදු කළ යුත්තේ කුමක්ද යන විධානය දීමට පමණි. මෙහි යහපත, අයහපත කුමක් වුවත් මේ තාක්ෂණික විප්ලවයෙන් දුරස් ව දූපතක තනි වන්නට අපට නොහැකි ය. අප ද ලෝකය සමග ඉදිරියට යා යුතු ව ඇත.

මෙවැනි පසුබිමක ජාත්‍යන්තර සහයෝගිතාව සඳහා වූ කොරියානු නියෝජිතායතනය (Korea International Cooparation Agency - KOICA) සමග ශ්‍රී ලංකා රජයේ ප්‍රධානතම තොරතුරු හස්තය වන රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යකරණය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය පිළිබඳ සහයෝගිතා වැඩසටහන (Fellowship Program in Artificial Intelligence Journalism) ආරම්භ කරනු ලැබුවේ 2022 වර්ෂයේදී ය. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් එම වැඩසටහන 2022 වසරේ ජනමාධ්‍යවේදීන් 40 දෙනකු සඳහා මාර්ගගත ක්‍රමයට (Online) පැවැත්වුණු අතර 2023 වසරේ 15 දෙනකුගෙන් යුතු නිලධාරීන් කණ්ඩායමක් කොරියාවේ KOICA ICC වෙත ගොස් එම වැඩසටහනට සහභාගි විය. එහි අවසන් අදියර සඳහා එක් වූ ජනමාධ්‍ය අමාත්‍යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය හා ලේක්හවුස් ආයතනය නියෝජනය කරමින් නිලධාරීහු සහ ජනමාධ්‍යවේදීහු 14ක් ජූලි 14 සිට ජූලි 27 දක්වා කොරියාවේ KOICA ICCහිදී ජනමාධ්‍යකරණය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය පිළිබඳ සහයෝගිතා වැඩසටහනට සහභාගි වූහ.

සංවර්ධනය වෙමින් පවතින රටවල කොරියානු ආධාරවලින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන්වල ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබාදෙමින් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණෙන් 1991 වර්ෂයේදී කොරියානු විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ KOICA ස්ථාපිත කර ඇත. අද වන විට ශ්‍රී ලංකාව ද ඇතුළු රටවල් 48ක එහි උප කාර්යාල ක්‍රියාත්මකයි.

ජනමාධ්‍යකරණය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය පිළිබඳ සහයෝගිතා වැඩසටහන දේශන, ක්‍රියාකාරී වැඩමුළු, අධ්‍යයන චාරිකා, ස්වයං අධ්‍යයන හා කණ්ඩායම් අධ්‍යයනවලින් සමන්විත විය. විෂය දැනුමෙන් පරිබාහිර ව කොරියානු දේශයේ සිරි නැරඹීමටත් කොරියානු සංස්කෘතිය උකහා ගැනීමටත් කොරියානුවන්ගේ ජන ජීවිතය අවබෝධ කර ගැනීමටත් එහිදී අපට මහඟු අවස්ථාවක් ලැබිණි. වැඩිහිටි අධ්‍යාපනයේ පවතින මනෝ විද්‍යාත්මක ප්‍රවේශ මැනවින් අවබෝධ කරගෙන තිබූ KOICA මෙරට වැඩිහිටි අධ්‍යාපනය සඳහා ක්‍රියාත්මක වන ආයතනවලට බොහෝ දෑ උගන්වයි.

මෙම වැඩසටහන යටතේ කොරියාවේ ප්‍රමුඛ පෙළේ මාධ්‍ය ආයතන දෙකක අධ්‍යයන චාරිකා සඳහා ද අවස්ථාව සලසා දී තිබිණි. ඉන් පළමු වැන්න



ග්‍යොංබොක්ගුං (Gyeongbokgung) මාලිගය




කොරියානු දරුවන් අතර ඉතා ජනප්‍රිය පෙංසෝ (Pengsoo)



EBS ආයතන පරිශ්‍රය තුළ

Arirang මාධ්‍ය ජාලයයි. කොරියානු ජාත්‍යන්තර විකාශන පදනම මෙහෙයවන Arirang TV ආයතනය කොරියාවේ ක්‍රියාත්මක ප්‍රධානතම විශේෂ විකාශන මධ්‍යස්ථානයයි. සෝල් අගනුවර පිහිටා ඇති මෙය කොරියානු සංස්කෘතිය, එහි නවාංග, ඉතිහාසය ආදී තොරතුරු ඉංග්‍රීසි බසින් ලොව ග්‍රාහකයන් වෙත බෙදා හරියි. එම නාලිකාව 1997 වසරේදී කොරියාවේ සිය විකාශනය ආරම්භ කළ අතර 1999 වසරේ සිට සිය විකාශනය ලොව සිසාරා අරඹා තිබේ. 2023 වසරේ සිට "ලොව සමග අනුනාද වෙමු" යන තේමාවෙන් සිය විකාශන මෙහෙයවමින් සිටින මේ මාධ්‍ය ජාලය කොරියානු දේශයට ආභරණයකි. රටවල් 107ක නිවාස ඒකක මිලියන 146කට Arirang TV අද සමීප ව ඇත. කොරියානු සංස්කෘතික වටිනාකම් මෙන්ම K-POP සංගීතයේ රස ලොවට සමීප කරන ශ්‍රී ලංකාවේ යොවුන් පරපුර අතර ද ජනප්‍රිය Arirang TV, රූපවාහිනී නාලිකාවලට අමතර ව ගුවන්විදුලි හා යූටියුබ් විකාශන ද සිදු කරයි.

කොරියාවේ තවත් සුවිශේෂ මාධ්‍ය ජාලයක් වන EBS (Education Broadcasting System) නාලිකාව අපගේ දෙවැනි අධ්‍යයන චාරිකාවයි. එහිදී උණුසුම් පිළිගැනීමක් ලද අප එහි පැමිණි බව එම ගුවන්විදුලි නාලිකාව කොරියානු දේශයට ම සජීවී ව කියා සිටියේ අප සැමට නිරායාස ආඩම්බරකාරී හැඟීමක් ඇති කරවමිනි.

EBS යනු දකුණු කොරියාවේ ප්‍රමුඛ පෙළේ අධ්‍යාපන විකාශන සේවාවයි. 1990 දශකයේ මෙම සේවාව ආරම්භ කර තිබෙන්නේ දරුවන් සහ වැඩිහිටියන් සඳහා ගුණාත්මක අධ්‍යාපනික වැඩසටහන් විකාශනය කිරීමේ අරමුණිනි. EBS මාධ්‍ය ජාලය අන්තර්ජාලය, රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා ඔස්සේ රටේ අධ්‍යාපනික පද්ධතියට අයත් විෂය, භාෂා ඉගෙනුම් හා විනෝදාස්වාදය සහිත අධ්‍යාපනික වැඩසටහන් විකාශනය කරයි. එහිදී විශේෂයෙන් දරුවන්ගේ මූලික අධ්‍යාපන අවශ්‍යතා සහ පුහුණුවට විශාල ප්‍රමුඛත්වයක් ලබා දෙයි. EBSහි විවිධ විෂය සම්බන්ධ උසස් තත්ත්වයේ නිර්මාණාත්මක වැඩසටහන් දකුණු කොරියාවේ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමටත් වැඩිදියුණු කිරීමටත් විශාල ලෙස දායක වේ.

මෙරට ක්‍රියාත්මක අධ්‍යාපනික සේවා නාලිකාවලට වඩා මෙය හාත්පසින් ම වෙනස් ය. එය ජාතික වශයෙන් වන අධ්‍යාපන ප්‍රතිපත්තිවලට සමගාමී ව, නව පරපුරේ ප්‍රවණතා පිළිබඳ මහත් අවබෝධයෙන් ක්‍රියා කරයි. විවිධ වයස් පරාසවල සිටින දරුවන්ගේ මානසික තත්ත්වය මැනවින් හඳුනාගෙන ඇති ඔවුන් අනාගත ලෝකයට ඔබින සමාජශීලී හා දැනුමෙන් සන්නද්ධ යහආකල්ප හා කුසලතා සපිරි අනාගත පරපුරක් බිහි කිරීමේ කොරියානු ජාතික සත්කාරයේ පුරෝගාමියකු ලෙස ක්‍රියා කරයි.

පෙංසෝ (Pengsoo) යනු EBS මාධ්‍ය ජාලය හඳුන්වා දුන් කොරියානු දරුවන් අතර ඉතා ජනප්‍රිය චරිතයකි. දරුවන්ට විනෝදාස්වාදය සැපයීමට මෙන් ම පරමාදර්ශයක් ලෙසටත් ඔවුන් එය භාවිත කරයි. කොරියානු දරුවන්ට පෙංසෝ වැනි පර්මාදර්ශී චරිතයක් සිටියත් ශ්‍රී ලංකාවේ දරුවන්ට එවැනි චරිතයක් නැත. එකල සිටි 'සුදු පූංචා' වැනි චරිත නැවතත් දරුවන් අතරට හඳුන්වාදීමේ වගකීම එයින් අපේ රූපවාහිනී නාලිකාවලට මනා ව සිහිපත් කරවයි.

මෙම අධ්‍යයන චාරිකාවලට අමතර ව කොරියානු දේශයේ සංස්කෘතික හා ඓතිහාසික වැදගත්කමක් සහිත ස්ථාන නැරඹීමට ද අපහට අවස්ථාව ලැබිණි. කොරියානු රාජාවලියේ අවසන් රාජවංශය වන ජෝසොන් රාජවංශයේ ප්‍රධාන රාජකීය මාලිගාව වන්නේ 'ආශීර්වාද දර්ශන මාලිගය' (Blessing Scenery Palace) ලෙස ජනප්‍රිය ග්යොංබොක්ගුං (Gyeongbokgung) මාලිගයයි. ක්‍රිස්තු වර්ෂ 1395දී ඉදිකරන ලද එය සෝල් අගනගරයේ උතුරට වන්නට පිහිටා තිබේ. ජෝසොන් රාජවංශය ඉදි කළ ප්‍රධානතම මාලිගා පහෙන් විශාලතම මාලිගය වන්නේ ද රාජකීය පවුලේ නිවහන හා රාජ්‍ය පාලනය ද සිදු වූ කාමර 7,700කින් සමන්විත මෙම මාලිගයයි. ඉම්ජින් යුද්ධයේදී (1592-1598) ගිනිබත් කොට විනාශ කර තිබූ මෙය සියවස් දෙකක් අතහැර දමා තිබුණත් 19 වැනි සියවසේ ගෝජොං රජ දවස හියුංසොන් කුමරුගේ නායකත්වය යටතේ හෙක්ටයාර 40කට වැඩි භූමියක මේ මාලිගයේ ගොඩනැගිලි 500ක් පමණ ප්‍රතිසංස්කරණය කර තිබේ. එකල තිබුණු රාජකීය ඇඳුම් ආයිත්තම්වලින් සැරසී බොහෝ උජාරුවෙන් රාජකීය කුමර කුමරියන් මෙන් මාලිගා පරිශ්‍රයේ සැරිසන්නට අවශ්‍ය පහසුකම් මෙහි අවටින් සපයා තිබෙන නිසා ග්යොංබොක්ගුං මාලිගයට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට මාලිගා පරිශ්‍රයේ රජ වන්නට ද හැකි ය.

කොරියානු අධ්‍යයන චාරිකාව ආරම්භයේ සිට අවසානය දක්වා ම අප දුටුවේ ඔවුන්ගේ සරලකම, අරපිරිමැස්ම, කාල කළමනාකරණය, විනයගරුකබව හා කාර්යක්ෂමතාවයි. ප්‍රභූ පිරිස් රැස් වූ, අනවශ්‍ය දේශන පිරුණු සමාරම්භක හා සමාප්ති උත්සව වෙනුවට ඉතා කෙටි කාලයකදී අත්‍යාවශ්‍ය අංග හා දේශන පමණක් ඇතුළත් සරල උත්සව ඔවුන් සංවිධානය කර තිබුණි.

අදටත් ශ්‍රී ලංකාවේ ඇතැම් නාගරික හා ජනාකීර්ණ ස්ථාන කොරියාව වැනි යැයි පැවසුවත් දැන් එය කිසිසේත් ම වලංගු නැත. කොරියාව අප පසු කර ගව් ගණනාවකින් බොහෝ දුර ගොස් ය. එබැවින් ජාතියක් ලෙස නැගී සිටීමේදී ශ්‍රී ලාංකිකයන් ලෙස අපට කොරියාවෙන් උගත් හැකි පාඩම් බොහෝ ය.

(කොරියානු සංචාරයෙන් පසු)


# Rising from the Ashes: Sri Lanka's Story



Professor
**Priyanga Dunusinghe**
Department of Economics
University of Colombo

Sri Lanka's economic crisis, which peaked in 2022, was marked by severe shortages of essentials, rampant inflation, and significant political instability. The country's recovery has been challenging, involving complex reforms and international support. The crisis was triggered by a confluence of factors, including heavy reliance on imports, high levels of debt, and a lack of foreign currency reserves. Mismanagement of economic policies, exacerbated by the COVID-19 pandemic and the collapse of the tourism sector, compounded these issues. The situation was further strained by political turmoil and public dissatisfaction with the government's handling of the economy. The immediate response involved a series of measures to stabilize the economy. In early 2022, Sri Lanka defaulted on its debt, a significant step given its international obligations. The government sought assistance from the International Monetary Fund (IMF) and other global financial institutions. Negotiations with the IMF led to an agreement on a bailout package that included fiscal consolidation measures and structural reforms. The government also introduced a series of short-term measures to manage the crisis, including rationing of essential goods, fuel subsidies, and the imposition of taxes. The IMF-supported program required Sri Lanka to implement several key reforms. These include; **Fiscal Consolidation -**reducing the budget deficit through increased revenue generation and reduced government spending. This includes tax reforms and improving tax collection efficiency; **Debt Restructuring** - negotiating with creditors to restructure external debt, aiming to make it sustainable in the long term. This involves seeking debt relief and extending payment terms; **Monetary Policy Adjustments -** tightening monetary policy to control inflation and stabilize the currency. The Central Bank of Sri Lanka raised interest rates to combat inflation and support the rupee; **Public Sector Reforms -** streamlining the public sector and reducing state-owned enterprises' financial burden. This includes privatization of non-essential services and improving efficiency in public institutions; and **Anti-Corruption Measures -**strengthening governance and transparency to build public trust

**Figure 1: Quarterly Real GDP Growth: 2020-Q2 – 2024-Q1**




Source: Central Bank of Sri Lanka

and attract foreign investment. This involves implementing strict anti-corruption laws and improving regulatory frameworks.

It is interesting to note that the recovery efforts have begun to show some positive outcomes. Inflation, which reached 70 per cent (Y-o-Y) during the crisis, has gradually been declined to 2 per cent by July 2024. Similarly, Sri Lankan rupee that shot up to Rs. 370 per US$ gradually stabilized around Rs. 300. The country that had almost no foreign reserves at its disposal by end of 2022, was able to build up foreign exchange reserves amounting to US$ 5 billion by the end of June 2024. During the crisis period, market lending interest rates almost reached 30 per cent per annum due to tight monetary policy regime. However, the Central Bank of Sri Lanka brought down the rates in response to improved stability in the economy. Real GDP growth in 2023-Q3 turned positive after a spell of consecutive contractions for six quarters. Real GDP growth recorded 4.5 and 5.3 per cent in 2023-Q4 and 2024-Q1 respectively (see Figure 1). Near term growth outlook remains robust due to prudent policy measures and improved investor confidence despite volatile global economic outlook.The leading economic indicators, such as purchasing managers' indices for manufacturing and services sectors, show steady signs of expansion of economic activity. Tourism, a crucial sector for Sri Lanka, has been rebounding as situation in Sri Lanka improved and global travel restrictions eased. More importantly, international support continues to play a critical role and Sri Lanka was able to garner international support for the recovery process successfully. Countries and financial institutions have provided humanitarian aid, loans, and technical assistance. 2023-Q4 is also expected to record a positive GDP growth. More importantly, 2023 recorded a 'twin surpluses' for the first time on record, i.e., a surplus in the primary balance of fiscal accounts and external current account. Debt restructuring process has reached almost an end; agreeing with both Official and private creditors. Policy credibility and predictability have improved with the support of effective and transparent dissemination of information on the conduct of public policies, mainly monetary and fiscal policies.

Accordingly to many sources, Sri Lanka's economic turnaround is commendable since most debt-crisis hit countries failed to reverse the economic contraction within a short time. Those countries abandoned policy reforms due to public agitation and/or change of governments resulting perpetuation and/or witnessing further economic contraction in subsequent years. Greece is one of such countries that failed to recover even after a decade. Greecereceived three major bailout packages (2010, 2012, and 2015) from the EU and IMF, which required strict austerity measures and structural reforms. In 2012, Greece implemented a major debt restructuring, including a significant write-off of private-sector debt, to manage the debt burden. Political parties which came into power in Greece re-negotiated with IMF and introduced various changes into the agreement to address socio-political concerns. Even after all these supports, Greece GDP is still well below the pre-crisis period (see Figure 2). Current prediction indicatesGDP reaching its pre-crisis level by 2031.

Figure 2: **Time Taken for Reaching Pre-Crisis Output**




Sources: European Commission; Eurostat; Haver Analytics; and IMF staff projections.
1/ Pre-crisis peaks are: 1929 for Great Depression; 1997 for Asian crisis; 2007 for Greece, Ireland, and Spain; 2008 for Cyprus and Portugal.
2/ Indonesia, Republic of Korea, and Thailand.
3/ Cyprus, Ireland, Portugal, and Spain.

**Source:** https://www.imf.org/en/News/Articles/2019/10/01/sp093019-The-IMF-and-the-Greek-Crisis-Myths-and-Realities

Despite progress, Sri Lanka faces several ongoing challenges. The need for continued fiscal discipline and debt management remains critical. Political stability and public confidence in the government are also crucial for sustaining recovery efforts. The combination of immediate stabilization measures, structural reforms, and international support forms the foundation for the country's recovery. While challenges remain, the steps taken thus far offer a pathway towards economic stability and growth.



ශ්‍රීමත් කෙයර් ස්ටාමර් සිය බිරිඳ සමග

# හදිසි මැතිවරණ දේශපාලන සූදුවක් ද?



රිෂි සුනක් ධුරයෙන් සමු ගනිමින්

නිහාල් පීරිස්

ලෝක දේශපාලන ක්ෂේත්‍රයේ දැඩි අවධානයක් දිනා ගත් මැතිවරණ දෙකක් නොබෝද යුරෝපා රටවල් දෙකක පැවැත්විණි. ඒ, එක්සත් රාජධානියේ මැතිවරණය සහ ප්‍රංශයේ මැතිවරණයයි. ජූලි 4 දින එක්සත් රාජධානියේ මැතිවරණය පැවැති අතර ප්‍රංශ මැතිවරණය පැවැත්වුණේ ජූනි 30 සහ ජූලි 7 යන දිනවල ය. ප්‍රංශ මැතිවරණය වට දෙකකින් සමන්විත වූවකි.

මේ මැතිවරණ ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රයේ එවැනි අවධානයක් යොමු වන්නට එක් හේතුවක් වූයේ බොහෝ දෙනා විමතියට පත් කරමින් හදිසියේ කැඳවන ලද මැතිවරණ දෙකක් වීමයි. ඒවා මැතිවරණ පැවැත්වීමට නියමිත ව තිබූ කාලයට කලින් කැඳවන ලද මැතිවරණ විය. එක්සත් රාජධානියේ මැතිවරණය පැවැත්වීමට නියමිත ව තිබුණේ 2024 වසර අවසන් භාගයේයි. ප්‍රංශයේ මැතිවරණය පැවැත්වීමට 2027 වසර දක්වා කාලය තිබිණි. එහෙත් එක්සත් රාජධානියේ හිටපු අගමැති රිෂි සුනක් ද ප්‍රංශයේ ජනාධිපති එමානුවෙල් මැක්රොන් ද එම රටවල මැතිවරණ කලින් පැවැත්වීමට තීරණය කළහ. ඔවුන් මෙවැනි තීරණ ගත්තේ ඒ වනවිට බලයේ සිටි ඔවුන්ගේ පක්ෂවලට විරුද්ධ පක්ෂවලින් දැඩි අභියෝග එල්ල වෙමින් තිබූ පසුබිමක ය. මැතිවරණ පැවැත්වීමට ප්‍රමාද වුවහොත් දැඩි පරාජයකට මුහුණදෙන්නට සිදුවනු ඇතැයි මේ දෙදෙනා ම කල්පනා කළ බවක් පෙනිණි. ඒ නිසා ඔවුන් යම් දේශපාලන සූදුවක නිරත වූවා යැයි ද පැවසිය හැකි ය. මේ මැතිවරණවලදී එම රටවල විශාල බල පෙරළියක් සිදුවිය හැකි ය යන විශ්වාසයක් බොහෝදෙනාට තිබිණි. මැතිවරණ ගැන දැඩි අවධානයක් යොමු වීමට එය ද හේතුවක් විය.

එක්සත් රාජධානියේ 2010 වසරේ සිට වසර 14ක කාලයක් බලය හෙබවූයේ කන්සර්වේටිව් පක්ෂයයි. එම පක්ෂය සැලකෙන්නේ මධ්‍ය-දක්ෂිණාංශික පක්ෂයක් හැටියට ය. එහෙත් පසුගිය කාලයේ එම පක්ෂය ජනතාව අතර ජනප්‍රියත්වයෙන් පිරිහෙන්නට පටන්ගෙන තිබිණි. එයට ප්‍රධාන වශයෙන් ම බලපා තිබුණේ ආර්ථික වශයෙන් ජනතාව විඳිමින් සිටි පීඩනයයි. ජීවන වියදම ඉහළ යමින් තිබීම ජනතාවගේ එදිනෙදා ජීවිතයට විශාල බලපෑමක් එල්ල කර තිබිණි.

රජයේ සේවාවන් බිඳ වැටීම ද එරට වැසියන්ට මහත් අපහසුතා ඇති කර තිබූ බව සඳහන් විය. සෞඛ්‍ය සේවය වැනි ක්ෂේත්‍රවල මේ තත්ත්වය වඩාත් දරුණු ලෙස දැකගන්නට ලැබිණි. මේ අතර කන්සර්වේටිව් පක්ෂයේ ඇති ව තිබූ පිල් බෙදීම් ද එහි ඇතමුන්ට එරෙහි ව එල්ල වූ විවිධ චෝදනා ද එම පක්ෂයේ ජනප්‍රියත්වය බිඳ දමන්නට බල පෑ හේතු අතර විය. මේ චෝදනා අතර ලිංගික චෝදනා ද තිබිණි.

මෙවැනි තත්ත්වයක ඒ වනවිට එරට ප්‍රධාන විරුද්ධ පක්ෂය වූ කම්කරු පක්ෂය ජනතාවගේ ආකර්ෂණය දිනා ගනිමින් සිටියේ ය. වාමාංශික නැඹුරුවක් සහිත කම්කරු පක්ෂයේ නායකත්වය දැරුවේ ශ්‍රීමත් කෙයර් ස්ටාමර් ය. ඔහු නයිට් නාමයකින් ද පිදුම් ලබා සිටි කෙනෙකි. ස්ටාමර්ට නයිට් නාමයක් ලැබී තිබුණේ නීති ක්ෂේත්‍රයේ ඔහු ඉටු කළ සේවය වෙනුවෙනි.

කව්රුත් අපේක්ෂා කළ ලෙස ම කම්කරු පක්ෂය මැතිවරණයෙන් විශිෂ්ට ජයක් හිමි කර ගත්තේ ය. එරට

> මැතිවරණයේ ප්‍රතිඵල අනුව කම්කරු පක්ෂය පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ බහුතර ආසන ගණනක් දිනා සිටි නිසා ඔවුන්ට පහසුවෙන් ම ආණ්ඩුවක් පිහිටුවීමට හැකි වූ අතර 62 හැවිරිදි කෙයර් ස්ටාමර් නව අගමැතිවරයා ලෙස පත් විය.

පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩල දෙකකි. ඒ සාමි මන්ත්‍රී මණ්ඩලය (House of Lords) සහ මහජන මන්ත්‍රී මණ්ඩලය (House of Commons) යනුවෙනි. මහා මැතිවරණ පැවැත්වෙන්නේ මහජන මන්ත්‍රී මණ්ඩලය සඳහා නියෝජිතයන් පත් කර ගැනීමටයි. එහි ආසන 650න් ආසන 411ක් ම දිනා ගන්නට කම්කරු පක්ෂයට හැකි විය. කන්සර්වේටිව්

පක්ෂය දිනාගත්තේ ආසන 121ක් පමණි. 2019 වසරේ පැවැති මැතිවරණයේදී කන්සර්වේටිව් පක්ෂය ආසන 365ක් දිනාගෙන සිටියේ ය. කම්කරු පක්ෂයට එවර හිමි ව තිබූ ආසන ගණන 202කි.

මැතිවරණයේ ප්‍රතිඵල අනුව කම්කරු පක්ෂය පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ බහුතර ආසන ගණනක් දිනා සිටි නිසා ඔවුන්ට පහසුවෙන් ම ආණ්ඩුවක් පිහිටුවීමට හැකි වූ අතර 62 හැවිරිදි කෙයර් ස්ටාමර් නව අගමැතිවරයා ලෙස පත් විය.


එමානුවෙල් මැක්රෝන්

ජනාධිපති එමානුවෙල් මැක්රෝන් හදිසියේ මැතිවරණයක් කැඳවූයේ එරට අන්ත දක්ෂිණාංශික පක්ෂයක් ලෙස සැලකුණු National Rally නැමැති පක්ෂයේ ජනප්‍රියත්වය ඉහළ යමින් ඇති බවක් පෙනෙන්නට වූ බැවිනි. එම පක්ෂය බොහෝදෙනා සැලකුවේ ජාතිවාදී පක්ෂයක් ලෙසිනි. සංක්‍රමණිකයන්ට විරුද්ධ, මුස්ලිම් විරෝධී පක්ෂයක් ලෙස එය ප්‍රසිද්ධියක් දිනා සිටියේ ය. ප්‍රංශය යනු ඉතා ලිබරල් සංස්කෘතියක් තිබූ රටක් බව රහසක් නොවේ. ඒ වනවිට ආණ්ඩු බලය දරූ මැක්රෝන්ගේ Renaissance පක්ෂය ද එවැනි ප්‍රතිපත්ති මත පිහිටා ක්‍රියා කළ පක්ෂයක් විය. National Rally පක්ෂයේ ජනප්‍රියත්වය ඉහළ යමින් පැවැති තත්ත්වයක හදිසි මැතිවරණයක් පැවැත්වීමට මැක්රොන් තීරණය කළේ තවත් බලා සිටියහොත් එම පක්ෂයෙන් එල්ල වන තර්ජනය වඩාත් දැඩි විය හැකි යයි කල්පනා කළ නිසා බව පෙනිණි.

මැතිවරණයේ පළමු වටය ජූනි 30 දින ද දෙවැනි වටය ජූලි 07 දින ද පවත්වනු ලැබිණි. අපේක්ෂා කළ ලෙස ම පළමු වටයෙන් ජය ගත්තේ National Rally පක්ෂයයි. එම පක්ෂය ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 33.2ක ප්‍රතිශතයක් දිනා ගත්තේ ය. ජනාධිපති මැක්රෝන්ගේ පක්ෂය අයත් වූ Ensemble නැමැති සන්ධානයට දෙවැනි ස්ථානයටවත් පැමිණෙන්නට නොහැකි විය. සියයට 21.28ක ඡන්ද ප්‍රතිශතයක් හිමි කරගත් එම සන්ධානයට අත්වූයේ තුන්වැනි ස්ථානයයි. දෙවැනි තැනට පත් වූයේ වාමාංශික නැඹුරුවක් ගත් New Popular Front නැමැති සන්ධානයයි. එයට සියයට 28.14ක ඡන්ද ප්‍රතිශතයක් හිමි විය.

ජූලි 7 දින පැවැති දෙවැනි වටයෙන් ජය ගන්නට National Rally පක්ෂයට හැකි වූයේ නැත. දෙවැනි වටයේ ඡන්ද විමසීම් පැවැත්වෙන්නේ පළමු වටයේදී කිසිදු අපේක්ෂකයකුට සියයට 50කට වඩා ඡන්ද ලබා ගැනීමට නොහැකි වූ ආසනවල ය. එම ආසනවල වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයන් දෙදෙනා සහ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 12.5කට වඩා ලබාගෙන ඇති අපේක්ෂකයන් පමණක් දෙවැනි වටයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි. මෙහිදී National Rally පක්ෂය බලයට ඒම වැළැක්වීම සඳහා සෙසු පක්ෂ විවිධ උපාය අනුගමනය කළේ ය. එම පක්ෂ අතර ඡන්ද බෙදී යාම වළැක්වීම සඳහා අනුගමනය කළ උපාය ඊට නිදසුනකි. මෙවැනි තත්ත්වයක National Rally පක්ෂයට දෙවැනි වටයේදී හිමි වූයේ තුන්වැනි ස්ථානයයි. පළමු තැනට පැමිණියේ New Popular Front සන්ධානයයි. මැක්රෝන්ගේ පක්ෂය අයත් Ensemble සන්ධානය දෙවැනි තැනට පත් විය.

> කිසිදු පාර්ශ්වයකට තනි ව ම ආණ්ඩුවක් පිහිටුවීමට හැකියාවක් ලැබී නැත. තනි ව ආණ්ඩුවක් පිහිටුවීමට නම් පක්ෂයක් හෝ සන්ධානයක් හෝ පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලය වන ජාතික සභාවේ ආසන 577න් 289කට වඩා දිනාගත යුතු ය. එහෙත් වැඩි ම ආසන ගණනක් දිනාගත් New Popular Front සන්ධානයට පවා හිමි ව ඇත්තේ ආසන 180ක් පමණි.

මේ කිසිදු පාර්ශ්වයකට තනි ව ම ආණ්ඩුවක් පිහිටුවීමට හැකියාවක් ලැබී නැත. තනි ව ආණ්ඩුවක් පිහිටුවීමට නම් පක්ෂයක් හෝ සන්ධානයක් හෝ පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලය වන ජාතික සභාවේ ආසන 577න් 289කට වඩා දිනාගත යුතු ය. එහෙත් වැඩි ම ආසන ගණනක් දිනාගත් New Popular Front සන්ධානයට පවා හිමි ව ඇත්තේ ආසන 180ක් පමණි. මෙවැනි පසුබිමක කවුරුන් ආණ්ඩුවක් පිහිටුවනු ඇත් ද යන්න පිළිබඳ ලිපිය ලියන අවස්ථාව වනවිටත් පැවතියේ අවිනිශ්චිත බවකි.




# අභ්‍යවකාශ ජනාවාසකරණයේ ලකුණු

## සඳ මත පළමු ගුහාව සොයා ගැනේ

**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**

වසර දස දහස් ගණනක් මහපොළොවට ම කොටු වී සිටි මිනිසා මුල්වරට ඉන් පිටස්තර ආගන්තුක භූමියක පය තැබුවේ මෙයට වසර 55කට පමණ පෙර ය. ඒ, නිල් ආම්ස්ට්‍රෝං ඇතුළු පිරිස සඳ මත පා තැබීමත් සමගිනි. මේ සමග මිනිසා සිහින දුටුවේ අභ්‍යවකාශයේ සැරිසරමින් පිටස්තර ග්‍රහලෝක මත ජනාවාස තැනීමට ය. මිනිසාගේ අනෙක් අපේක්ෂාව වූයේ "ඈත එපිට ලෝකයකදී අප මේ විශ්වයේ තනි වී නැත" කියා සනාථ කෙරෙන මහපොළොවෙන් පිටත පවතින ජීවය පිළිබඳ සාක්ෂියක් සොයා ගැනීම ය. සඳ මත පා තබා වසර 55ක් ගතවෙද්දී ම මිනිසාගේ මේ ඉපැරණි සිහින සැබෑ වන ලකුණු ද පහළ වී තිබේ. ඒ සමග අප පිවිස ඇත්තේ අභ්‍යවකාශයේ තැනෙන මුල් ම මිනිස් ජනාවාස සඳහා මුල් පියවර තැබෙන සුබ මොහොතට ය.

පළමු රොකට්ටුව යැවූ දා සිට ම අනෙකුත් ග්‍රහලෝක මත සිය නිවාස ඉදිකර ගැනීම මිනිසාගේ සිහිනයක් විය. ලබා ඇති දියුණුව සහ වේගවත් අභ්‍යවකාශ ගමන් හැකියාව නිසා ඒ සිහින සැබෑවක් කර ගත හැකි බව සනාථ වී හමාර ය.



අභ්‍යවකාශයේ වෙනත් ග්‍රහ තල මත නිවාස තනන්නට පෙර ළඟ ම අභ්‍යවකාශ සගයා වන සඳ මත ජනාවාස සහ වෙනත් ලෝක වෙත යානා පිටත් කර හරින අභ්‍යවකාශ තොටුපොළක් සෑදීම නාසා ආයතනය ප්‍රමුඛ පර්යේෂණායතනවල මෑතකාලීන වෑයම ය. මේ සඳහා විවිධ සැලසුම් ඉදිරිපත් ව තිබේ. මෙහිදී මුහුණදුන් ප්‍රධාන ගැටලුව වූයේ ඈත අභ්‍යවකාශයේ සිට එන රුදුරු උල්කා, ග්‍රහක සහ විකිරණ ප්‍රහාරවලට නිරාවරණය වූ තුනී වායුගෝලයක් සහිත සඳ තලය මතදී ඒවාට මුහුණදෙමින් කල් පැවැතිය හැකි නැවතුම්පොළක් ගොඩ නඟන්නේ කෙසේද? යන්න පිළිබඳ ව ය. ඒ සඳහා යෝජනා වූ හොඳම විකල්පය වූයේ සඳ මත නොව සඳ ගැබ තුළ ගුහා තනා ඒ තුළ මේ ජනාවාස තැනීම ය. එහෙත් මිනිසාට තවදුරටත් මේ ජනාවාස උදෙසා සඳ බිම් තලය කණිමින් වෙහෙස වීමට අවශ්‍ය වන්නේ නැත. ඒ, සඳෙහි ම අනාදිමත් කාලයක් සැඟවී පැවැති ස්වාභාවික ලෙන් ගුහා පද්ධතියක් අපූර්ව ලෙස අනාවරණය වීමත් සමග ය.

අඩි 200ක් ගැඹුරු සඳ ආවාටයක හෙවත් වළක පතුලේ සඳ මතදී සොයාගත් පළමු ගුහාව ලෙස පෙනෙන ලෙනක් කරා විහිද ගිය විවරයක් සොයා ගැනීමට නාසා විද්වතුන්ට හැකි වීම ලෝක විද්‍යා ප්‍රජාව උද්දාමයෙන් කම්පනයට පත්වන්නක් විය. මේ සඳ ආවාටය Mare Tranquillitatis Pit ලෙස හඳුන්වන අතර මේ වළ 1969 ජූලි 20 දින මිනිසුන් ප්‍රථම වරට සඳ මතට ගොඩ බැස්ස ඇපලෝ 11 ගොඩබෑමේ ස්ථානයේ සිට සැතපුම් 230ක් පමණ ඊසාන දෙසින් පිහිටි සන්සුන් මුහුදේ හෙවත් Mare Tranquillitatisහි පිහිටා තිබීම දෛවෝපගත සිද්ධියකි. එය පෘථිවියේ සිට පියවි ඇසට පවා පෙනෙයි.

2009 වසරේදී සඳ වටා Lunar Reconnaissance Orbiter චන්ද්‍රිකාව කක්ෂගත කිරීමෙන් පසු එය Mare ද ඇතුළු ව මෙබඳු වළවල් රැසක් සොයා ගන්නා ලද බැවින් Mare Tranquillitatis Pit නොහොත් MTP ගැන කලින් දැන සිටි බව සැබෑ ය. 2010 වසරේදී පමණ NASA සඳ වටා යැවූ චන්ද්‍රිකාව විසින් ගන්නා ලද පින්තූර විශ්ලේෂණය කරන පර්යේෂකයන් MTPහි ලෙන් දොරටු බඳු සෙවන සහිත ස්ථාන ඇති බව වටහා ගත්තත් ඒ දොරටු භූගත ගුහා දක්වා විහිද යා හැකි බව මෑතක් වන තුරු සනාථ වී නොතිබිණි. දැන් එබඳු ගුහාවකට ඉතිහාසයේ මුල්වරට දොර විවර වී හමාර ය.

විද්‍යාඥයන් පවසන ආකාරයට චන්ද්‍රගාමීන්ට සඳෙහි රුදුරු පරිසර

තත්ත්වයෙන් ආරක්ෂා වීමට මෙබඳු භූගත චන්ද්‍ර ගුහාවකට ස්ථිර පදනමක් සැපයිය හැකි ය. 2022 ජූලි මාසයේ ඇමරිකානු භූ භෞතික සංගමයේ වාර්තාවකට අනුව චන්ද්‍ර ගුහා තුළ උෂ්ණත්වය අංශක 63ක පමණ සාපේක්ෂ ව ස්ථායී බව විශ්වාස කෙරේ.

පෘථිවිය මෙන් නොව සඳට ආරක්ෂිත වායුගෝලයක් හෝ චුම්භක ගෝලයක් නොමැති අතර එය සූර්ය හෝ අභ්‍යවකාශයේ කොස්මික් අංශු විකිරණවලින් හෝ ග්‍රහලෝකය ආරක්ෂා නොකරයි. එමගින් සඳ මතුපිට මිනිසුන්ට කුරිරු වූ පරිසරයක් ඇති කරයි.

නාසා ආයතනය පවසන පරිදි සඳ මත දිවා කාලයේදී ෆැරන්හයිට් අංශක 260ක් සහ රාත්‍රියෙන් පසු අංශක -280ක් දක්වා පරාසයක උෂ්ණත්වය අධික වේ. ගැඹුරු ආවාටවල ස්ථිර සෙවණැලිවල උෂ්ණත්වය ඊටත් වඩා සිසිල් වන අතර සමහර ඒවා අංශක -410 තරම් අඩු ය. විකිරණ ද තර්ජනයකි. ඈත මන්දාකිණි වෙතින් එන කොස්මික් කිරණ යනු සෞඛ්‍ය අවදානම් වැඩි කරන ශක්ති අංශු තරංග වේ. මේ නිසා නව ලෙන් දොර ඇරුණු ගුහාව අයත් MTP විවරය විශ්ලේෂණයෙන් සඳ මත මිනිසාට යහපත් ව දිවි ගෙවිය හැකි ගුහා පවතින බවට විද්‍යාඥයන්ගේ දිගුකාලීන විශ්වාසය සනාථ වී තිබේ.

නාසා ආයතනයට අනුව අලුත තහවුරු කරගත් මේ ගුහාව වසර මිලියන ගණනකට හෝ බිලියන ගණනකට හෝ පෙර සඳ මත ලාවා ගලා යාමෙන් පර්වතය හරහා නිර්මාණය වූ උමගකි. මේ ලෙනෙහි සඳ මතුපිට සිට පතිත අහස් ආලෝකය පැතිර ඇත. එය සිරස් ව සහ උඩින් බිත්ති දක්වා පහළට ගමන් කරයි, තවදුරටත් භූගත ව පැතිර යා හැකි බෑවුම් තට්ටුවක් ද මෙහි ඇත. මේ ලෙන් ගුහාව සඳහා පෘථිවියේ ඇති ආසන්නතම ආදර්ශය වන්නේ ස්පාඤ්ඤයේ ලැන්සාරෝට්හි ගිනිකඳු ගුහා ය.


විද්‍යාඥයන්ට අනුව නව ගුහා පද්ධතිය චන්ද්‍ර ජනාවාසයක් සඳහා හොඳ ම ස්ථානයකි. පෘථිවියේ ජීවය ආරම්භ වූයේ මෙබඳු ගුහා තුළ ය. එබැවින් මිනිසුන්ට සඳ මත මේ ගුහා තුළ ජීවත් විය හැකි බව ඔවුහු පෙන්වා දෙති. ඒ අනුව සඳ මත වාසයට සුදුසු තැනක් ලැබී හමාර ය. මේ ලෙන් ගුහා පිළිබඳ සඳ තලය විනිවිද දකින ලේසර් මගින් සහ රෝබෝ යාත්‍රා මෙහෙයුම් මගින් තවදුරටත් සොයා බැලීම දැන් අවශ්‍ය ව තිබේ. ඉන්පසු සඳ මත ජනාවාස ඇරැඹීමට හැකියාව උදාවනු නියත ය. අනාගතයේදී අඟහරු ග්‍රහයා මත ජනාවාසකරණය උදෙසා ගුහා ගවේෂණය කිරීමට ද මේ පර්යේෂණ අත්දැකීම් මහගු ලෙස උපකාරී වනු ඇත. එයට අඟහරු ග්‍රහයා මත ජීවය පිළිබඳ සාක්ෂි සෙවීමට ද දොර විවර කළ හැකි ය, මන්ද එය මත ජීවය පැවතුණේනම්, එය නිසැක ව ම ග්‍රහලෝකයේ මතුපිට ඇති උපද්‍රවවලින් ආරක්ෂා වූ ගුහා තුළට යාමට ඉඩ තිබෙන නිසා ය.


මේ සමග නව අභ්‍යවකාශ ජනාවාසකරණ යුගයේ ප්‍රධාන ගැටලුවකට පිළියම් ලැබී හමාර ය. මිනිසා නිතර නඟන ප්‍රශ්නය වන 'අප මේ විශ්වයේ තනි වී සිටියි ද?" යන ප්‍රශ්නයට ද මේ සොයා ගැනීමට සමගාමී ව පිළිතුරු සහ සාක්ෂි ලැබී තිබේ.

මුලින් ම අඟහරු මත වෙසෙන Perseverance රෝවරය අඟහරු මත ජීවය පැවැති බවට ප්‍රබල සාක්ෂි ගණනාවක් ම ලබා දී තිබුණි. මේ රෝවරය ඉතා මෑතකදී ඊතල ශීර්ෂයක හැඩැති පාෂාණයක සාම්පලයක් ලබා ගත් අතර එහි පැරණි අඟහරු මත විසූ අන්වීක්ෂීය ජීවය පවතින බවට ප්‍රබෝධමත් ඉඟි අඩංගු විය. අඟහරු ග්‍රහයාගේ මතුපිට පරිසරයේ ද්‍රව ජලය තිබූ බව පෙන්නුම් කළ එහි ජීවයේ තැනුම් ඒකක ලෙස සැලකෙන කාබනික සංයෝග ද අඩංගු බව වාර්තා වී තිබේ.

මේ සමග ම තවත් විද්‍යාත්මක වාර්තාවක් පැවසුවේ සිකුරු මත ජීවය පවතින බවට කළින් ලැබුණු හෝඩුවාව දැන් ඇත්තක් ය යන්න සනාථ වී ඇති බව ය. මීට පෙර සිකුරු මත සනැති වායුගොලයේ ජීවය පිළිබඳ ප්‍රබල සාක්ෂියක් වන පොස්පින් පැවැති බවට හෝඩුවාවක් ලැබී තිබුණි. දැන් එම හෝඩුවාව සනාථ කරන දත්ත 140 ගුණයකටත් වඩා ලැබී ඇති අතර තවත් ජෛව-ජනිත වායුවක් වන ඇමෝනියා පිළිබඳ සාක්ෂි ද ඉදිරිපත් ව තිබේ.

මේ වනවිට අනෙකුත් විද්‍යා අංශ සමග තාරකා සහ අභ්‍යවකාශ විද්‍යා අංශය ද දිගු පිම් පනිමින් නව සොයා ගැනීම්වලින් ඉදිරියට යයි. ඒ, අනාගත විශ්ව ගම්මානය තැනීමට මුල්ගල් තබමිනි. ඉතා නුදුරේදී ම අභ්‍යවකාශයේ නිදැල්ලේ සැරිසැරීමට සමත් වන මිනිසා විශ්වයේ පැතිර ඇති විශ්මිත ජීවීන් සමග ගනුදෙනු අරඹනු නිසැක ය.







# ඉඩමට සින්නක්කර අයිතිය



**චන්දන මාරසිංහ**

ඉඩම් යනු රටක ස්ථාවර වත්කමකි. එහි වටිනාකම දිනෙන් දින ඉහළ යන නිසා ඕනෑ ම පුද්ගලයකු නිරවුල් ඉඩමක අයිතිකරුවකු වීමට සිහින දකියි. එහෙත් අතීතයේ සිට පාරම්පරික ව මෙන් ම වෙනත් ක්‍රමවේද ඔස්සේ පැවතෙමින් එන මේ ඉඩම් අයිතිය නිරවුල් නොවීමෙන්, එනම් සින්නක්කර ඉඩම් අයිතිය නොමැති වීමෙන් විවිධ ගැටලුවලට මුහුණදීමට පුරවැසියන්ට සිදු වේ. ඒ සඳහා විසඳුම් සෙවීමට පත් වූ විවිධ ආණ්ඩු පියවර ගෙන ඇති අතර වත්මන් ආණ්ඩුව ඊට යෝජනා කර ඇත්තේ 'උරුමය' වැඩසටහනයි. මෙවර දෙසතිය කවරයේ කතාවෙන් කතාබහ කරන්නේ නිරවුල් ඉඩම් අයිතිය පුද්ගලයකුට කෙතරම්දුරට වැදගත් ද යන්නයි.

රටක පුරවැසියන් මෙන් ම පුරවැසි නොවන පිරිස් ඉඩම් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ විවිධ අරමුණු පෙරදැරි ව ය. නිවසක් ඉදිකිරීම, ව්‍යාපාර පවත්වාගෙන යාම, කෘෂිකර්මය සම්බන්ධ ක්‍රියාකාරකම් එහිදී ප්‍රමුඛ වේ. ඒ සඳහා ඉඩමක අයිතිය ඉතා වැදගත් වේ. පුද්ගලයකු ඉඩම් ආකාර කිහිපයකට අත්පත් කර ගනී. ඉඩමක් මිල දී ගැනීම, ත්‍යාගයක් ලෙස ලැබීම, බාධාවකින් තොර ව දීර්ඝ කාලයක් පරිහරණය කිරීම සහ රජයේ දීමනාවක් ලෙස ලැබීම ඒ අතර වේ.

ඔප්පුවක් යනු ඉඩම්වලට අදාළ ව සිදුවන ගනුදෙනු සම්බන්ධයෙන් පාර්ශ්ව විසින් සාක්ෂිකරුවන් දෙදෙනකු හා බලයලත් නොතාරිස්වරයකු ඉදිරියේ ලියා අත්සන් කරනු ලබන ලියවිල්ලකි. ඉඩමක අයිතිය නිත්‍යානුකූල කිරීමට දැනට භාවිත වන ක්‍රමය වන්නේ නොතාරිස්වරයකු වෙත ගොස් ඔප්පුවක් ලියා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීම ය. ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ මෙය සිදු කෙරේ. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව දක්වන ආකාරයට මේ ක්‍රමය භාවිත කළ ද ඔප්පුවකින් සහතික වන්නේ ඉඩමට අදාළ ගනුදෙනුව මත හිමිකම් සහතිකයක් නොවේ. මේ නිසා ඉඩමේ අයිතිය නිරවුල්කර නොතාරිස්වරයකුගෙන් හිමිකම් සහතිකයක් ගත යුතු වේ. ඉඩම් ලියාපදිංචි කිරීමේ ප්‍රධාන ක්‍රම දෙක වන්නේ ඔප්පු සහ හිමිකම් ලියාපදිංචි කිරීම ය. හිමිකම් ලියාපදිංචි කිරීම සඳහා පවතින වැඩසටහන බිම් සවිය හෝ ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන ලෙස හඳුන්වයි.

## ඉඩම් නිරවුල් කිරීම

ඉඩම් නිරවුල් කිරීම ලෙස හැඳින්වෙන්නේ මෙරට භූමිය සතු සියලු ඉඩම්වලින් රජයේ ඉඩම් හා පෞද්ගලික මොනවාද යන්න තීරණය කර ඒවායේ අයිතිය තහවුරු කිරීම ය. ඒ ඔස්සේ උරුමකරුවන්ට ඒවා පැවරීමේ හැකියාව පවතී.

ඓතිහාසික පසුබිමක් මත මෙසේ ඉඩම් නිරවුල් කිරීමට සිදු ව තිබේ. යුරෝපා ජාතිකයන් ශ්‍රී ලංකාවේ පාලන බලය අත්පත් කර ගැනීමට පෙර මෙරට පැවතුණේ රජු ප්‍රමුඛ කරගත් දේශීය පාලන ක්‍රමයකි. රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය නිකුත් කළ ජර්නලයකට අනුව රටේ ඉඩම් සම්බන්ධයෙන් රාජ්‍ය පාලකයා සතු ව විශේෂ බලයක් පැවතිණ. රටේ සියලු ඉඩම්වල ස්වාමියා වූයේ ද රජු ය. ඔහු එම ඉඩම් ගොවිතැන් සඳහා ජනතාවට බෙදා දී තිබේ. රජු 'භූපති' ලෙස හඳුන්වා ඇත්තේ ද රජුට ඇති මේ ඉඩම් අයිතිය හේතුවෙනි. එහෙත් ඉඩම් සියල්ල රජු සතු ව පැවති බවට සඳහනක් නොමැත. පිරිස ලබාගත හැකි කවරකුට වුව ද වැව්




පැරණි කෘෂිකාර්මික ජීවිතය

තැනීම් ආදිය සඳහා ඉඩම් ලබා ගැනීමට හැකි විය. පෞද්ගලික ඉඩම් අයිතිය තිබූ පිරිසක් ද අතීත සමයේ සිටි බවට අනාවරණය වේ. සෙල්ලිපි හා වංශ කතා ඒ පිළිබඳ තොරතුරු තහවුරු කරයි. ඇතැම් රජවරු වැව් සහ ඉඩම් මිලදී ගත් බවට සාධක ඇත. රසවාහිනියේ සඳහන් කර ඇති ආකාරයට මහවැලි උතුරු ප්‍රදේශයේ කෙළෙඹි පුත්‍රයකුට විශාල හැල් කෙත් යායක් අයිති ව ඇත. විහාරගල සෙල්ලිපියේ ද රජු විසින් කහවනු පන්සීයක් ගෙවා වැවක් මිල දී ගත් බව සඳහන් ය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය රෝහිත දසනායක සඳහන් කරන ආකාරයට රජු ට මෙන් ම සාමාන්‍ය ජනතාවට ද ඉඩම් අයිතිය තිබුණි. රජුගේ ප්‍රධාන වගකීමක් වූයේ ජනතාව ආරක්ෂා කිරීම ය. එම පදනමින් රජුට රාජ්‍යත්වය හිමි විය. මේ නිසා ම ජනතාව තමන් පරිහරණය කරන ඉඩමේ වගාවෙන් 1/6ක් රජුට ලබා දී තිබේ. මෙය ඉතා සුළු ප්‍රමාණයකි. එහෙත් හදිසි තත්ත්වයකදී 1/4ක් ගෙවා ඇත. රජු 'භූපති' ලෙස හඳුන්වා ඇත්තේ ඉඩම්වලින් බදු ලබා ගැනීමේ අයිතිය රජුට තිබුණු නිසා ය. එහෙත් මහා පරාක්‍රමබාහු රජු කහවනු පන්සීයක් ලබා දී ඉඩමක් මිල දී ගෙන තිබෙන්නේ ඉඩමේ අයිතියක් රජුට නොතිබූ බැවිනි. ඒ අනුව ඉඩමේ අයිතිය නොව බදු ලබා ගැනීමේ නිල අයිතිය රජුට තිබී ඇත. මහාවංශයේ මේ බදු හඳුන්වා තිබෙන්නේ බලි, කර, බාග හා පත්ති ආදී නම්වලිනි. ඉඩම්වලින් අය කළ බදු 'භෝජකපති' ලෙස සැලකේ. අනුරාධපුර රාජධානියේ සිට ම රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ඉඩම්වලින් ලබාගත් බදු ආදායමයි. විවිධ පුද්ගලයන් කළ සේවය වෙනුවෙන් ඉඩම් ලබා දීමේ ක්‍රමයක් ද එකල පැවතිණ. විහාර දේවාලගම් නඩත්තුව සඳහා ද මෙරට පාලකයන් ඉඩම් පූජා කර තිබේ. දුටුගැමුණු රජු විසින් නන්දිමිත්‍ර හා ඵුස්සදේවට කෙත් වතු ලබාදුන් බව මහාවංශයේ සඳහන් වේ. මේ ආකාරයෙන් ජනතාව සතු වූ ඉඩම් විවිධ නම්වලින් හඳුන්වා තිබේ. ඒ, ගබඩාගම් මුත්තෙට්ටු, බිසෝ ගම් ආදී ලෙස ය. රජුට අයත් ව තිබූ ගබඩාගමක් යම් පුද්ගලයකුගේ නිලයට අනුව අතිරේක ආදායමක් ලෙස තෑගි වශයෙන් පවරා දුන් අවස්ථා ද පවතී. ඒවා නින්දගම් ලෙස හඳුන්වා තිබේ. එසේ රජු සතු අසීමිත බලතල හේතුවෙන් ඉඩම් රාජසන්තක කිරීමේ හැකියාව ද ඔහුට පැවතිණ. රජරට විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය ඒ. මාරසිංහ සම්පාදනය කර ඇති ලිපියක දැක්වෙන ආකාරයට බ්‍රෝම්ලි (Bromly) 1989 වසරේදී ඉඩම් අයිතිය පිළිබඳ සංකල්ප 04ක් හඳුන්වා දී තිබේ. ඒ, පොදු දේපළ අයිතිය, පෞද්ගලික අයිතිය, විවෘත අයිතිය සහ රාජ්‍ය අයිතිය වශයෙනි. මෙරට අතීතයේ සිට වර්තමානය දක්වා අවධානය යොමු කිරීමේදී ශ්‍රී ලංකාවට ද එය පොදු තත්ත්වයකි.

### ඉඩම් අයිතිය

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත්විජිතයක් වීමෙන් අනතුරු ව පැවති ඉඩම් අයිතිය සම්පූර්ණයෙන් ම ඉවත් විය. කෝල්බෘක් ප්‍රතිසංස්කරණවලින් රාජකාරී ක්‍රමය අහෝසි කෙරිණි. වැඩවසම් ක්‍රමය වෙනස් වූ අතර ඉඩම් නිෂ්පාදන සාධකයක් බවට පත් විය. ඔවුන් මෙරට පැවති ක්‍රමය වෙනස් කළ එක් අවස්ථාවක් වන්නේ 1840 අංක 12 දරන කිරීට ඉඩම් ආඥා පනත (Crown Lands Orordinance) හඳුන්වා දීම ය. ඉන් සිදු වූයේ අයිතිය තහවුරු කළ නොහැකි සියලු ඉඩම් බ්‍රිතාන්‍යයන්ට හිමි ඉඩම් ලෙස ප්‍රකාශ කිරීම ය. මේ නිසා ඔප්පු සහ වෙනත් ලේඛනගත සාක්ෂි නොමැති ඉඩම්





අක්කර දහස් ගණනක අයිතිය අහිමි කර ගැනීමට ශ්‍රී ලාංකිකයන්ට ඉන් සිදු විය. 1956 අංක 10 දරන පන්සල් ඉඩම් ආඥා පනතෙන් තවදුරටත් ගැමියන්ගේ ඉඩම් අයිතිය සීමා සහිත විය. ඉන් සිදු වූයේ පන්සල සතු භූමිය මැන ලේඛනයක් සැකසීමයි. ධාන්‍ය බදු ආඥා පනතෙන් ඉඩම්වලින් රජයට බද්දක් ගෙවීමට නියම වූ අතර එය නොගෙවන්නේ නම් එම ඉඩම බ්‍රිතාන්‍යයන් සතු විය.

1897 අංක 01 දරන මුඩුබිම් ආඥා පනතෙන් ද ඉඩම් අයිතිය සීමා කෙරිණි. මෙහිදී පුද්ගලයකු පදිංචි ව සිටින භූමිය හැර ඔවුන්ට අයත් බව සඳහන් වන අනෙක් භූමි ප්‍රදේශ රජයට අයත් ලෙස සලකා තිබේ. ඉන් ගොවියන් සතු ඉඩම් තවදුරටත් ඔවුන්ට අහිමි විය. වනාන්තර, හේන් සහ වගා නොකළ ඉඩම් සම්බන්ධයෙන් මේ ආඥා පනත ක්‍රියාත්මක විය. මේ නීති ක්‍රියාත්මක කිරීම පැවරුණේ දිසාපතිවරුන්ට ය. 1903 වසරේදී මේ සඳහා ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ආරම්භ කෙරිණි. 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත අනුව අදාළ නීති ක්‍රියාත්මක වූ අතර බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආඥා පනත්වලට අනුව පාරම්පරික ඉඩම් භුක්ති ක්‍රමය අහෝසි වී දේශීය හා විදේශීය ධනපති පංතියට ඉඩම් රාශියක් අයත් විය. එහෙත් ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනතෙන් ඉඩම් අහිමි වූ පුද්ගලයන්ට තම අයිතිය ඉදිරිපත් කර සහන ලබා ගැනීමට අවස්ථාව සලසා දී තිබේ.

1935 ඉඩම් සංවර්ධන ආඥා පනතෙන් රජයට අයත් ඉඩම් ක්‍රමානුකූල ව යළි බෙදා හැරීමේ ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇත. ලබාදෙන ඉඩම කුඩා වීම වැළැක්වීම සඳහා ඉඩමට එක් අයිතිකරුවකු පමණක් සිටීමේ ක්‍රමය එහිදී හඳුන්වා දී ඇත. පසුකාලීන ව ස්වර්ණ භූමි, රත්න භූමි, ජය භූමි හා බිම්සවිය වැනි වැඩසටහන්වලින් ඔප්පු පිරිනැමීමට ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. ගොවිජනපද ආරම්භ වීමත් සමග විවිධ කාලවලදී ජනතාවට ඉඩම් ලබාදීම සිදු විය. මහවැලි ව්‍යාපාරය ද ඊට අයත් ය. මහවැලි ඉඩම් මුලින් ම බලපත්‍ර ලෙසත් පසුව ස්වර්ණ භූමි හෝ ජය භූමි ලෙසත් ලබා දී තිබේ. එම ඉඩම් හුවමාරු කිරීම හෝ විකිණීම සම්බන්ධ ගැටලු පැවතිණි. මේ කලාප සම්බන්ධයෙන් ක්‍රියා කළේ 1979 වසරේදී ආරම්භ කළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියයි. කිසියම් විශේෂිත ප්‍රදේශයක ඉඩම්වල පුද්ගලයන් පදිංචි කිරීම, ගොවිබිම් හා දේපළ ප්‍රවර්ධනය ඇතුළු කාර්ය මහවැලි අධිකාරිය සතු විය. ඉඩම් නොමැති ජනතාවට ගොවිජනපද ව්‍යාපාරවලින් ඉඩම් ලබා දුන්නත් ඒවායේ පූර්ණ අයිතිය පැවරුම්ලාභියාට හිමිවූයේ නැත. එහි පරම අයිතිය පැවරී තිබුණේ රජයට ය. 1931 ඉඩම් සංවර්ධන පනතෙන් ගොවිතැන් සහ නේවාසික කටයුතු සඳහා රජයේ ඉඩම් ලබා දීම සිදු විය. එහිදී ජනතාවට හිමි වූයේ ඒවා භුක්ති විඳීමේ අයිතියයි. ඊට අදළ ව ගොවිජනපදවල ක්‍රියාත්මක වූයේ පැවරුම් ඔප්පු සංකල්පයයි. වාරිමාර්ග අමාත්‍යාංශය පෙන්වාදෙන ආකාරයට මහවැලි කලාපයේ බලපත්‍රලාභීන් සංඛ්‍යාව 280,000කට වැඩි ය.

## උරුමයට උරුමය

ජනතාව භුක්ති විඳින ඉඩම්වල පවතින ගැටලුසහගත බව ඉවත් කර එම ඉඩම්වල පරම අයිතිය ලබාදීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන වන්නේ 2024 අයවැය යෝජනාවක් ලෙස ඉදිරිපත් කළ ‘උරුමය’යි. එහි ප්‍රමුඛ කාර්යය වන්නේ 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ වන අවසරපත්‍ර හා දීමනාපත්‍රලාභීන්ට 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 19 (2) වගන්තිය යටතේ නිදහස් ප්‍රදාන පත්‍ර ලබාදීමයි. තමන් සතු අවසරපත්‍ර හා දීමනාපත්‍ර ස්වකීය කැමැත්තෙන් රජයට

**1935 ඉඩම් සංවර්ධන ආඥා පනතෙන් රජයට අයත් ඉඩම් ක්‍රමානුකූල ව යළි බෙදා හැරීමේ ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇත. ලබාදෙන ඉඩම කුඩා වීම වැළැක්වීම සඳහා ඉඩමට එක් අයිතිකරුවකු පමණක් සිටීමේ ක්‍රමය එහිදී හඳුන්වා දී ඇත. පසුකාලීන ව ස්වර්ණ භූමි, රත්න භූමි, ජය භූමි හා බිම්සවිය වැනි වැඩසටහන්වලින් ඔප්පු පිරිනැමීමට ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. ගොවිජනපද ආරම්භ වීමත් සමග විවිධ කාලවලදී ජනතාවට ඉඩම් ලබාදීම සිදු විය. මහවැලි ව්‍යාපාරය ද ඊට අයත් ය. මහවැලි ඉඩම් මුලින් ම බලපත්‍ර ලෙසත් පසුව ස්වර්ණ භූමි හෝ ජය භූමි ලෙසත් ලබා දී තිබේ.**

භාර දී එම ඉඩම් සඳහා පරම අයිතිය සහිත ඔප්පුවක් ලබා ගැනීමේ හැකියාව ඔවුන්ට මෙයින් ලැබේ.

මේ වැඩසටහන ක්‍රියාත්මක වන්නේ අදියර 03ක් යටතේ ය. පළමු අදියර 2024 පෙබරවාරි මාසයේ ආරම්භ වූයේ ගොවිජනතාව ඇතුළු මහජනතාවට පරම අයිතිය සහිත නිදහස් ප්‍රදාන පත්‍ර 10,000ක් ලබාදීමෙනි. නිසි පරිදි කොන්දේසි සපුරා, සංවර්ධනය කර නිරවුල් ව භුක්ති විඳින ඉඩම් සඳහා දෙවැනි අදියර යටතේ නිදහස් ප්‍රදාන පත්‍ර ලබා දෙන අතර ලැබෙන ඉල්ලීම් අතුරින් ගැටලු සහිත ඉඩම් සඳහා අදාළ ගැටලු නිරාකරණය කිරීමෙන් පසු විධිමත් පරිදි තෝරා ගත් පුද්ගලයන්ට නිදහස් ප්‍රදාන පත්‍ර ලබාදීම සිදුවන්නේ තුන් වැනි අදියර යටතේ ය.

උරුමය වැඩසටහනේ අදාළ තොරතුරු ඇතුළත් කරන්නේ e-Slims හෙවත් රජයේ ඉඩම් තොරතුරු සහ කළමනාකරණ පද්ධතියට ය. රාජ්‍ය ඉඩම් බැහැර කිරීමේ ක්‍රියාවලිය සඳහා වඩාත් පුරවැසි හිතකාමී සහ කාර්යක්ෂම මෙන් ම ඵලදායි ක්‍රියාවලියක් සංවර්ධනය කිරීම එහි අරමුණ ය. මේ වැඩසටහන විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ජනාධිපති කාර්යාලයේ 'උරුමය ජාතික මෙහෙයුම් ලේකම් කාර්යාලය' පිහිටුවා ඇත.

**ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) වගන්තිය යටතේ ජනතාවට ලබා දී ඇති අවසර පත්‍රයේ තොරතුරු e-Slims පද්ධතියට ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම්වරයා නිර්දේශ කිරීමෙන් අනතුරු ව පළාත් ඉඩම් කොමසාරිස්, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්, අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට යොමු කෙරේ. උරුමය සින්නක්කර ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ වැඩි ම ඔප්පු සංඛ්‍යාවක් ලබාදෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැව් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 25ක් ලබාදීමට අපේක්ෂා කෙරේ.**

ඉඩම් හිමිකම ලබා දීමෙන් ගොවියන් සවිබල ගැන්වීම සඳහා පවුල් ලක්ෂ 20කට සින්නක්කර ඔප්පු ලබාදීම වැඩපිළිවෙළේ අරමුණයි. 2024 ජූලි මාසය අවසන් වන විට ඔප්පු 25000කට වැඩි සංඛ්‍යාවක් සකස් කර අවසන් බව ඉඩම් කොමසාරිස් ජනරාල් බන්ධුල ජයසිංහ සඳහන් කරයි. ඔප්පු සකස් කිරීම සඳහා තවත් 104,000ක පමණ අදාළ ලියකියවිලි යොමු කර ඇත. දිවයිනේ සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල හා අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලවල 'උරුමය ඒකකය' නමින් නව විශේෂිත ඒකක පිහිටුවා ඇත්තේ අයදුම්කරුවන් සම්බන්ධීකරණය, නියාමනය, ගැටලු විසඳීම සහ ප්‍රදාන පත්‍ර ලබාදීම ආදිය සඳහා ය.

ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 (2) වගන්තිය යටතේ ජනතාවට ලබා දී ඇති අවසර පත්‍රයේ තොරතුරු e-Slims පද්ධතියට ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම්වරයා නිර්දේශ කිරීමෙන් අනතුරු ව පළාත් ඉඩම් කොමසාරිස්, අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්, අන්තර් පළාත් සහකාර ඉඩම් කොමසාරිස් මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට යොමු කෙරේ. උරුමය සින්නක්කර ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ


කෝපි ඉඩම්වල සේවය කළ අය



වැඩි ම ඔප්පු සංඛ්‍යාවක් ලබාදෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැව් ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් මිලියන 25ක් ලබාදීමට අපේක්ෂා කෙරේ. ඔප්පු ලබාදීමේ වැඩසටහන කාර්යක්ෂම කිරීමට ජංගම වැඩසටහන් පැවැත්වීමටත් පියවර ගෙන තිබේ. ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් චන්ද්‍රා හේරත් සඳහන් කරන්නේ සින්නක්කර ඔප්පු ලබාදීමට අදාළ සියලු රාජ්‍ය ආයතන නිලධාරීන් ඊට එක් වන බව ය. මහවැලි කලාප 10ක ජීවත් වන බලපත්‍රලාභී සියලුදෙනාට 'උරුමය' යටතේ සින්නක්කර ඉඩම් ලබාදෙන බව වාරිමාර්ග අමාත්‍යාංශය සඳහන් කරයි. මේ වැඩසටහන යටතේ 65,000ක පමණ පිරිසකට ඔප්පු ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සින්නක්කර ඔප්පු 204,002ක් සකස් කිරීමට සැලසුම් කර තිබේ.

උරුමය සින්නක්කර ඉඩම් අයිතිය ලබා ගැනීම සඳහා ලියාපදිංචි වීමට ක්ෂණික ඇමතුම් අංකයක් ද හඳුන්වා දී ඇත. මහජනතාවට දිනපතා පෙරවරු 8.30-රාත්‍රී 8.30 දක්වා 1908 ක්ෂණික අංකයට අමතා ජනාධිපති කාර්යාලයේ උරුමය ජාතික මෙහෙයුම් කාර්යාලය සමග සම්බන්ධ වීමේ හැකියාව තිබේ.



# රජයේ ඉඩම් ප්‍රතිපත්තියක් නැහැ



**කේ. ඩී. බන්ධුල ජයසිංහ**
කොමසාරිස් ජනරාල්,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

රජයේ ඉඩම් ප්‍රතිපත්තිය යනු ඕනෑ ම රටක ඉඩම් රජයෙන් කළමනාකරණය කරන ආකාරය සඳහන් ලියවිල්ලක්. එහෙත් ශ්‍රී ලංකාවේ එය වරින් වර පනත් කිහිපයකින් ඉදිරිපත් කර තිබෙනවා මිස ජාතික ප්‍රතිපත්තියක් ලෙස සකස් කර නැහැ. 1927 වසරේ මෙන් ම 1940 ගණන්වල හා 1960 ගණන්වල කොමිෂන් සභා පත්කර ඉඩම් කළමනාකරණය ගැන කතා කර තිබෙනවා. 1987 පමණ වන තෙක් ඒ සම්බන්ධයෙන් අදහස් පළ වුණා. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් රාජ්‍ය ඉඩම් ප්‍රතිපත්තියක් සකස් කිරීමට ජාතික ඉඩම් කොමිසමක් තිබිය යුතු බව දන්වා තිබෙනවා. එය තවමත් ලංකාවේ ස්ථාපිත කර නැහැ. එය පළාත් සභා 09 සහ රජය ඒකාබද්ධ ව සිදු කළ යුතු වැඩපිළිවෙළක්. ඒ සම්බන්ධයෙන් පියවර ගනිමින් සිටිනවා. දැනට පවතින්නේ ඊට අදළ පනත් කිහිපයක් පමණයි.

ශ්‍රී ලංකාවේ රජයේ ඉඩම් යනුවෙන් කොටසක් තිබුණේ නැහැ. දැනට වසර ගණනාවකට පෙර සිට පැරණි ඉඩම්වල පාරම්පරික අයිතිය වන්නේ පුද්ගලයන්ට අයත් ව තිබීම. කැළෑ, ජලාශ, කඳු හෙල් ආදිය පැවතියත් ජනතාව තමන්ට හැකි ආකාරයෙන් විවිධ ලෙස ඉඩම් අයිතිය භුක්ති විඳ තිබෙනවා. උදාහරණයක් ලෙස හේන් භාවිතය පෙන්වා දෙන්නට පුළුවන්. එසේ පවතින විට 1505 පෘතුගීසින් පැමිණීමත් 1815 වන විට ඉංග්‍රීසීන්ට යටත් වීමත් නිසා ඉඩම් භාවිතයේ සිදුවුණේ පැහැදිලි වෙනස්කම්. කන්ද උඩරට ගිවිසුමෙන් පසු රට යටත් කර ගත්තත් ඔවුන්ට ආදායම් ලැබීමේ ක්‍රමයක් තිබුණේ නැහැ. මේ නිසා ආදායම් උත්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීමට ඔවුන් අවධානය යොමු කළා. එහිදී ඉඩම් භාවිතය ප්‍රමුඛ අවශ්‍යතාවක් වුණා.

බ්‍රිතාන්‍ය ජාතිකයන් 1897 වසරේදී මුඩුබිම් ආඥා පනත ගෙන ඒමෙන් සිදු වුණේ යම් ලේඛනමය සාක්ෂියක් මත තමන්ට අයිතිවාසිකම් පෙන්විය නොහැකි සියලු ඉඩම් රජයේ ඉඩම් ලෙස නම් කිරීම. ඒ සඳහා ඔප්පු තිබුණේ නැහැ. රජවරු විවිධ අයට ලබා දුන් සන්නස් තිබුණා. මෙවැන්නකින් හෝ තමන්ගේ යැයි සනාථ කළ නොහැකි සෑම ඉඩමක් ම පවරා ගනිමින් බ්‍රිතාන්‍ය ජාතිකයන් ගැසට් නිවේදන නිකුත් කළා. එතැන් සිටයි රජයේ ඉඩම් නැමැති සංකල්පය බිහිවුණේ.

රජයේ ඉඩම් ලෙස වෙන් කරගත් පසු පාරම්පරික ව කෘෂිකර්මාන්තයේ හා හේන් ගොවිතැනෙහි නිරතවූවන්ට

සියලු ඉඩම් අහිමි වුණා. බ්‍රිතාන්‍යයන් මේ ඉඩම් ඔවුන්ගේ හිතවතුන්ට වතු වගාව සඳහා බෙදා දීමටයි පියවර ගත්තේ. තේ, රබර්, පොල්, කොකෝවා ආදියෙන් එම කණ්ඩායම් ආදායම් ලබා ගත්තා. මේ නිසා සාම්ප්‍රදායික ව හේන්, කුඹුරු හා ගෙවතු වගා කළ ජනතාවට ආදායම් මාර්ග අහිමි වුණා මෙන් ම ඔවුන්ගේ ජීවන රටාවත් වෙනස් වුණා. ඉඩම් පමණක් නොව මාර්ග තැනීමට බ්‍රිතාන්‍යයන් වැව් යොදා ගැනීම නිසා වාරි සංස්කෘතියටත් දැඩි බලපෑම් එල්ල වුණා.

1920 පමණ වන විට මෙරට දැවැන්ත ආර්ථික අවපාතයක් ඇති වුණා. ස්වයංපෝෂිත ආර්ථික රටාවත් ඒ හේතුවෙන් බිඳ වැටුණා. එවිට ජනතාවට ජීවනෝපායක් සකස් කර දීමටයි පැවති ආණ්ඩුවලට සිදුවුණේ. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ඒ වන විට ලාංකිකයන් පිරිසක් රටේ පාලනයට එක් ව සිටියා. ඔවුන්ට අවශ්‍ය වුණා ජනතාවට යළි හේන් වගාව, වී වගාව සහ පදිංචිය සඳහා ඉඩම් ලබාදීමට. 1935 වසරේදී ඉඩම් සංවර්ධන ආඥා පනත හඳුන්වා දී තිබෙන්නේ ඒ සඳහා. ඉන් සිදු වූයේ ගොවිතැන් කළ ග්‍රාමීය ජනතාවට ගොඩ ඉඩම් හා මඩ ඉඩම් ලබාදීම. දීමනා පත්‍ර හා අවසර පත්‍ර ලෙසයි මේවා ලබා දී තිබුණේ. ඩී. එස් සේනානායක මෙය මුලින් ම ආරම්භ කළා ගල්ඔය, මින්නේරිය, පදවිය හා රාජාංගනය වැනි ගොවි ජනපද ආරම්භ කිරීමටත් පියවර ගනිමින්.

1940 ගණන්වල සාමාන්‍ය ජනතාවට අක්කර 08 බැගින් ලබාදීමට පියවර ගෙන තිබෙනවා පදිංචි වීමට අක්කර 03ක් සහ කුඹුරු ඉඩම් අක්කර 05ක් වශයෙන්. අවසර පත්‍රයක් හෝ දීමනා පත්‍රයක් මේ සඳහා ලබා දුන්නත් ඒවාට කොන්දේසි එක් කර තිබුණා. කිසිවකුට පැවරීමට නොහැකිවීම, කොටස් බෙදීම හෝ උගස් තැබීම කළ නොහැකි වීම, පදිංචියට දෙන ඉඩමේ වෙනත් කිසිදු කාර්යයක් කළ නොහැකි වීම ආදී කොන්දේසි ඉන් කිහිපයක්. කුඹුරක් පරිහරණය කළ යුත්තේ ද එලෙසමයි. පියා මිය ගියහොත් භාර්යාවට හෝ කලත්‍රයාට අයත් වන්නේ ජීවිත භුක්තිය පමණයි. දරුවන්ගෙන් වැඩිමහල් දරුවාට ඉඩමේ අයිතිය හිමිවීම වැනි කොන්දේසි ඊට යොදා තිබුණා. මේ ක්‍රමය වෙනස්කම්වලට ලක්වෙමිනුයි වර්තමානය දක්වා පැමිණ තිබෙන්නේ. 2022 වසරේදී සංශෝධනයක් ගෙන ආවා වැඩිමල් දරුවාට පමණක් නොව සියලු දරුවන්ට ඉඩම් අයිති වීම හා ගැහැනු පිරිමි භේදයකින් තොර ව සියල්ලන්ට ම ඉඩම් හිමිවිය යුතු ය යන්න. ඉඩම කුඩා කැබලිවලට වුවත් බෙදිය හැකිවීම, බැංකුවට උකස් කිරිමට අවසර හිමිවීම වැනි සංශෝධන ඒ යටතට ගැනෙනවා.

ඉඩම් සම්බන්ධයෙන් ඇති තවත් බලවත් පනතක් වන්නේ 1947 නීතිගත කළ රජයේ ඉඩම් ආඥා පනත. විශාල ඉඩම් ව්‍යාපාර සඳහා බදු දීම මේ යටතේ සිදු වුණා. ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපාරික ලෙස අක්කර 10, 15 හෝ 50 ආදී ලෙස ලබාදීම මෙහි අරමුණ වුණා. ව්‍යාපාරික වගාව වැනි ආයෝජන වෙනුවෙන් එය ක්‍රියාත්මක වී තිබෙනවා. 1972දී අක්කර 50ට වැඩි ඉඩම් රජයට ලබා ගැනීමේ පනතක් හඳුන්වා දුන්නා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා ඇත්තේ එම පනත යටතේ. ඊට අමතර ව ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනතක් ද හඳුන්වා දී තිබෙනවා. ඉන් සිදු වූයේ පදිංචිය සඳහා දීමනා පත්‍ර ලබාදීම. රජයට හැකියාව තිබෙනවා ඕනෑ ම අවස්ථාවක පෞද්ගලික ඉඩමක් හෝ අත්පත් කරගැනීමට. එය සිදු වන්නේ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙන්. වන්දි ගෙවීමෙන් හෝ නොගෙවා ඉඩම් ලබාගන්නා ක්‍රම එහි සඳහන්. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ මේ පනත්.

2024 අයවැය යෝජනාවක් ලෙස ‘උරුමය’ වැඩසටහන හඳුන්වා දුන්නා. ඉඩම්වලට පැවති කොන්දේසි සියල්ල ඉවත්කර සින්නක්කර ව ඉඩම්වල අයිතිය ලබා දිය යුතු බවයි එහි සඳහන් වුණේ. මුඩුබිම් පනතින් ජනතාවට අහිමි වූ ඉඩම් අයිතිය නැවත ලබාදීම යන්න ‘උරුමය’ නමේ අර්ථයයි. ඉඩම් සඳහා දීමනා පත්‍ර හා අවසර පත්‍ර ලබා දුන් 1935 වසරේදී ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව නේවාසික කටයුතු සඳහා අක්කර 03ක් ලබා දුන් විට එහි හැකියාව තිබෙන්නේ පදිංචි වීමට පමණයි. එහි වෙළෙඳසැලක් ආරම්භ කළ නොහැකියි. වඩුමඩුවක් වැනි වෙනත් කාර්ය කළ නොහැකියි. යම් ආකාරයක කර්මාන්තයක් කරයි නම් ඉඩම රජයට භාර දී බදු ලෙස නැවත ලබා ගත යුතු වනවා. බැංකුවට



එය තබයි නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ගත යුතුයි. මෙවැනි බැඳීම් මේ පනතේ තිබුණා.

'උරුමය' වැඩසටහනෙන් මේ සියලු කොන්දේසි ඉවත් කර තිබෙනවා. රජයේ බැඳීම්වලින් නිදහස් කර ජනතාවට කැමති ආකාරයෙන් ඉඩම් පරිහරණය හා කළමනාකරණය කිරීමේ අවස්ථාව එහිදී හිමිවනවා. මේ සඳහා සින්නක්කර ඔප්පුවක් ලබාදීම අලුතින් ඉඩම් ලබාදීමක් නොවෙයි.

1935 වසරේ සිට අද දක්වා ඉඩම් කච්චේරි පවත්වා අවසර පත්‍ර හා දීමනා පත්‍ර ලෙස රටේ ජනතාවට ඉඩම් බෙදා දී තිබෙනවා. දීමනා පත්‍ර යනු ස්වර්ණ භූමි, ජයභූමි, රත්න භූමි වැනි නම්වලින් ලබාදී ඇති ඔප්පු. අවසර පත්‍ර යන එල් ඩී.ඕ බලපත්‍ර ලෙස සඳහන් ඉඩම්. මෙවැනි ඉඩම් ලක්ෂ 20ක් පමණ තිබෙනවා. 'උරුමය' සින්නක්කර ඔප්පු ලබා දෙන්නේ මේ ලක්ෂ 20 සඳහා. මෙවැනි ඉඩමක අයිතිකරු මිය ගියහොත් එහි හිමිකම ලැබෙන්නේ කලත්‍රයාට 50%ක් හා දරුවන්ට 50%ක් ලෙස. සින්නක්කර ඔප්පු හිමි වූ ඉඩමක් උකස් කිරීම හෝ වෙනත් අයකුට ලිවීම හෝ නීතිඥවරයකු මාර්ගයෙන් කරන්නට පුළුවන්.

1947 රජයේ ඉඩම් ආඥා පනත යටතේ ලබා දෙන මේ ඉඩම් සමග ඔවුන්ට පිඹුරක් වෙන් කර දිය යුතුයි වගේ ම ඊට සැලැස්මක් තිබිය යුතු වනවා. ඉඩමට ඒවා සකස් කරදීම 'උරුමය' වැඩසටහනින් සිදු වන්නක්.




මෙහි ඔප්පුව නිර්මාණය කිරීමට එක් වන්නේ ආයතන කිහිපයක්. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව එහි ප්‍රධානතම ආයතනයයි. ඔවුන් චක්‍රලේඛය නිකුත් කළ පසු ජනතාව කැමැත්තෙන් ඔප්පුව සැකසීමට අදාළ සහතිකය ප්‍රාදේශීය ලේකම්වරයාට භාරදිය යුතු වනවා.

ඒ අනුව සින්නක්කර ඔප්පුවට අදාළ ලියවිලි ලියාපදිංචි කරන්නේ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවෙන්. පසුව එහි පිටපතක් ඉඩම් හිමියාට ලබා දෙනවා ඒවා භාරගත් බවට සඳහන් කරමින්. මීට සැලැස්මක් සකස් කිරීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දෙනු ලැබූ පසු ඔවුන් කරන්නේ ඔප්පුවේ විස්තර තහවුරු කර ගැනීමට ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් පත්තිරු ලබාගෙන අයිතිය තහවුරු කර ගැනීම. ඉන්පසු පළාත් ඉඩම් කොමසාරිස් හෝ අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් මගින් ඉඩම් විස්තර හා පැරණි ඔප්පුව ලබාගෙන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට එවනවා. මැනුම් දෙපාර්තමේන්තුවත් එම තොරතුරු ලබාගෙන ඒවා ගළපා ගැනීම පසුව සිදු කරන්නක්. මේ පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම තොරතුරු පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමයි ඊළඟ පියවර.

පැරණි ඔප්පුව හා අලුතෙන් සකසන ඔප්පුව යන ලියවිලි දෙක ම ජනාධිපතිවරයාට යවන්නේ ඔහුගේ අත්සන තැබීමට. එලෙස අලුත් ඔප්පුව අත්සන් කිරීමෙන් පසු ප්‍රාදේශීය ලේකම්වරයාට යොමු කිරීමයි සිදුවන්නේ. පසුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමෙන් පසු අයිතිකරුට එය භාරදීම සිදු වනවා. මෙලෙස මාසයක් ඇතුළත ඔප්පුවක් සකස් කර ලබාදීමේ හැකියාවක් පවතිනවා. දැනට 25000ක පමණ සින්නක්කර ඉඩම් ඔප්පු සකස් කර අවසන්.

# ඉඩම් භුක්තිය ආර්ථිකයත් සමග බැඳී පවතින්නක්




මහාචාර්ය
**කේ. එම්. රෝහිත දසනායක**
අංශ ප්‍රධාන
ඉතිහාස අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය


ඉඩම් භුක්තිය හෙවත් ඉඩම් ප්‍රයෝජනයට ගැනීමේ විකාශනය සිදු වන්නේ වසර තුන්දහසකට පමණ පෙර සිට. ක්‍රිස්තු පූර්ව 700-800 පමණ කාලයේදී මනුධර්ම ශාස්ත්‍රයේ සඳහන් කරන්නේ දඩයමේදී මුවාට විද මැරූ පුද්ගලයා නොව මුවාට පළමුවෙන් ම විද තුවාල කළේ කවුරුන් ද? ඔහුට මුවා හිමි වන්නා සේ ඉඩම පළමු ව වගා කළ පුද්ගලයාට එය හිමිවන බවයි. එහෙත් ජනගහනය වැඩිවීමත් සමග ඉඩම් භාවිතය වැඩි වී නීති ද වෙනස් වී තිබෙනවා.

ඉඩම් භුක්තිය ආර්ථිකයත් සමග, එනම් බදු සමග බැඳී පවතින්නක්. අතීතයේ

ඉඩම්වල අයිතිය රජයට ද? ජනතාවට ද? යන්න මත දෙකක් තිබුණා. රජු 'භූපති' යනුවෙන් හැඳින්වූයේ භූමියේ අයිතිකරු රජු නිසා. 'ස්වාමි' යන වචනයත් එකල භාවිත වුණා. සියලු ඉඩම් රජය සතු වූ බව ඉන් පැවසෙනවා. එහෙත් සාමාන්‍ය ජනතාවට ඉඩම් තිබූ බවත් ඇතැමුන් පවසනවා. ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තිය හා සමාන තත්ත්වයකුයි ඉන්දියාවේත් දක්නට ලැබෙන්නේ. මේ නිසා මෙරට ඉඩම් භුක්ති ක්‍රමය ඉන්දියාවෙන් පැමිණෙන්නට ඇතැයි සැලකෙනවා. බොහෝ කාලයක් මේ මත දෙක සාකච්ඡා වුණත් එම දෙපිරිසට ඉඩම් අයිතිය තිබුණු බවයි අනාවරණය වන්නේ.

රාජ්‍යත්වයට පත් වන රජු 'ජනතාව ආරක්ෂා කරයි' යන පදනමේ සිට තමන්ගේ වගා අස්වැන්නෙන් කොටසක් රජයට දීමට ජනතාවට සිදු වුණා. එය 1/6ක ප්‍රමාණයක්. හදිසි යුද්මය අවස්ථාවකදී 1/4ක් දක්වා එම ප්‍රමාණය වැඩි කර තිබෙනවා. රජුට රටේ ඉඩම්වලින් බදු අය කිරීමේ ඇති අයිතිය නිසයි රාජ්‍යත්වයට ජනතාව බදු ගෙව්වේ. වර්තමානයේත් රටේ නායකයා ජනතාව ආරක්ෂා කරයි යන මතය නිසයි ජනතාව රජයට බදු ගෙවන්නේ.

අතීතයේ විහාර, ආරාමවලට රජු ඉඩම් පූජා කර තිබෙනවා. රජුට ලැබෙන බද්දයි එලෙස පූජා කර තිබෙන්නේ. 'රජගල' වැනි සෙල්ලිපිවලින් එය පැහැදිලි වනවා. එහෙත් රජුට ඉඩම් අයිතියක් තිබුණේ නැහැ. ඇතැම් විට ගමේ වෙනත් ඉඩම් රජු මුදල් ගෙවා මිල දී ගෙන පූජා කර තිබීමෙන් එම කාරණය තහවුරු වෙනවා. ඉඩම් ආගමික ස්ථානවලට පූජා කළත් වගා කරන අයට ඉන් හානියක් සිදු වූයේ නැහැ. මේ නිසා අතීතයේ පැවති ඉඩම් ක්‍රමය සැනසිලිදායක වූවා පමණක් නොව ගෙවූ බද්ද ජනතාවට සේවය කළා. වගා කළහොත් පමණයි එලෙස බදු ගෙවිය යුතු වුණේ. එහෙත් යුරෝපයේ වගා හානි වුවත් බද්ද ගෙවිය යුතු වුණා.

**බ්‍රිතාන්‍යයන් අත්පත් කරගත් ඉඩම්වල තේ, රබර්, කෝපි වගා කළා. මේ නිසා බිහි වුණේ වෙන ම ධනපති පංතියක්. කෙසේ වෙතත් අද පවතින ඉඩම් භුක්ති ක්‍රමය පවතින්නේ බ්‍රිතාන්‍ය නීතියට අනුව. වගා නොකළත් රජයට බදු ගෙවිය යුතුයි. මේ නිසා අතීතයේ පැවති සහනශීලී ඉඩම් භුක්ති ක්‍රමය මේ වන විට අහිමි ව ගොස් තිබෙනවා මෙන් ම පැවති ඉඩම් භුක්ති ක්‍රමය ඉතා ම සාධාරණයි.**

බ්‍රිතාන්‍යයන් ලංකාව යටත්විජිතයක් ලෙස අත්පත් කර ගැනීමත් සමග ඉඩම්වල අයිතියත් තමන් භාරයට ගැනීමටයි පියවර ගත්තේ. ඒ, රජුට ඉඩම් අයිතිය තිබුණා යැයි පදනම් කරගෙන. ඔවුන් 1964 වසරේ මේ ඉඩම් ලියාපදිංචි කිරීම ආරම්භ කළා. එහිදී ඇතමුන්ට ලියාපදිංචි කරන්න ඉඩම් තිබුණේ නැහැ. හුවක දුරිනුයි ඉඩම් තිබුණේ. ඊට ලේඛන තිබුණේ නැහැ. ඇතමුන් ඉඩම්වලට ලේඛන සකස් කර ගත්තා. එහෙත් සාක්ෂි නැති ඉඩම් රාජසන්තක කළ නිසා එම ජනතාවට ඉඩම් භුක්කිය අහිමි ව ගියා. දේශීය ඉඩම් හිමි පන්තිය බිඳ වැටුණා. සාක්ෂි තිබුණු අය පමණයි ඉඩම් ආරක්ෂා කර ගත්තේ. ඉඩම් හිමි ප්‍රභූ පන්තියට එය ගැටලුවක් වුණේ නැහැ. එහෙත් ඉඩම් ලියාපදිංචි කිරීමේ ගැටලු තිබුණා. එම ඉඩම්වල මායිම් තිබුණේ නැහැ. විහාර දේවාලගම් පනත අනුව එම ඉඩම් ඒ ආකාරයට ම පවත්වාගෙන යාමට බ්‍රිතාන්‍යයන් අවසර ලබා දුන්නා.



බ්‍රිතාන්‍යයන් අත්පත් කරගත් ඉඩම්වල තේ, රබර්, කෝපි වගා කළා. මේ නිසා බිහි වුණේ වෙන ම ධනපති පංතියක්. කෙසේ වෙතත් අද පවතින ඉඩම් භුක්ති ක්‍රමය පවතින්නේ බ්‍රිතාන්‍ය නීතියට අනුව. වගා නොකළත් රජයට බදු ගෙවිය යුතුයි. මේ නිසා අතීතයේ පැවති සහනශීලී ඉඩම් භුක්ති ක්‍රමය මේ වන විට අහිමි ව ගොස් තිබෙනවා මෙන් ම පැවති ඉඩම් භුක්ති ක්‍රමය ඉතා ම සාධාරණයි.

# මහාවංසය

## ලෝක මතක ලැයිස්තුවේ





නිශාන්ත පීරිස්

රටක ඉතිහාසය දීර්ඝ ලෙස ලියා ඇති ලෝකයේ රටවල් ගණන අතළොස්සකි. ක්‍රිස්තු පූර්ව යුගයේ සිට අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් ගොඩනැගූ විශිෂ්ටතම ග්‍රන්ථය ලෙස මහාවංශය ලෝක උරුම අතර විරාජමාන විය. මෙරට ඉතිහාසය මෙපමණකින් හෝ ඉස්මතු කළ එය මහා විහාරයේ ඉතිහාස වෘත්තය මතු කිරීමට ගත් උත්කෘෂ්ට තැතක අග්‍ර ඵලය විය. මහාවංශය ලෝක උරුමයක් ලෙස ඓතිහාසික අභිනන්දනයට පත් වනුයේ යුනෙස්කෝ ජාත්‍යන්තර මතක ලේඛනයට ඇතුළත් වූ ඓතිහාසික කෘතිය ලෙසින් ජාත්‍යන්තර ශාස්ත්‍රීය අවකාශය යළි අවධි කරමිනි.

නොබෝදා (2024 ජූලි 17) ශ්‍රී ලංකාවට පැමිණි ජාත්‍යන්තර යුනෙස්කෝ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ඕඩ්රි අසුලේ පේරාදෙණිය විශ්වවිද්‍යාලීය පුස්තකාලයේ තැන්පත්කොට තිබූ මහාවංස පිටපත මෙරට හමුවූ හොඳම මහාවංස පුස්කොළ පොත ලෙසින් ජාත්‍යන්තරයට සනාථ කරවීම මෙරට ස්වර්ණමය සන්ධිස්ථානයක් මතු කළ සිද්ධියක් විය. මහාවංසය පාලි වංශ කතාවක් වූ අතර එය ක්‍රිස්තු වර්ෂ 5, 6 සියවස් අතර කාලයේදී පමණ රචනා වූවකි. අනුරාධපුර දික්සඳ සෙනෙවියා පිරිවෙනෙහි වැඩ විසූ මහානාම හිමි මේ විශිෂ්ට කෘතියෙහි කතුවරයාණෝ වූහ. මෙරට දැනට තිබෙන පැරණිතම වංශකතාව දීපවංසය වුවත් මහාවංශය ඊට වඩා බොහෝ උසස් ඓතිහාසික ග්‍රන්ථයක් වූයේ පුරාවිද්‍යාත්මක ව ද එහි සත්‍යතාව සනාථ වූ හෙයිනි.

මෙරට මුල් ග්‍රන්ථ මූලාශ්‍රය වූ අටුවා ග්‍රන්ථ ආභාසය කරගනිමින් ලියැවුණු මේ විශිෂ්ට කෘතිය බෞද්ධ ඉතිහාසයේ අග්‍රගණ්‍ය සාහිත්‍යය කෘතිය ම විය. පාලි, සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි, ප්‍රංශ, බුරුම ආදී භාෂා රැසකට ම පරිවර්තනය වී ඇති මේ ඓතිහාසික කෘතිය ලෝකයේ විශිෂ්ට ඉතිහාසඥයන්ගේ හා උගතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වීම ම ශ්‍රී ලාංකික අභිමානය ඉහළට ඔසවන්නකි. ලෝකයේ බොහෝ ස්ථානවල පිහිටි මහාවංශ කෘතියේ පැරණිතම පුස්කොළ පොත් ශ්‍රී ලංකාවේ විවිධ විහාරස්ථාන, පුස්තකාල හා කෞතුකාගාරවල තැන්පත් කොට ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මහින්ද සෝමතිලක අනාවරණය කරන්නේ රටවල් කිහිපයක ම ඓතිහාසික කෘති වාර්තා වී තිබෙන බව ය. ඒ පිළිබඳ අදහස් දක්වන ඔහු; විශේෂයෙන් ග්‍රීක දාර්ශනික හෙරඩෝටස් ක්‍රිස්තු පූර්ව 5 වැනි සියවසේදී පමණ ඓතිහාසික වාර්තාකරණයක් සිදු කළා. ඔහු ඉතිහාසයේ පියා ලෙස ඇතැමුන් සලකන්නේ ඒ නිසා. නමුත් ඔහුගේ කෘතිය ද අඩුපාඩු සහිත බව ග්‍රීක ඉතිහාසඥයන් පෙන්වා දී තිබෙනවා. එසේ වුවත් ඔහුටත් වඩා සාර්ථක ඉතිහාස වාර්තාකරණය කළේ ‘පෙලපොනීසියානු යුද්ධය’ නැමැති කෘතිය ලියූ තුසිඩිඩීස් (Thucydides) බවයි බොහෝ දෙනාගේ පිළිගැනීම. ඉන්දියාව හා මැදපෙරදිග ආදී රටවල ද ක්‍රිස්තු පූර්ව යගයේදී ම රචනා වූ තවත් ඓතිහාසික කෘති ද තිබෙනවා. මේ අතුරිනුත් මහාවංශය සුවිශේෂ වන්නේ ක්‍රිස්තු පූර්ව 6 වැනි සියවසේ සිට වර්ෂ 1815 ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ඉංග්‍රීසින් අල්ලා ගත් බව වාර්තා කිරීම දක්වා වූ වසර දෙදහස් පන්සියයක කාල පරිච්ඡේදයක් ඉන් ආවරණය වී තිබීමෙන්'. එතරම් දීර්ඝ ඉතිහාස කරුණු අනාවරණයක් වෙනත් කිසිදු කෘතියක සඳහන් වන්නේ නැහැ. ඊටත් වඩා වර්තමානය දක්වා වූ ඉතිහාසය යාවත්කාලීන වෙමින් මහාවංශය අදටත් ලියැවෙනවා. මෙවැනි අඛණ්ඩ සවිස්තරාත්මක කාල නිර්ණයක් ඓතිහාසික ව විවරණය වන්නේ මහාවංශයෙන් පමණක් බවයි ජාත්‍යන්තර විද්වතුන්ගේ මතය.”

මහානාම හිමියන් මහාවංශය ප්‍රථම භාගය ලිවීමෙන් පසු තවත් කතුවරු එයට තවත් කොටස් පහක් එක් කරමින් ඉදිරියටත් ලිවීම සුවිශේෂ කරුණකි. ඒ අනුව මහාවංශය මේ වන විට කොටස් හයකින් යුක්ත ය. දඹදෙණියේ ධර්මකීර්ති හිමි, තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමි, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමන්, යගිරල ශ්‍රී පඤ්ඤානන්ද නාහිමි, ආචාර්ය නන්දදේව විජේසේකර, බෙල්ලන ශ්‍රී ඥානවිමල හිමි වැනි වියතුන් අනෙක් වෙළුම් පහ රචනා කිරීමේදී මූලික වූ කර්තෘවරු වේ. මහාවංසයෙහි ප්‍රායෝගික වැදගත්කමක් ඇති බව විශ්වාස කළ මෙරට පාලනය කළ බ්‍රිතාන්‍ය ප්‍රධානීන් මහාවංශය ගැන විශේෂත්වයක් දැක්වීම නිසා ම එය ඉංග්‍රීසි භාෂාව ඇතුළු වෙනත් භාෂාවලට පරිවර්තනය වූ බව මහාචාර්යවරයා පවසයි. එම කාර්යය සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය මහින්ද සෝමතිලක; “ජෝර්ජ් ටර්නර් හා එඩ්වඩ් අප්හැම් මහාවංශය ඉංග්‍රීසියට පරිවර්තනය කළා. ඊළගට විල්හෙම් ගෛගර් නැමති ජර්මන් විද්වතා විසින් බ්‍රිතාන්‍ය රජයේ ඇරයුමින් එය නැවතත් ඉංග්‍රිසියට පරිවර්තනය කළ නිසා ම

බටහිර උගතුන් මහාවංශයේ වටිනාකම අවබෝධ කර ගත්තා. එවකට බ්‍රිතාන්‍ය රජය මෙහි සිංහල පරිවර්තන පවා නිවැරදි ව පරිවර්තනය වී ඇත්ද යන්න පරීක්ෂා කර බැලීමෙනුත් පෙනී යන්නේ ඔවුන් එහි නිරවද්‍යතාව ගැන උනන්දු වූ බව."

යුනෙස්කෝ ව්‍යාපෘතිය යටතේ මහාවංශයේ වඩා හොඳම පිටපත කුමක්ද යන්න තෝරා ගැනීමත් මේ කාර්යාවලියේදී ඉතා වැදගත් වේ. මෙරට බොහෝ විහාරස්ථානවල විශේෂයෙන් කුරුණෑගල රිදී විහාරය, මහනුවර දළදා මාළිගාව ඇතුළු විහාරස්ථාන රැසක ම තිබූ පුස්කොළ පිටපත් සියල්ල පරික්ෂා කිරීමෙන් අනතුරුව පේරාදෙණිය විශ්වවිද්‍යාලීය ලංකා එකතුවේ තිබූ මේ මහාවංශය පිටපත ගැන අවධානය යොමු කළ බවත් මේ දක්වා සොයා බැලූ සියලු පිටපත් අතරින් මේ විශ්වවිද්‍යාලයීය පිටපත පැරණි ප්‍රශස්ත මට්ටමේ මහාවංස පිටපත බවට ඒ සඳහා පත් කළ විද්වත් කමිටුව තහවුරු කළ බවත් මහාචාර්ය මහින්ද සෝමතිලක පවසන කරුණකි. යුනෙස්කෝවේ ක්‍රියාත්මක වන ලෝකයේ මතක පිළිබඳ ජාතික කමිටුව මෙයට වසර කිහිපයකට පෙර සිට අරම්භ කළ කාර්යයක් වූ මෙය යුනෙස්කෝ නිර්ණායක අනුව ම සිදු කිරීමත් වැදගත් වේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ ආචාර්ය උදය කබ්රාල් ප්‍රකාශ කළේ මේ කාර්යය සඵලකර ගැනීමට බොහෝදෙනා ශාස්ත්‍රීය කැපවීමක් කළ බව ය. යුනෙස්කෝ ජාතික කමිටුව යටතේ මෙරට පත් කළ අනු කමිටුවේ සභාපතිත්වය දැරුවේ මහාචාර්ය පූජ්‍ය එල්ලාවල මේධානන්ද නාහිමියන් ය. පසුව මහාචාර්ය මාලනී ඇඳගම ඒ සඳහා පත්වූ අතර මේ යෝජනා පත්‍රය යුනෙස්කෝව වෙත ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි නිර්ණායකානුකූල ව සකස් කළේ ආචාර්ය නිලාන් කුරේ ය. ආචාර්ය පණ්ඩුල ඇඳගම, මහාචාර්ය මහින්ද සෝමතිලක, චීන මහාචාර්ය හෝ හේ මිං, ආචාර්ය හේමා ගුණතිලක සමග ඩබ්ලිව්. සුනිල්, පුස්තකාලයාධිපති කේ. මහේෂ්වරන් වැනි ප්‍රවීණයන්ගේ දායකත්වය ද ඇති ව එම ශාස්ත්‍රීය යාන්ත්‍රණය පණ ගැන්විණි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එවකට උපකුලපති ධුරය දැරූ උපුල් දිසානායක, එම්. ඩී. ළමාවංශ වැනි මහාචාර්යයවරුන් ද මේ සඳහා දැක්වූයේ ශක්තිමත් දායකත්වයකි.

ලෝක උරුම, ස්වාභාවික උරුම, අස්පර්ශ උරුම, ලෝක මතක ලේඛනය වශයෙන් යුනෙස්කෝ ප්‍රධාන ව්‍යාපෘති 04කි. ලෝක මතක ලැයිස්තුවට මහාවංශය ඇතුළත් කිරීමට අදාළ යෝජනා පත්‍රය 2021 වසරේදී ඉදිරිපත් කළ අතර යුනෙස්කෝව විසින් එය පර්යේෂණ ක්‍රියාකාරීත්වයට ලක් කොට 2023 මැයි 24 දින ලෝක මතක ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබිණි. යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් අසුලේ ජූලි 17 දින ශ්‍රී ලංකාවේදී උත්සවාකාරයෙන් සිදු කළේ එම ඓතිහාසික වංසකථා පිටපත නිල වශයෙන් ලෝකයට ජනගත කිරීමයි.

මහාවංශ පිටපත් ලොව බොහෝ ස්ථානවල ආරක්ෂිත ව තිබුණ ද පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතු ව තිබූ එක් පිටපතක් ඒ සියල්ල අතරින් ප්‍රමුඛවීමේ ක්‍රියාවලිය ගවේෂණ අත්දැකීමක් වූ බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපති ආර්. මහේශ්වරන් සඳහන් කරන කරුණකි. විශ්වවිද්‍යාලය සතු ඓතිහාසික ලේඛන වාර්තා අතරින් මේ පුස්කොළ එකතුව ඉතා සුවිශේෂ වූවකි. වර්ෂ 1964දී පුස්තකාලයාධිපති වශයෙන් එම්. ඩී. සෝමදාස මෙරට බොහෝ ඈත ගම්වල විහාරස්ථාන වෙත ගොස් පුස්කොළ පොත් එකතු කිරීම නිසා අපේ ඓතිහාසික උරුමය මෙවැනි ජාත්‍යන්තර සුරක්ෂාවකට ළඟා කර ගත හැකි විය. පුස්කොළ පොත් 5200ක පමණ එකතුවක් පේරාදෙණිය පුස්තකාලය සතු වනුයේ එවැනි කැපවීම්වල ප්‍රතිඵල නිසයි.


මෑතකාලීන ව පුස්කොළ පොත් සංරක්ෂණය කිරීමේ ඒකකයක් විශ්වවිද්‍යාලයට එකතු විය. එම කාර්යය නේත්‍රා පුණ්‍යකර්මය වශයෙන් හැඳින්විණි. වර්ෂ 1302 දඹදෙණි යුගයට අයත් එහි සංරක්ෂිත පුස්කොළ පොත මෙරට පැරණිතම මුල් පුස්කොල පොතක් වශයෙන් සැලකේ. එබැවින් මේ සංචිතය රටේ උත්තරීතර උරුමයක් වන බව පුස්තකාලයාධිපතිවරයාගේ අදහස ය.

යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිසමේ මහලේකම් මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු ප්‍රකාශ කරන්නේ මහාවංශය ලෝක උරුමයක් පමණක් නොව ලොව විශිෂ්ටතම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් බැවින් එය දකුණු ආසියාවේ ප්‍රමුඛතම ඓතිහාසික ලේඛනය වශයෙන් යුනෙස්කෝව පිළිගෙන ඇති බව ය. එහෙත් මහාවංශය ඊටත් එහා සහශ්‍ර දෙකහමාරක පමණ කාලපරිච්ඡේදයක් ආවරණය කරන ග්‍රන්ථයක් බැවින් එතරම් විශිෂ්ට වෙනත් මූලාශ්‍රයක් නොමැති බව අද ලෝකය ම පිළිගෙන ඇත. අදහස් දක්වන මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු; "ලෝක මතක ලැයිස්තුවට මහාවංශය ඇතුළත් කිරීම ශ්‍රී ලාංකේය ජනතාව ලැබූ ඉහළ ම අභිෂේකයක්. ජාත්‍යන්තර ව සංරක්ෂණය කළ යුතු මහාවංශයේ තෝරාගත් මේ පුස්කොළ පොත පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් හමුවීමත් යුනෙස්කෝවට ඉතා වැදගත් වුණා. එම කෘතිය ලංකාව ගැන පමණක් නොව ලෝකය දෙස ම වෙනත් මානයකින් බලන්නට දෘෂ්ටියක් ඇති කර තිබීමත් සුවිශේෂයි."

ජාතියක් වශයෙන් නැගී සිටිමට මෙවැනි ශාස්ත්‍රීය ඵලදා ආයෝජනය කරගත නොහැක්කේ මන්ද යන්න පැනයකි. ලෝකයේ ම උත්කෘෂ්ට ජාතියක් වශයෙන් විරාජමාන වීමට අපට අතීත දෑ විරුවන් ඉතිරි කර ගිය දේ බොහෝ ය. ඒවා පොත්ගුල්වලට ම සීමා නොකොට ව්‍යවහාරික ලෝකයේ ප්‍රායෝගිකත්වයට අවතීර්ණවීමේ පෙරමග එළිය මහාවංසයෙන් පරාවර්තනය වී ඇත.



යුනෙස්කෝ සිහිවටන ඵලකය


මහාවංස පිටපත

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය මහාවංශ පිටපත


# නූතන සයිබර් වහල් කඳවුරු

**ටී. එම් .ජී. චන්ද්‍රසේකර**

නොබෝද CNN නාලිකාව විකාශය කළ වාර්තාවකින් අවධානය යොමු කර තිබුණේ අන්තර්ජාලය ඔස්සේ සිදුකෙරෙන වංචාවකට (Scam) ගොදුරු වී සියදිවි නසාගත් 82 හැවිරිදි ඩෙනිස් ජෝන්ස්ගේ ඛේදවාචකය ගැනයි. මේ වාර්තාව ගෙන එන Teele Rebane සහ Ivan Watson පවසන්නේ මෙය දසදහස් ගණනකගේ ඛේදවාචකවලින් එක් ඛේදවාචකයක් බවයි. උතුරු වර්ජිනියාවේ ජීවත් වූ තැන්පත් ධනයක් සතු ඩෙනිස් ජෝන්ස් සිය දරුවන්ගෙන් ඉවත් වී ගත කළ හුදෙකලා දිවියේදී ෆේස්බුක් සමාජ මාධ්‍යය ඔස්සේ ජේසී නම් කාන්තාවක් සමග මිතුරු වීමෙන් පසු මේ ඉරණමට ගොදුරු වී තිබුණි. ඔවුන් දෙදෙනා මාස ගණනක් අන්තර්ජාලය ඔස්සේ කතා කරමින් සමීප සබඳතාවක්





ගොඩනගාගෙන තිබුණි. අවසානයේ ජේසී ඩෙනිස්ට අරාධනය කළේ ක්‍රිප්ටෝ (crypto) මූල්‍ය ආයෝජනයකට එක්වන ලෙසයි. ඩෙනිස් ඊට එකඟ විය. කිසිදිනෙක ජේසී පෞද්ගලික ව මුණ ගැසී නැතත් ඩෙනිස් ඔහු සතු සියල්ල වියදම් කළ අතර ඔහුට කිසිවක් ඉතිරි නොවූ විට, ඇය තවත් මුදල් ඉල්ලා සිටියා ය. අවසානයේ ජේසීගේ සියලු සබඳතා නතරවී ගිය අතර සියල්ල අහිමි වූ ඩෙනිස් දරුවන්ට, සමාජයට මුහුණදීමට නොහැකි ව සිය දිවි නසාගෙන තිබුණි.

මේ අනුව අග්නිදිග ආසියාවේ ඩොලර් බිලියන ගණනක සයිබර් වංචා කර්මාන්තයක් ගොඩනගා ඇති චීන කල්ලි විසින් ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලබන දැවැන්ත ගෝලීය අපරාධ මෙහෙයුමක තවත් එක් ගොදුරක් බවට ඩෙනිස් ජෝන්ස් පත්වී තිබුණි. ඒ සඳහා ඔවුන් වංචාකරුවන්ගේ හමුදාවක් එක්රැස් කර ඇත, ශ්‍රී ලාංකිකයන් ඇතුළු බොහෝ දෙනකු ඔවුන්ගේ කැමැත්තෙන් තොර ව ආරක්ෂිත කඳවුරුවල රඳවාගෙන සිටින අතර ඔවුන්ගේ ජීවිත වන්දියට තබමින් ලෝක ජනතාවට වංචා කිරීමට එම වංචාකරුවෝ බල කරති.

CNN (2023) අනාවරණයකින් හෙළි වූයේ බොහෝ අය මේ වංචාකරුවන්ගේ මිනිස් ජාවාරමට ගොදුරු වන බවයි. සුදු කරපටි රැකියා ලබාදෙන බවට පොරොන්දු වෙමින් අග්නිදිග ආසියාවට රැගෙන යන මොවුහු මියන්මාරය, කාම්බෝජය, ලාඕසය සහ වෙනත් ගමනාන්ත වෙත ප්‍රවාහනය කෙරෙති. 2021 හමුදා කුමන්ත්‍රණයකින් පසු මියන්මාරයේ ක්‍රියාත්මක ලේ වැගිරුණු සිවිල් යුද්ධ පසුබිමක මෙවැනි අපරාධකරුවන්ට නිදහසේ ක්‍රියා කළ හැකි ආසියාවේ වංචා පාරාදීසය බවට එය පත් ව ඇත.

තායිලන්තය හා මියන්මාර මායිමේ, රටවල් දෙක වෙන් කරන නොගැඹුරු ගංගාවක් හැර අන් කිසිවක් නැති හුදකලා බිමෙක මේ සයිබර් වහල් කඳවුරු පිහිටා ඇති බව CNN වාර්තා පෙන්වා දෙයි. තොරතුරු තාක්ෂණ වහලුන් සිය ගණනකින් පිරී ඇති කාර්යාල, වින්දිතයන් සමග මිත්‍ර වීමට දිනකට පැය 16ක් වැඩ කරන අතර නීත්‍යානුකූල ක්‍රිප්ටෝ මුදල් හුවමාරු අනුකරණයෙන් පවත්වාගෙන යන මේ ව්‍යාජ වේදිකාවල මුදල් සඳහා ආයෝජනය කිරීමට ඔවුහු පොළඹවා ගනිති. ප්‍රමාණවත් මුදලක් දිනපතා සොයා ගැනීමට නොහැකි වන මේ වහල් සේවකයන්ට විවිධ වද බන්ධනවලට මුහුණදීමට සිදු වේ. තොරතුරු තාක්ෂණ රැකියා සොයා ගිය ශ්‍රී ලාංකික තරුණ තරුණියන් ද ගොදුරු වී ඇත්තේ මේ ඉරණමටයි. 2023 නොවැම්බරයේදී තායි-මියන්මාර දේශසීමා කලාපයට ගිය CNN වාර්තාකරු Tom Booth ප්‍රකාශ කරන්නේ මෙවැනි වහල් කඳවුරු දුසිම් ගණනක් තිබෙන බවයි. ඉන්දියානු ජාතික රාකේෂ් 2022 වසර අග භාගයේදී තායිලන්තයේ තොරතුරු තාක්ෂණ රැකියාවක් සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු මියන්මාරයේ 'ගේට් 25' නම් කඳවුරට යොමු කර, එහිදී ඔහුට මරණීය තර්ජන කොට වංචා සඳහා කොන්ත්‍රාත්තුවක් අත්සන් කර වංචා කිරීමට පුහුණු කෙරිණි. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇස්තමේන්තු කරන්නේ මිනිසුන් 120,000ක් දක්වා මියන්මාරයේ මෙවැනි කඳවුරුවල රඳවා තබාගෙන ඇති බවත් තවත් 100,000ක් කාම්බෝජයේ සහ වෙනත් තැන්වල

නවීන වහල්භාවයේ කොන්දේසි යටතේ රඳවා තබාගෙන ඇති බවත් ය.


මේ වංචා සඳහා තෝතැන්නක් වී ඇත්තේ අග්නිදිග ආසියානු රටවල් බැවින් එම වංචා හැඳින්වීමට 'ශූකර ඝාතක' (pig butchering) යන නම වහරට එක් ව ඇත. ඉන් අදහස් කරන්නේ විවිධ බලාපොරොත්තු වැනි ආහාර ලබා දී තරකොට අවසානයේ ඌරන් මරා දමනවා සේ මේ වංචාවලට ගොදුරුවන්නන්ගේ සියලු සේසත සූරාගන්නා බවයි. බොහෝ විට මේ වංචාකරුවෝ සමාජ මාධ්‍ය වේදිකා ඔස්සේ ගැහැනුන්, පුරුෂයන් ලෙස පෙනී සිටිමින් ප්‍රතිලිංගිකයන් සමග මිතුරු වී ව්‍යාජ ආදර සබඳතා ගොඩනගා ගනිති. කිසිදිනෙක දැක නැති මේ ආදරවන්තයන්ගේ විශ්වාසය මත මෙවැනි වංචාවලට පොළඹවා ගන්නා ඔවුන් තමන් සතු සියල්ල අවසානයේ අහිමි කර ගනී. ඔවුන් පිටුපස සිටින ව්‍යාජ කලාකරුවන් ව්‍යාජ සබැඳි අනන්‍යතා ලබාගෙන, ඔවුන්ගේ ගොදුරුවූවන් වංචනික ක්‍රිප්ටෝ මුදල් වෙබ් අඩවිවල ආයෝජනය කිරීම සඳහා ඔවුන් මූල්‍යමය වශයෙන් පොළඹවා ගැනීමට මාස ගණන් ගත කරති. වට්ස්ඇප්, ෆේස්බුක්, ලින්ක්ඩ්ඉන් සහ වැඩි වැඩියෙන් බම්බල් සහ ටින්ඩර් වැනි ආකර්ෂණීය apps ඔස්සේ වින්දිතයන් දඩයම් කරන වංචාකරුවන්ගෙන් මේ සමාජ මාධ්‍ය පිරී තිබේ.

එය කෙතරම් විශාල පරිමාණයේ සොරකමක් ද යත්, 2023 වසරේ ඇමරිකානු FBI ඇස්තමේන්තු කරන පරිදි, මේ Pig butchering වංචා දස දහස් ගණනක් ඇමරිකානු වින්දිතයන්ගෙන් ඩොලර් බිලියන 4කට ආසන්න මුදලක් සොරකම් කර ඇති අතර එය පෙර වසරට වඩා 53%ක වැඩිවීමකි. ඇමරිකානු නීති නිලධාරීන් පවසන්නේ ඉදිරි වසරේ මේ අපරාධ තවදුරටත් අඛණ්ඩ ව වර්ධනය වන අතර අපරාධකරුවන්ට ළඟා විය නොහැකි බැවින් මුදල් සහ ජීවිත අහිමිවීම දිගට ම පවතිනු ඇති බවයි. එසේ ම අපරාධ කල්ලි එක්රැස් කරන බිලියන ගණන් මුදල් වෙනත් නීතිවිරෝධී ක්‍රියාකාරකම් සමග සම්බන්ධ ව තිබීම එහි බරපතළකම තවදුරටත් වැඩි කර ඇති බවයි.

මියන්මාර මායිමේ පිහිටා ඇති මේ කඳවුරු සිය ව්‍යාපාර පවත්වාගන යාමට තායි දේශසීමාව පැත්තෙන් ටෙලිකොම් සේවා භාවිත කරයි. 2023






නොවැම්බරයේදී තායි අධිකරණ අමාත්‍ය Tawee Sodsong පැවසුවේ ඔවුන් එම සේවා කපා හැරීමට ක්‍රියා කරන බවයි. තායි ජාතික විකාශන සම්ප්‍රේෂණ කොමිසමේ Pachara Naripthaphan CNN වෙත ප්‍රකාශ කර ඇත්තේ මියන්මාරය, ලාඕසය හෝ කාම්බෝජය මායිම් ව ඇති ඕනෑ ම ප්‍රදේශයකට ආසන්නයේ රැහැන් රහිත සේවාවන් වසා දමන ලෙස මැයි මාසයේදී ඔවුන් සියලු ම ටෙලිකොම් ක්‍රියාකරුවන්ට උපදෙස් දුන් බවයි. එසේ තිබියදීත් ඔවුන්ගේ දත්ත පෙන්නුම් කරන්නේ අපරාධකරුවන් ස්ටාර් ලින්ක් වැනි චන්ද්‍රිකා සබඳතා අන්තර්ජාලයට සම්බන්ධ වීමට භාවිත කිරීම නිසා නීති විරෝධී ක්‍රියාකාරකම් අඛණ්ඩ ව පවතින බවයි.

මේ වාර්තා සැකසීම සඳහා පසුගිය සිදුවීම් විමර්ශනය කරමින් වාර්තාකරුවන් එකහෙළා ම අනුමාන කළේ ඩෙනිස් ජෝන්ස්ගේ සියදිවි නසාගැනීම පිටුපස ඇත්තේ මූල්‍යමය වංචාවක ගොදුරක් වීම බවයි. හේතු යුක්ති නොමැති ව සිදුවන බොහෝ සිය දිවිනසා ගැනීම් පිටුපස මෙවැනි සයිබර් අපරාධයකට ගොදුරුවීමේ කතාවක් ඇති බව බටහිර රටවල පිළිගැනීමට ලක් ව ඇත.

විශේෂයෙන් ආර්ථික අර්බුද අතර සුදුකරපටි රැකියා සොයා යන දකුණු ආසියානු රටවල තරුණ තරුණියන් ලෙහෙසියෙන් ම සයිබර් අපරාධකරුවන්ගේ වහලුන් බවට පත්වීමේ අවදානම වැඩිවෙමින් පවතී. ඔවුන්ගේ ග්‍රහණයට ලක්වූවන් මුදවා ගැනීම අද ජාත්‍යන්තර ගැටලුවක් බවට පත් ව ඇත. මොවුන් මැඩලීම සඳහා අසල්වැසි රටවලට කළ හැකි බලපෑම ද අවම වී ඇත. කොතෙකුත් දැනුවත් කිරීම් කළත් මේ වංචාවලට හසුවී නූතන වහලුන් බවට පත්වන පුද්ගලයන්ගේ සංඛ්‍යාවේ අඩුවක් නොමැති බව CNN වාර්තා පෙන්වා දෙයි.

Match, Bumble, Facebook සහ Whatsapp මව් සමාගම වන Meta ආයතනය CNN වෙත පැවසුවේ ඔවුන්ගේ සැක සහිත හැසිරීම හඳුනාගැනීමෙන් පසු ඔවුන්ගේ පරිශීලකයන් දැනුවත් කිරීමෙන් වංචාකරුවන්ගේ වේදිකා භාවිත කිරීම වැළැක්වීමට ක්‍රියා කරන බවයි. CNN වෙත ප්‍රකාශයක් නිකුත් කරමින් Bumble ජාලයේ ප්‍රකාශකයකු පැවසුවේ ඔවුන් සයිබර් වංචා සහ ව්‍යාජ apps හඳුනා ගැනීමට උපකාර කිරීම සඳහා AI තාක්ෂණය හඳුන්වා දී ඇති බවයි, එවැනි apps සාමාජිකයන් සමග අන්තර් ක්‍රියා කිරීමට අවස්ථාව ලැබීමට පෙර පියවර ගැනීම මෙහි අරමුණු කර ඇත.

එහෙත් බටහිර රටවල් පවසන්නේ එය ප්‍රමාණවත් නොවන බව මෙන් ම ක්‍රිප්ටෝ මුදල් වංචා මැඩලීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට සමාජ මාධ්‍ය, නිත්‍යානුකූල ක්‍රිප්ටෝ හුවමාරු ආයතන සහ සාම්ප්‍රදායික බැංකු එක්විය යුතු බවයි.

තායිලන්තය, මියන්මාරය වැනි රටවල් මායිම් කොට ඇති මේ සයිබර් වහල් කඳවුරුවලට එරෙහි ව ක්‍රියා කිරීමට එම රටවලටවත් තව ම හැකි වී නැත. එබැවින් මේ අපරාධ දැලට හසුවූවන්ගේ ඉරණම කුමක්වේදැයි කිසිවකුට තවමත් කිව නොහැකි ය. ශ්‍රී ලාංකිකයන් විශාල සංඛ්‍යාවක් ද මෙහි ගොදුරු බවට පත් ව අනේකවිධ හිංසනවලට ලක්වෙමින් සිටින බව ඔවුන් විටින් විට හොර රහසේ ලබාදෙන තොරතුරුවලින් හෙළි වේ

# මා දුටු තෙලංගානා

සුදීපා වික්‍රමසිංහ

ඉන්දියාවේ තෙලංගානා ප්‍රාන්තයේ අගනුවර වන හයිද්‍රාබාද්හි පිහිටි ආචාර්ය මරිච්චන්න රෙඩ්ඩි මානව සම්පත් ආයතනය විසින් ශ්‍රී ලාංකික මාධ්‍යවේදීන් සහ මාධ්‍ය වෘත්තිකයන් වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ මාධ්‍ය පුහුණු වැඩසටහනකට සහභාගි වීමට මා ඇතුළු මෙරට මාධ්‍යවේදීන් පිරිසකට  අවස්ථාව හිමි විය. 2024 ජුනි මස 23 සිට ජූලි මස 07 දක්වා පැවති එම වැඩසටහනේදී ඩිජිටල් තාක්ෂණය, වත්මන් තාක්ෂණික දියුණුව, සමාජ මාධ්‍ය භාවිතය ඇතුළු ලොව සන්නිවේදන කාර්යයන් සමග අත්වැල් බැඳ සිටින වත්මන් මාධ්‍ය වෘත්තිකයන්ට මෙන් ම ජනමාධ්‍ය පැවැත්මට ඇති අභියෝග, තර්ජන හා ප්‍රවණතා හඳුනා ගැනීමට හා ඒවාට සාර්ථක ලෙස මුහුණදීමට පුළුල් අධ්‍යයනයක් සහ පුහුණුවක් මාධ්‍ය කණ්ඩායමට ලැබිණි. එම වැඩසටහනට ඉන්දියානු මාධ්‍ය ප්‍රවීණයන්, විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන් මෙන් ම ඕස්ට්‍රේලියාව වැනි රටවල ජනමාධ්‍ය විෂය පිළිබඳ හසළ දැනුමැති විද්වතුන් එක් ව සිටියහ.

තෙලංගානා යනු මෑතකදී බිහි වූ ප්‍රාන්තයකි. තෙලංගානාව කලකට පෙර අයත් ව තිබී ඇත්තේ ආන්ද්‍රා  ප්‍රදේශයට ය. එවකට ද ආන්ද්‍රා ප්‍රදේශයේ අගනුවර වී ඇත්තේ හයිද්‍රාබාද් ය. 2014 වර්ෂයේ ජුනි මස 02 දින නිල වශයෙන් තෙලංගනාව නව ප්‍රාන්තයක් ලෙස නම් කර ඇත්තේ ඉන්දියාවේ 29 වැනි ප්‍රාන්තය ලෙස ය. තෙලංගානා භූමිය වර්ග කි.මී. 112077කි. එය ශ්‍රී ලංකාව මෙන් 1.71 විශාලත්වයකින් යුක්ත වේ. එහි ජනගහනය මිලියන 30ක් පමණ වේ. හයිද්‍රාබාද් නවීන තාක්ෂණය භාවිතයට ගන්නා ලොව ප්‍රධාන පෙළේ නගර අතර ඉදිරියෙන් ම සිටිනා නගරයකි. එහි පිහිටි T-Hub නමින් හඳුන්වන ලොව විශාලතම තොරතුරු උද්‍යානය එයට ප්‍රබල සාක්ෂියකි. අද වන විට හයිද්‍රාබාද් නගරයට පළමු වරට පිවිසෙන්නකුට හැඟී යනුයේ තමන් මේ සිටින්නේ ඇමරිකානු නගරයක බවයි, හයිද්‍රාබාද් එතරම් විශාල මෙන් ම අලංකාර ගොඩනැගිලිවලින් යුක්ත පොහොසත් නගරයක් බවට පරිවර්තනය වී තිබේ.

මේ සංචාරයේදී අපහට විවිධ ස්ථාන රැසක සංචාරය කිරීමට ද අවස්ථාව හිමි විය. ලොව විශාලතම සිනමා ගම්මානය ද වන රාමෝජි සිනමා ගම්මානය එසේ සංචාරය කිරීමට ලැබුණු රමණීය ස්ථානයකි. මේ සිනමා ගම්මානය රාමෝජි රාඕ විසින් 1996 වසරේදී නිර්මාණය කරනු ලැබ ඇති අතර වසරකට සංචාරකයන් මිලියන 1.6ක් පමණ මෙහි සංචාරය කරන බව පැවසේ. මෙහි වනාන්තර, උද්‍යාන, සිනමා ශාලා, මාලිගා, ගංගා, දිය ඇලි, දකුණු ඉන්දියානු පරිසර, උතුර ඉන්දියානු පරිසර, බටහිර නිවාස සංකීර්ණ, ගුවන් තොටුපොළ, දුම්රිය මාර්ග, මංමාවත්, සුපිරි නිවාස, දුගී පැල්පත්, විවිධ රටවල දර්ශන තල ආදී චිත්‍රපටයක් එක ම ස්ථානයක සිට රූගත කිරීමට අවශ්‍ය සියල්ල නිර්මාණය වී ඇති අයුරු විශ්මය දනවන්නකි. මේ සිනමා ගම්මානය ආශ්‍රිත ව සෘජු සහ වක්‍ර රැකියා 10,000ක් පමණ නිර්මාණය වී ඇත.





හුසේන් සගර් හී ගෞතම බුදුරුව

නාගර්ජුනා කොණ්ඩා ප්‍රදේශයේ පිහිටි නාගර්ජුනා සාගර් හා නාගර්ජුනා වේල්ල ද වැදගත් ස්ථාන ය. ක්‍රිෂ්ණා නදිය හරහා ඉදි කර ඇති ඉන්දියාවේ විශාලතම වේල්ල හේතුකොටගෙන නිර්මාණය වූ ජලාශයක් වන නාගර්ජුනා සාගර් අවට ප්‍රදේශය නාගර්ජුනා කොණ්ඩා ලෙස හඳුන්වයි. ඉන්දියානු ප්‍රසිද්ධ බෞද්ධ දාර්ශනිකයකු වන අචාර්ය නාගර්ජුන්ගේ නමින් මේ ස්ථානය නම් කර ඇත. වර්ෂ 1954 සිට 1960 දක්වා කාලයේ නාගර්ජුනා කොණ්ඩාහි කරන ලද විවිධ පර්යේෂණ හා කැණීම් හේතුවෙන් බෞද්ධ පුරාවස්තු විශාල සංඛ්‍යාවක් හඳුනාගෙන ඇත. බුදුන් සමයේ තෙලංගානා ප්‍රාන්තයේ බුදුදහම පැතිරී තිබූ බවට විශ්වාසයක් පවතී. නාගර්ජුනා සාගර් මැද පිහිටි කුඩා දූපතේ බුදුන් වහන්සේගේ ධාතූන් වහන්සේලා ඇතුළු විවිධ පුරාවස්තු ඇතුළත් කෞතුකාගාරයක් තිබේ.

තෙලංගානා ප්‍රාන්තයේ වරංගල් ප්‍රදේශයේ ස්ථාපිත වාස්තු විද්‍යාවට ප්‍රබල සාක්ෂියක් වූ දහස් කුලුනු කෝවිල ගෘහ නිර්මාණයට, ඉතිහාසයට ආදරය කරන්නන්ට මෙන් ම බැතිමතුන්ට ද වැදගත් ස්ථානයකි. හනම්කොණ්ඩ කඳු පාමුල පිහිටි, 12 වැනි සියවස රුද්‍රදේව රජු විසින් ඉදි කර ශිව දෙවියන් උදෙසා කැප කර ඇති බවට සලකන මේ කෝවිල කාකතීය රාජ්‍ය සමයේ ඉන්දියානු වාස්තු විද්‍යාවේ කලා කෞශල්‍යය මනාව විදහා දක්වයි. ඉන්දියානු පුරාවිද්‍යා සමීක්ෂණ ආයතනය යටතේ පාලනය වන මේ කෝවිලේ දේව ත්‍රිත්වය ලෙස හඳුන්වන ශිව, විෂ්ණු, සූර්යය යන දෙවිවරුන් පාදක කර ගනිමින් කෝවිල් 03ක් වෙන ම නිර්මාණය කර තිබීම සිත් ගන්නාසුළු ය. ශිව දෙවියන්ගේ කෝවිල නැගෙණහිරට මුහුණ ලා ඉදි කර ඇති අතර ශිව කෝවිල බටහිර දෙසට ද සූර්යය කෝවිල උතුරු දෙසට ද මුහුණ ලා පිහිටා ඇත.

පොලිස් ඒකාබද්ධ අණදෙන සහ පාලන මධ්‍යස්ථානය සතු ව ඉතා විධිමත් මාධ්‍ය විමර්ශන ඒකකයක් තිබේ. එමගින් පොදුවේ ඉන්දියාවේ ක්‍රියාත්මක ප්‍රධාන විද්‍යුත් නාලිකා විමර්ශනය කරන අතර තෙලංගානා ප්‍රාන්තය මුළුමනින් ම ආවරණය වන ලෙසට සියලු අපරාධ සිදුවීම් මෙන් ම රථවාහන වැරදි සම්බන්ධයෙන් පැය 24 ම CCTV (ආරක්ෂිත කැමරා උපකරණ) යොදා ගනිමින් විමර්ශනවල නිරත වේ. මෙහි විමර්ශන නිලධාරීන් 100-150ත් අතර පිරිසක් රාජකාරිවල නිරත වන බව එහි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පැවසුවේ ය.

මේ සංචාරයේදී ලොව විශාලතම තොරතුරු උද්‍යානය වන T-Hub, ඉන්දියානු ව්‍යාපාරික පාසැල, තෙලංගානා බෞද්ධ උද්‍යානය ලෙස හඳුන්වන  බුද්ධවානම්, හයිද්‍රාබාද් විශ්වවිද්‍යාලය, හයිද්‍රාබාදයේ සිට කිලෝමීටර 100ක පමණ දුරින් පිහිටි සහිරාබාද්හි සංගාරෙඩ්ඩි දිස්ත්‍රික්කයේ පාස්ටර්පූර් ග්‍රාමයේ පිහිටි කාන්තාවන් විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජා ගුවන්විදුලි මධ්‍යස්ථානය, හයිද්‍රාබාද් නගරය මැද හදවතක හැඩයෙන් යුත් හුසේන් සාගර් නමැති වැව මැද පිහිටි මීටර් 18ක් උස හා ටොන් 450ක් බරැති තනි පාෂාණයෙන් නිර්මාණය කරන ලද බුදු පිළිමය වැනි ස්ථාන රැසක් නැරඹීමට අපි භාග්‍යවන්ත වුණෙමු.

ඉන්දියාවේ තෙලංගානා සංචාරයෙන් පසු



දහස් කුලුනු කෝවිලේ කැටයම් නිර්මාණ



විදේශ රටක දර්ශන තලයක්




සිනමා ගම්මානයේ ඉදිරිපස දර්ශනයක්



# වාරණයම තිතක්

**තුසිත ජයසුන්දර**

සිරිලක සිනමා, වේදිකා නාට්‍ය ඇතුළු ප්‍රාසංගික කලා නිර්මාණ විෂයෙහි බලාත්මක ව ඇති ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩල පනතට ඇත්තේ වසර සියයකටත් වඩා පැරණි ඉතිහාසයකි. දශක කිහිපයක පටන් ම කාලානුරූප ව හා අවස්ථාවෝචිත ව මේ පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාව විවිධ පාර්ශ්ව විසින් පෙන්වා දෙනු ලැබුවේ උද්ගත වූ, උද්ගත වන හා උද්ගත විය හැකි ගැටලුකාරී තත්ත්ව කෙරෙහි සැලකිලිමත් වීමට සමගාමී ව ය. පසුගිය සමයේදී නිර්මාණ කාර්ය අභියෝගයට ලක් කෙරෙන අවස්ථා ගණනාවක් ම දැක ගත හැකි වූයේ මේ සම්බන්ධයෙන් සාධනීය පියවරක් නොගත් නිසා ය.

ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩල පනත ක්‍රියාත්මක කරන ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩලය බොහෝ විට හඳුන්වා දෙන්නේ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය ලෙසිනි. මාධ්‍ය භාවිතයෙහි මෙය වාරණ මණ්ඩලය හෝ කපන මණ්ඩලය හෝ ලෙස හඳුන්වා දෙන්නේ නිර්මාපක, නිපැයුම් හා රසික යන තෙපාර්ශ්වය ම වරෙක තැති ගන්වමිනි.

ජනපති රනිල් වික්‍රමසිංහ මහතා ඉකුත් වසරේදී පාර්ලිමේන්තු වාරය විවෘත කරමින් කළ දෙසුමේදී ද පවත්නා ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩල පනත වෙනුවට සංශෝධිත නව පනතක් බලාත්මක කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කළේ ය. මෙය ආසන්නතම හේතුවක් කොට ගනිමින් නව ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩල පනතක් කෙටුම්පත් කරනු පිණිස පිහිටවූ ජනපති කමිටුවේ සභාපතිත්වය දැරුවේ සමන් අතාවුදහෙට්ටියි. ප්‍රවීණ සිනමාකරු අශෝක හඳගම, ප්‍රවීණ වේදිකා නාට්‍යකරු රාජිත දිසානායක, සිනමා විචාරිකාවක හා අන්තර්ජාතික සිනමා සම්බන්ධීකාරිකාවක වන අනෝමා රාජකරුණා හා ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමනායක යනුවෙන් මෙහි සාමාජිකයන් සතරදෙනෙකි.

> **ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩල පනත ක්‍රියාත්මක කරන ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩලය බොහෝ විට හඳුන්වා දෙන්නේ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය ලෙසිනි. මාධ්‍ය භාවිතයෙහි මෙය වාරණ මණ්ඩලය හෝ කපන මණ්ඩලය හෝ ලෙස හඳුන්වා දෙන්නේ නිර්මාපක, නිපැයුම් හා රසික යන තෙපාර්ශ්වය ම වරෙක තැති ගන්වමිනි.**

සමන් අතාවුදහෙට්ටි කියා සිටින්නේ සිය කාර්යභාරයට සිනමා, වේදිකා නාට්‍ය ඇතුළු ප්‍රාසංගික කලාංග විෂය වන නිසා මේ කණ්ඩායමේ සංයුතිය අතිශයින් ම වැදගත් වන බවයි. වත්මන් ප්‍රසිද්ධ රැඟුම් මණ්ඩල පනතේ අත්දැකීම් හඳගම, රාජිත හා අනෝමා ලබා ඇති බව ද මෙහිදී සිහිකටයුතු ය. ජනාධිපති නීතිඥ ජගත් වික්‍රමනායක ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂ ධුරයක් දැරීම ද මෙහිලා වැදගත් වන්නකි.

සමන් අතාවුදහෙට්ටිගේ සභාපතිත්වයෙන් යුතු කමිටුව පළමු ව සිනමා ක්ෂේත්‍රයේ සියලු ප්‍රමුඛ පාර්ශ්ව සමග

දිගු සාකච්ඡා ගණනාවක නියැළුණේ අදහස් හා යෝජනා වඩා ප්‍රයෝගික තතු යටතේ සපයා ගනිමිනි. මෙතැනට සිනමාකරුවන්, සිනමා නිපැයුම්කරුවන්, සිනමා ප්‍රදර්ශකයන්, සිනමාපට ආනයනකරුවන්, සිනමාශාලා හිමියන් සෘජු ව ම ද සංවිධාන ආදිය ඔස්සේ ද සපැමිණ ඇත. මෙයට සමගාමී ව ලොව වර්ධිත සිනමා කලාප විෂයෙහි බලාත්මක නීතිමය රාමු, අණපනත්, මාර්ගෝපදේශ සහ පිළිවෙත් සියුම් ව හැදෑරීමට හා අන්තර්ජාතික අත්දැකීම් ඉවහල් කර ගන්නට තමා ඇතුළු කණ්ඩායම පියවර ගත් බව ද ඔහු කරන සඳහනකි. මෙසේ සකස් කළ කෙටුම්පත ජනපති රනිල් වික්‍රමසිංහ වෙත ඉදිරිපත් කළ බවත් අනතුරු ව එය කැබිනට් මණ්ඩලය වෙත යොමු කළ බවත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත එය ඉදිරිපත් ව ඇති බවත් අතාවුදහෙට්ටි කියා සිටින්නේ අනතුරු ව ඊට නීතිපති අනුමැතිය ලැබෙනු ඇතැයි යන විශ්වාසයෙනි. ඉනික්බිති ව කැබිනට් මණ්ඩලය වෙතත් ඉන්පසුව පාර්ලිමේන්තුව වෙතත් එය ඉදිරිපත් කෙරෙනු ඇත. පාර්ලිමේන්තුවේදී සංශෝධන සහිත ව හෝ රහිත ව හෝ අනුමත කොට කතානායක විසින් අත්සන් තබනු ලැබූ විට එය පනතක් සේ නීතිගත වනු ඇත.

**යෝජිත පනත සම්මත වීමෙන් අනතුරු ව පිහිටුවීමට නියමිත ප්‍රසිද්ධ රැඟුම් වර්ගීකරණ මණ්ඩලය විසින් සිනමාපට වර්ගීකරණට අදාළ හේතු ඒ ඒ නිපැයුම් පාර්ශ්ව වෙත ලබා දෙනු ඇත. සිය තීරණ අදාළ සහතිකපතේ සඳහන් කරලීමට ද පියවර ගනු ඇත. 'ප්‍රචාරක කාර්යයන්හිදී මණ්ඩලයේ තීන්දුව කුමක්දැයි යන්න අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතු ය' යනුවෙන් මෙතැනදී නව නියමයක් නිපැයුම් පාර්ශ්ව වෙත හඳුන්වා දෙනු ඇත.**

යෝජිත නව පනත සකස් කරලීමේදී පවත්නා පනතේ සඳහන් නියම ව්‍යවච්ඡේදනය කළ බව ද සමන් අතාවුදහෙට්ටි පවසයි. පවත්නා පනත යටතේ සිනමා ප්‍රේක්ෂක සහභාගිත්වය තෙයාකාරයකින් දැක්වේ. ඒ, අසීමිත මහජන ප්‍රදර්ශනය, වැඩිහිටියන්ට වඩාත් සුදුසු හා වැඩිහිටියන්ට පමණයි යනුවෙනි. මෙහිලා තියුණු ගැටලු පැන නැඟීමේ ඉඩක් විවර ව පවතින බව අතාවුදහෙට්ටි පෙන්වා දෙයි. ඔහු නිදසුනක් සේ ඉදිරිපත් කරන්නේ වසර ගණනාවකට පෙරාතුව සිරිලක සිනමාශාලා කරා 'ජුරාසික් පාක්' සිනමාපටය පැමිණීම ය. බටහිර රටවල මෙය වයස අවුරුදු 12න් ඉහළ ප්‍රේක්ෂකයන්ට පමණක් සීමා කළ ද සිරිලකදී ඊට අසීමිත ප්‍රදර්ශන අවසරය ලබා දී ඇත. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'රේඛාව' හා අශෝක හඳගමගේ 'තනි තටුවෙන් පියාඹන්න' විදෙස් සිනමා උළෙල නියෝජනය කළේ සිරිලකදී ලද ප්‍රේක්ෂක කාණ්ඩ හා එකඟ වන අයුරින් නොවේ.

යෝජිත පනතේ සිනමා ප්‍රේක්ෂක සහභාගිත්වය කාණ්ඩ පහකින් සමන්විත ය. පළමුවැන්න G-අසීමිත මහජන ප්‍රදර්ශනයයි. දෙවැන්න PG-දෙමාපිය අභිමතය පරිදි යන්න ය. තෙවැන්න PG 13-වයස අවුරුදු 13න් ඉහළ දෙමාපිය අභිමතය පරිදි යන්න ය. සිව්වැන්න 18-වයස අවුරුදු 18න් ඉහළ යන්න ය. පස්වැන්න R 21 - වයස අවුරුදු 21න් ඉහළ පරිණත වැඩිහිටියන් යන්න ය.

සමන් අතාවුදහෙට්ටි අවධාරණය කරන්නේ මේ පෘථුල හඳුන්වා දීම නිසා වෙසෙසින් ම සිනමාපට සමස්ත වශයෙන්, අර්ධ වශයෙන් හෝ කොටස් වශයෙන් වාරණයට ලක්වීමේ ඉඩකඩ ඉතා සීමිත බව ය. වයස අවුරුදු 21න් ඉහළ පරිණත වැඩිහිටි කාණ්ඩයේ ප්‍රේක්ෂකයකු ඊට අදාළ සිනමාපටයක් නරඹා අගතියට පත් වන්නේ නම් ඔහු අපරිණත වැඩිහිටියකු සේ සැලකිය හැකි බව ය.

මේ ප්‍රේක්ෂක කාණ්ඩ සමුච්ඡය තීන්දු කරලීමේදී ප්‍රමුඛ කාරණා සයක් පදනම් කර ගත් බව ද අතාවුදහෙට්ටි සඳහන් කරයි. පළමුවැන්න උපයුක්ත තේමාව ය. දෙවැන්න ප්‍රචණ්ඩත්වය හා භයංකාරත්වයයි. තෙවැන්න නග්නත්වයයි. සිව්වැන්න අනුරාගිකත්වයයි. පස්වැන්න උපයුක්ත බසයි. සයවැන්න මත්පැන් හා මත්ද්‍රව්‍ය පිළිබඳ නිරූපණයයි. මෙකරුණු විශ්ලේෂණයේදී පසක් වන්නේ කවර ශානරයකට අයත් සිනමාපටයකට වුව උචිත ප්‍රේක්ෂක පිරිසක් නිර්ණය කර ගැනීමට ඇති හැකියාව මේ ඔස්සේ සහතික වන වග ය. සිනමා කර්මාන්තයේ අභිවෘද්ධිය අරභයා මෙවැනි පිවිසුම් සාධනීය වන වග නොරහසකි.

මේ සියලු නිර්දේශ හා හඳුන්වාදීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වීමේ අවශ්‍යතාව අතාවුදහෙට්ටි පෙන්වා දෙයි. එසේ ම සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (අයි.සී.සී.පී.ආර්.) පනතට අනුකූල ව කටයුතු කිරීමේ අවශ්‍යතාව ද ඔහු මතු කරයි.

යෝජිත පනත සම්මත වීමෙන් අනතුරු ව පිහිටුවීමට නියමිත ප්‍රසිද්ධ රැඟුම් වර්ගීකරණ මණ්ඩලය විසින් සිනමාපට වර්ගීකරණට අදාළ හේතු ඒ ඒ නිපැයුම් පාර්ශ්ව වෙත ලබා දෙනු ඇත. සිය තීරණ අදාළ සහතිකපතේ සඳහන් කරලීමට ද පියවර ගනු ඇත. 'ප්‍රචාරක කාර්යයන්හිදී මණ්ඩලයේ තීන්දුව කුමක්දැයි යන්න අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතු ය' යනුවෙන් මෙතැනදී නව නියමයක් නිපැයුම් පාර්ශ්ව වෙත හඳුන්වා දෙනු ඇතැයි අතාවුදහෙට්ටි පවසයි. ඔහු අවධාරණය කරන්නේ තම කණ්ඩායම සකස් කළ කෙටුම්පතට අනුව ප්‍රසිද්ධ රැඟුම් වර්ගීකරණ මණ්ඩලය නිකුත් කරන අවසරය සහිත සහතිකය කිසිදු අපරාධ නීතියකට යටත් නොවන බවයි. මෙයින් උද්ධරණය කෙරෙන්නේ නිර්මාපක ප්‍රකාශන නිදහස තවදුරටත් සහතික වන්නේ ය යන්න ම නොවේ. එය තවත් වටයකින් සුරැකෙන බව ය.




# GFU
## රූපමය පෙළහර -3

චානුක දුල්ශාන් ද මැල්



රජයේ චිත්‍රපට අංශයේ 75 වැනි සංවත්සරයට (2023) සමගාමී ව ජාතික වැදගත්කමක් දරන චිත්‍රපට නව පරපුර වෙත සමීප කරවීම කාලීන අවශ්‍යතාවක් බව හඳුනා ගත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 'දෙසතිය' පුවත් සඟරාවේ එම චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් කෙටි විමසුමක් ගෙන ඒමට පියවර ගෙන ඇත. රජයේ චිත්‍රපට අංශයේ Youtube නාලිකාවට (GFU Sri Lanka) පිවිසීමෙන් එම චිත්‍රපට නරඹා ඔබගේ රසඥතාව වර්ධනය කර ගැනීමටත් ඉතිහාසය යළි කියවා ගැනීමටත් අපි එහිදී ඔබට ආරාධනා කළෙමු.

මේ, චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් තෙවැනි කෙටි විමසුමයි

හිසට ලේන්සුවත් කැහපොට ගසාගත් සරමත් ඇඳි කෙසඟ, ශක්තිමත් පෙනුමැති පිරිමි උදවිය යායට ඇති ලියදි පෙළෙහි පේළියට, ගොයමට බර වී ගොයම් කපමින් සිටිති. තවත් පසෙක අත් කොටටත් අත් දිගටත් හැඩ ව ඇඳ ඇති හැට්ටයෙනුත් චීත්තයෙනුත් සැරසී සිටින ගැහැනු සිනහවෙන් පිරීගිය මුහුණින් ගොයම් කපමින් සිටිති. මේ වැව්ගමේ තවත් එක් දවසකි. එයට දහවල ක්‍රමයෙන් උදාවිය. නාඹර ගැහැනුන් කමතට ගෙන එන්නේ ඇඹුළ ය. වැවෙන් ම කඩාගත් නෙළුම් කොළයට බතත් ඇඹුලත් බෙදන්නේ සියල්ලගේ ම සාමුහිකත්වයෙනි. උදේ සිට කුඹුරේ වැඩ කළ පිරිස වෙහෙස නිවමින් තුරු සෙවනේ කුසගින්න නිවාලන්නේ වත්මන් සමාජ ප්‍රවාහයට උගත් පාඩම් රාශියක් එකතු කරමිනි.

ගොවිතැන මේ ගම්වල උදවියගේ ජීවිතය සරිකරන ජීවනෝපායයි. ගම් වැව්වල අනාදිමත් කලෙක සිට අටුවේ වී හිඟ වුණේ නැත. යහමින් කා බී සිටින්නට ඔවුන්ට බත් තිබුණේ ය. ජීවිත බොහෝ නිස්කාංසුවෙන් ගෙවී ගියේ ය. මිදුලේ ද ගෙපිලේ ද වැඩ ඔවුන්ට එමට ය. කොප්පරා වේලන්නට ද  අතදරුවන්ට කිරි පොවන්නට ද ආගිය තොරතුරු







කතා කරන්නට ද ගෙමිදුල හොඳ ම තෝතැන්නකි.

දවස නිමාවන්නට ආසන්න ය. ගැටවර ගැහැනුන් සේ ම ළමයින් ද එක පෙළට යන්නේ දිය නෑමට ය. ඒ, වැවට ය. ගමේ ප්‍රධාන ජල පෝෂකය වන්නේ ද වැවයි. ගමත් වැවත් අතර තිබුණු දැඩි සම්බන්ධතාව නිසා ම මේ ගම් 'වැව් ගම්' ලෙස හඳුන්වයි. වැවට ජලය එකතු වුණේ වැවට ඉහළින් තිබෙන කැළෑවෙන් ය.

කාලයත් සමග මිනිස්සුන්ගේ හැසිරීමත් වෙනස් වන්නට විය. මේ කැළෑව ම හේන් ගොවිතැන් කරන්නට සිටි උදවිය කැළෑවේ ගස් කපා ඒවා සිදාදියේ ඇත්තන්ට විකුණා අමතර ආදායමක් ලබා ගන්නට පුරුදු වූහ. මේ හේතුවෙන් ගම වෙනස් විය. කැළේ විනාශ වීමෙන් දියපහරවල් සිඳී යාම නිසා බලා සිටියදී ම වැවේ ජලය අඩුවන්නට විය. කුඹුරුවලට ලැබුණු ජලයත් එන්න එන්න ම අඩු විය. මේ නිසා පිරී තිබුණු අටුවල වී හිඟ වන්නට විය.

මේ අර්බුදයට විසඳුම් සොයන්නට ගම ම වෙහෙස විය. විස්වාස ඇදහිලි මත ගමේ තැනින් තැන යාගහෝමත් පැවැත්විණි. ඒ අතරින් වැව් ගමක මිනිසුන්ට ලැබුණේ අලුත් මඟ පෙන්වීමකි. කැළෑව විනාශ වූයේ ගමේ ම අයගේ ක්‍රියා නිසා බවත් මැරුණු වැව් ගම් කැළෑවට නැවත පණක් දිය යුත්තේ තමන් ම බවත් ඔවුහු තේරුම් ගත්හ.


වන්නිකරයේ වැව් ගමක මේ කතාව පසක් කිරිමට ගත් නිර්ව්‍යාජ උත්සාහය, රූපමය භාෂාවෙන් පෙළගස්වන්නේ කීර්ති ශ්‍රී පෙරේරා ය. වර්ණ මි. මී. 16 කාණ්ඩයේ වාර්තා සිනමාපටයක් වූ මෙය 1986 වර්ෂයේදී මිනිත්තු 23ක් ඇතුළත රූගත කරන ලද්දකි. ආනන්ද ධර්මප්‍රියගේ කතාවක් ඇසුරෙන් ගොඩනැගුණු මේ චිත්‍රපටය ගැමුණු විජේසූරියගේ විවරණ කථනයෙන් හැඩ විය. ජෝර්ජ් පෙරේරා පටිගත කළ ශබ්දයෙන් හා රෝහණ වීරසිංහගේ සංගීතයෙන් ඔප්නැංවිණි. සංස්කරණය විජය කුමාර හා සෝමසිරි විතානආරච්චිගෙනි. කීර්ති අධිකාරි හා එම්. බී නවරත්නගේ කැමරා ඇසින් එහි රූප හසුකරගෙන ඇත.

මේ රූපමය පෙළගැස්ම අනාගතයේ මෙරට මානව වංශ කතාව යළි කියවන මානවයාට දැනුම් කෝෂයකි.



# වැඩිහිටියන් ළමයින්ට ඇඳීම





**නුවන් කුමාර කටුගම්පල**

ළමා පොත් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී ලේඛකයන්, සිතුවම්කරණ ශිල්පීන්, සංස්කාරකවරුන් සහ සැලසුම් ශිල්පීන් වෙත ළමා පොත් නිර්මාණය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමෙන් ප්‍රකාශන ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනයත් ළමා සාහිත්‍ය කෘති පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමත් අපේක්ෂාවෙන් 'ළමා පොත් පිළිබඳ ජාතික සමුළුව (NCCB)' ඇරඹී ඇත. එම සමුළුව විසින් පවත්වනු ලබන පුහුණු වැඩමුළු මාලාවේ සිතුවම්කරණ ශිල්පීය පුහුණු වැඩමුළු මීපේ ජාතික අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේදී ක්‍රියාත්මක වෙමින් පවතී.

එහිදී සාකච්ඡා වූ කරුණු අනුව චිත්‍ර කලාව හදාරා ඇති ඕනෑ ම චිත්‍ර ශිල්පියකුට ළමා පොත් සඳහා චිත්‍ර නිර්මාණය කළ නොහැකි ය. ඊට පොත් කර්මාන්තයේ තාක්ෂණික අංශ සහ පොත් නිර්මාණ කලාව පිළිබඳ මෙන් ම ළමයාගේ එක් එක් චින්තන අවධි, මොළය සහ කායික වර්ධනය, ළමයාට අදාළ මනෝවිද්‍යාත්මක සහ සමාජවිද්‍යාත්මක තත්ත්ව පිළිබඳ ද ප්‍රාමාණික අවබෝධයක් ශිල්පියාට තිබිය යුතු ය. ශ්‍රී ලංකාවේ එවැනි පුහුණු ශිල්පීන් දුර්ලභ ය. මේ බව හොඳින් තහවුරු වන්නේ අන්තර්ජාතික වෙළෙඳපොළේ අලෙවි වන, තත්ත්වයෙන් උසස් ළමා සහ යොවුන් පොත් සමග මෙරට පළවන පොත් සංසන්දනය කිරීමේදී ය.

ළමා පොතකට චිත්‍ර ඇඳීමේදී ශිල්පියා සතු ව පැවතිය යුතු මූලික අවබෝධතා කිහිපයත් ඇත. කතාව සහ එහි තේමාව තේරුම් ගැනීම (Understanding the Story and the Theme), ළමා හිතකාමී දෘෂ්‍ය විලාසයක් තෝරා ගැනීම (Selecting a Child-friendly Visual style), විශිෂ්ට චරිත නිර්මාණය (Creating Great Characters), දෘෂ්‍යමය වශයෙන් විශ්මයජනක පරිසරයක් ගොඩනැගීම (Build a Visually stunning Environment), කතන්දර පුවරුව සඳහා පෙළ සූදානම් කිරීම (Preparing Text breakdown for the Storyboard), චරිත හැඩතලවල විවිධ අර්ථ දැක්වීම (Showing Different meanings of Character shapes), චරිතවලට පණ දීම (Bring Life to Characters), චරිත සඳහා සුදුසු ම වර්ණ තෝරා ගැනීම (Selecting Matching Colors for Characters), පිටුවල පිරිසැලසුම් සංයුතිය හඳුනා ගැනීම (Understanding Page layout composition) ඉන් ප්‍රධාන වේ.

චිත්‍රයක් ඇඳීමට පූර්වයෙන් කතන්දර පුවරුව (story board), රූපරාමුව සහ රාමුවක් තුළ අනුබෙදීම් (Frames and spots), පෙළ ස්ථානගත කිරීම (Text Placement), චිත්‍රයට අදාළ විශේෂිත වාච්‍ය අංග පරිගණකයෙන් සැකසීම (Using Typography), පිටුවේ මුද්‍රණ සීමාව (Print Area), චිත්‍රයේ ක්‍රියාකාරී ගැලීම් ප්‍රදේශය (Page bleed area and Margin) යනාදිය හඳුනා ගැනීම ද අවශ්‍ය බව ප්‍රවීණ චිත්‍ර ශිල්පී සහ සැලසුම් ශිල්පී හසිතක නාරද රණතුංග පැවසී ය. මේ මූලික දැනුම සහිත ව සකස් කර ගන්නා ආකෘතියකින් තොර ව ළමා පොතකට චිත්‍ර ඇඳීම ප්‍රමිතියෙන් තොර පොතක් ළමයින් අතට පත් වීමට හේතුවක් වන බවත් ඔහු පෙන්වා දුන්නේ ය.

චිත්‍රශිල්පී පුහුණු වැඩසටහනේ සමායෝජක, මොරටුව විශ්වවිද්‍යාලයේ සමෝධානිත නිර්මාණ, මාධ්‍ය සහ සන්නිවේදන සැලසුම් අංශයේ සම්බන්ධීකාරක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය සුමන්ත්‍රි සමරවික්‍රම අදහස් දක්වමින් ළමයා අතට පත්වීමට පෙර ගෝලීය වටිනාකමකින් යුත් ගුණාත්මක තත්ත්වයෙන් උසස් (Global Standard) හොඳම පොතක් නිර්මාණය කිරීමට ළමා පොත් ක්ෂේත්‍රයේ නිර්මාණශීලී පාර්ශ්ව නව දැනුමින්, හැකියාවෙන් සහ ආකල්පවලින් සන්නද්ධ කිරීම රජයේ වගකීමක් බව පැවසුවා ය.

අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතනවලට ඒ කාර්යය සඳහා ඕනෑ ම සහයෝගයක් ලබා දීමට මොරටුව විශ්වවිද්‍යාලය සූදානම් බව ද ඇය ප්‍රකාශ කළා ය.

'පොත් සැලසුම්කරණය' (Editorial Designing) පුහුණුව මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලාවට ඇතුළත් කර තිබේ. එහි ඉලක්කය වන්නේ පොත් සැලසුම් ශිල්පීන් සහ ග්‍රැෆික් නිර්මාණ ශිල්පීන් (Graphic Designers) සඳහා පුහුණුව ලබා දීමෙන් පොත පරිශීලනය කරන්නා තේරුම් ගෙන පොත නිර්මාණය කිරීමට ප්‍රමාණවත් චින්තනමය සහ ආකල්පමය හැදියාව සහිත, විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ (User Centric and Scientific) පොත් සැලසුම් කරන වෘත්තිකයකු බිහි කරවීම ය. ඒ අනුව ඉදිරියේදී ළමා පොතක් නිර්මාණය වීම ලේඛකයා, චිත්‍රශිල්පියා, සංස්කාරකවරයා සහ කලා අධ්‍යක්ෂ (Art Director) යන සියලු පාර්ශ්වවල නිර්මාණශීලී එකතුවේ (Combination) ප්‍රතිඵලයක් ලෙස සිදු වේ. විශ්වවිද්‍යාලය


ආචාර්ය සුමන්ත්‍රි සමරවික්‍රම ප්‍රායෝගික ක්‍රියාකාරකම් මෙහෙයවමින්

යෝජනා කරන්නේ චිත්‍ර ශිල්පියා සහ සැලසුම් ශිල්පියා නිසි පුහුණුවකින් පසු කලා අධ්‍යක්ෂවරයකුගේ තත්ත්වයෙහි ලා සැලකීමටයි. චිත්‍ර ශිල්පියකු හෝ සැලසුම්කරණ ශිල්පියකු බොහෝ විට සිය වෘත්තියේ නියැළෙන්නේ තාක්ෂණික මෙවලමක (Technical tool) සහ පුද්ගලික පළපුරුද්දේත් හැකියාවේත් (Experience and Skill) ආධාරයෙනි. කලා අධ්‍යක්ෂවරයකු ක්‍රියා කරන්නේ විද්‍යාත්මක චින්තනය (Scientific Thinking) සහ විද්‍යාත්මක යෙදවුමක් (Scientific Application) භාවිතයෙන් වීම මේ දෙපිරිසේ වෘත්තීයභාවයේ වෙනසයි. මෙබඳු පුහුණුවක අවසාන අපේක්ෂාව වන්නේ ළමයාගේ ජීවිතය ධනාත්මක ව වෙනස් කළ හැකි ගුණාත්මක තත්ත්වයෙන් උසස් පොතකි. එනම් ළමා පොතක් නිර්මාණය කිරීමේ විද්‍යානුකූල පදනම (Science of Designing Books for Children) මත පිහිටා නිමැවූ පොතකි.

ළමයාගේ වැඩීමත් සමග ඔහුගේ කියවීමේ පුරුද්ද (Reading Habit) වෙනස් වේ. එබැවින් වයස් කාණ්ඩය පිළිබඳ නිසි තක්සේරුවකින් යුතු ව ළමා පොතකට චිත්‍ර ඇඳිය යුතු ය. අලුතින් බිහි වන තාක්ෂණික මානවයාට සහ ඇල්ෆා පරම්පරාවට (Alpha Generation) සරිලන ලෙස ඇඳිය යුතු ය. නව පරපුර සිය උපතත් සමග ඩිජිටල් තාක්ෂණය රැගෙන එන අය (Digital Natives) ය. ඔවුන් අත මුද්‍රිත පොතක් රඳවන්නේ කෙසේද? යන්න අද දවසේ ළමා පොත් නිර්මාණකරුවන්ට ඇති ප්‍රධානතම අභියෝගයයි. එම අභියෝගය ජය ගැනීමට සුදුසු ළමා පොත් නිර්මාණ ශිල්පීන් පිරිසක් බිහි කර ගැනීම ද මේ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ය. ඒ සඳහා තාක්ෂණය සතුරකු සේ නොසලකන නිර්මාණ ශිල්පීන් පිරිසකගේ සහභාගීත්වය අවශ්‍ය බව ආචාර්ය සුමන්ත්‍රි සමරවික්‍රම පැහැදිළි කළා ය. ඇය අවධාරණය කළේ මේ වෙනස සිදුවිය යුතු හොඳම අවස්ථාව මෙය බව සහ එසේ නොවුණහොත් අපේ රටේ අනාගත දරුවා අපට මගහැරී යාමට ඉඩ තිබෙන බව ය.

පොතකට චිත්‍රයක් ඇඳීම සඳහා සිතුවම්කරණ ශිල්පීන් භාවිත කරන ක්‍රම දෙකකි. එනම් කඩදාසියක ඇඳීම (Manually) සහ ඩිජිටල් තිරයක ඇඳීම (Digitally) ය. මේ ක්‍රම දෙක සංසන්දනයෙන් එකිනෙකෙහි ගුණාත්මක තත්ත්වය (Quality) උසස් හෝ පහත් ලෙස විභේදනය කිරීම යෝග්‍ය නොවේ. මේ ක්‍රම දෙක කිසිවිට එකිනෙක සමග සමපාත වන්නේ ද නැත. ළමයාගේ හැඟීම් (Feelings, Mood) සහ ආකල්ප (Attitudes) සමග කරන ගනුදෙනුව සාර්ථක වීමටත් ළමයාගේ මානසික සංවර්ධනයටත් පොතේ ජීවමය ගුණය ආරක්ෂා කිරීමටත් පොත දක්වන දායකත්වය අනුව පොතක ගුණාත්මක බව පිළිබඳ සෑහීමකට පත්වීමට හැකි වේ. ඒ අනුව එහි උසස් ප්‍රමිතිය තීරණය වේ. චිත්‍ර අඳින ක්‍රමය ඊට අදාළ නොවේ.

පොතේ විෂය නොහොත් ප්‍රස්තුතය නැතිනම් මාතෘකාව අවබෝධ කරගෙන චිත්‍ර නිර්මාණයට අවතීර්ණ වීම ද යුතු ය. වෙනස් චිත්‍ර සහිත ආකර්ෂණීය සහ ගුණාත්මක පොතක සාර්ථකත්වය මැනිය හැක්කේ ළමයා ජීවිතයේ කවදා හෝ ඉන් ලබන දැනුම ප්‍රයෝජනයට ගන්නා අවස්ථාවක ය. එබැවින් හොඳ පොතක් යනු අනාගතවාදී ව (Futuristic) ප්‍රතිඵල ලබාදෙන මෙවලමක් බව ද අවබෝධ කරගෙන නිර්මාණ ශිල්පියා ක්‍රියා කළ යුතු බව ද ඇය අවධාරණය කළා ය.

රචකයා විසින් චිත්ත රූපවලින් චිත්‍රණය කර අකුරින් එළිදක්වන ප්‍රස්තුතයක් දෘශ්‍ය රූපයට පෙරළා එය ළමා පොතක් බවට පත් කිරීම චිත්‍රශිල්පියාගේ කාර්යභාරයයි. ඔහු සිය භූමිකාව නිසි ලෙස තේරුම් ගෙන ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට විය යුතු ය. ශ්‍රී ලංකා ළමා සිතුවම් ශිල්පී සංසදයේ කැඳවුම්කරු, ශ්‍රී ලංකා ළමා ලේඛක සංසදයේ ක්‍රියාකාරී සාමාජික, IBMC ප්‍රකාශන ආයතනයේ සංස්කාරක, චිත්‍ර ආචාර්ය, ප්‍රවීණ චිත්‍ර ශිල්පී සහ ලේඛක අරුණ කීර්ති ගමගේ පැවසුවේ ළමා පොත් සඳහා චිත්‍ර අඳින ශිල්පීන් ද ඊට අවතීර්ණ වන ආකාරය අනුව වර්ගීකරණයකට ලක් කළ හැකි බව ය. ඒ අනුව 'ළමා පොත් සඳහා සිතුවම්කරණය'

අධ්‍යාපනික ව හැදෑරූ ශිල්පීන් ක්ෂේත්‍රයේ සිටින්නේ අතළොස්සකි. බහුතරය වන්නේ චිත්‍ර විෂය පිළිබඳ උපාධි සහ ඩිප්ලෝමා මට්ටමේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලැබූවන්, ආයතනයකට සම්බන්ධ වීමෙන් පසු රැකියාවක් ලෙස සිතුවම්කරණයෙහි නිරතවන්නන්, දැන්වීම්කරණ සමාගම්වල චිත්‍ර ශිල්පීන් ලෙස සේවය කරන්නන්, නිවසේ සිට හෝ වෙනත් රැකියාවක් කරන අතරතුර විනෝදාංශයක් ලෙස හෝ ස්වයං රැකියාවක් ලෙස චිත්‍ර අඳින්නන් ය. එහෙත් ඒ සියලුදෙනා 'ළමා පොත් සඳහා සිතුවම්කරණය' පුහුණු කළ අය නොවේ. ඉහත සෑම කාණ්ඩයකට ම අයත් වූවන් නිසා ඊට වැඩි බරක් තැබිය යුතු වන්නේ තත්ත්වයෙන් උසස් පොතක් පළකිරීම සඳහා වැය වන අධික මූල්‍ය සහ ශ්‍රම පිරිවැය ගැන කනගාටු වෙමින් නොවේ. මෙවැනි ගුණාත්මක සංවර්ධනයක් ළමා පොත් ක්ෂේත්‍රයට සිදු වන අවධියක මුද්‍රණ කඩදාසි සහ මුද්‍රණ වියදම් ද අධික ලෙස මිල ඉහළ යාම නිසා පොතේ මිල දරා ගැනීමට අමාරු තත්ත්වයක් අද පාඨකයාට ඇති වී තිබේ. ප්‍රකාශකයන්ට ද මිල ඉහළ දමනවා හැර වෙන කළ හැකි දෙයක් නැත. එබැවින් පොතක මිල තීරණයට බලපාන බදු සහ අනෙකුත් අධික පිරිවැයට හේතුවන බාධක ඉවත් කිරීමට රජයේ 2024 වර්ෂය ශ්‍රී ලාංකේය ළමා පොත් ක්ෂේත්‍රයේ සංක්‍රාන්ති වර්ෂයක් (Transition Year) බවට පත් වන වග Room to Readහි දේශක ඉන්දික ගනේගොඩ ප්‍රකාශ කළේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලයේ උපදෙස් ඇති ව සකස් කරන ලද 'ළමා පොත් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය' කෙටුම්පත මෙවර කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමී ව ජනගත කර මහජන අදහස් ලබා ගැනීමට ක්‍රියා කරන බව ද සඳහන් කරමිනි. ඉන්පසු එය ජාතික ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා බවත් හෙතෙම පැවසී ය. ඒ





එකිනෙක කතාන්දර වෙනුවෙන් සැකසූ කතාපුවරු (Story Board) පරීක්ෂා කරන ශිල්පී ශිල්පිනියන්

අතරින් අයදුම්පත් කැඳවීමෙන් තෝරාගත් පිරිසක් මේ ව්‍යාපෘතිය යටතේ පුහුණුව ලබති. එබැවින් මේ අවස්ථාව මෙරට ළමා පොත් ක්ෂේත්‍රය ජාත්‍යන්තරකරණය කිරීමට තිබූ ප්‍රධාන බාධාව වන උසස් තත්ත්වයෙන් යුත් පොතක් නිර්මාණය නොවීමේ බාධාව ඉවත් කරන සුවිශේෂී හැරවුම් ලක්ෂ්‍යයක් වනු ඇත.

ළමා පොතක චිත්‍ර සහ පෙළ වෙනුවෙන් පිටුවක වෙන් විය යුතු ප්‍රමාණය සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ පිළිගත් සම්මත සහ ප්‍රමිති ඇත. මෙවැනි ප්‍රමිති හඳුන්වා දීමට හේතු වී ඇත්තේ දරුවාට භාෂාව හුරු වීමේ මූලික අඩිතාලම දැමෙන්නේ පිංතූර කියවීමෙන් වන නිසා ය. ඉන්පසු අක්ෂර, වචන, වාක්‍ය සහ ඡේද වශයෙන් කියවීම සංවර්ධනය වන්නේ ක්‍රමික ව ය. ඒ, වයස් කාණ්ඩයෙන් වයස් කාණ්ඩය පසු වීම සමග සමගාමිව ය. ළමා පොතකට චිත්‍රයෙන් ලබා දෙන්නේ පෘථුල සන්නිවේදනමය වටිනාකමක් බව තේරුම් ගත හැක්කේ එබැවිනි. මේ අදාළ අංශ මැදිහත් විය යුතු බවත් අරුණ කීර්ති චිත්‍රශිල්පියා පැවසී ය.

මෙසේ දීර්ඝ ක්‍රියාවලියක් ඔස්සේ අධික වැය බරක් දරමින් නිකුත් කෙරෙන ගුණාත්මක ළමා පොතක වටිනාකම පිළිබඳ ඒවා පරිශීලනය කිරීම සඳහා දරුවා පෙළඹවීමේ සහ මගපෙන්වීමේ වගකීම ඇති පාර්ශ්ව නිසි අවබෝධයෙන් පසුවේ ද? යන්න ද ගැටලුවකි. දෙමව්පියන්, පාසල් ගුරුවරුන්, පෙරපාසල් ගුරුවරුන්, සහ පුස්තකාලයාධිපතිවරුන්ට මේ සම්බන්ධ දැනුම ලබා දීම සඳහා වැඩපිළිවෙළක් කෙරෙහි ද අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇත. එවැන්නක් ක්‍රියාත්මක නොවුණහොත් කෙතරම් ප්‍රමිතිගත පොතක් වෙළෙඳපොළට පැමිණිය ද එය ළමයා අතට පත් වීමට තිබෙන ඉඩප්‍රස්ථා අඩු ය. එය අනාගත පරපුරට මෙන් ම ලේඛක, චිත්‍රශිල්පී, සංස්කරණ ශිල්පී, සැලසුම් ශිල්පී, කලා අධ්‍යක්ෂ සහ ළමා පොත් ප්‍රකාශන කර්මාන්තයට ද ඉසිලිය නොහැකි පාඩුවක් වනු ඇත.

වන විට යහපත් ළමා පොත් සංස්කෘතියක් සඳහා භූමිය සකස් කර තිබිය යුතු බැවින් ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ධාරිතා සංවර්ධනය (Capacity Building) උදෙසා වන පුහුණු කිරීම් ඉදිරි වසර පහක කාලරාමුවක සිදු කෙරෙමින් පවතී. ළමා පොත්වල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම, කියවීම් හුරුව වර්ධනය කිරීම, පොතක ගුණාත්මකභාවය පිළිබඳ සමාජ දැනුවත්භාවය වැඩි කිරීම, මුද්‍රණ සහ ප්‍රකාශනවල තත්ත්වය ඉහළ නැංවීම, ළමා පොත්වල සෑම අංශයක් සඳහා ම ප්‍රමිති හඳුන්වා දීම එහිදී අවධානය යොමු කෙරෙන කාරණා ය. ලේඛක, චිත්‍රශිල්පී, සංස්කාරක, සැලසුම්ශිල්පී ,කලා අධ්‍යක්ෂ, ප්‍රකාශක, මුද්‍රණශිල්පී, විවිධ සමාජ කණ්ඩායම් සහ ඉලක්කගත කණ්ඩායම වන ළමයා යන අය අදාළ පැතිකඩ ඔස්සේ දැනුවත් කිරීම සහ පුහුණු කිරීම යන කාර්යයන් ද මෙහිදී ක්‍රියාත්මක වේ.

# අඳින අතටත් සම්මානයක්

**නුවන් කුමාර කටුගම්පල**

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කලා මණ්ඩලය, රාජ්‍ය සාහිත්‍ය උපදේශක කාරක සභාව එක් ව සංවිධාන කරන රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් පවත්වන මෙරට ප්‍රධානතම සාහිත්‍ය සම්මාන උළෙලයි.

මෙරට පළවන සාහිත්‍ය ශානරවලට අයත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි ස්වතන්ත්‍ර සහ පරිවර්තන පොත් ඇගයුම් කර ජයග්‍රාහී ලේඛක ලේඛිකාවන් තෝරා මෙහිදී සම්මාන පිරිනමයි. මීට ඇගයුම් සම්මානයක්, සහතිකපතක් හා මූල්‍ය ත්‍යාග යක් ද ඇතුළත් ය.

රාජ්‍ය සාහිත්‍ය උළෙලේදී අනෙකුත් පොත්වලට මෙන් ම ළමා සාහිත්‍ය කෘති සඳහා ද මෙතෙක් සම්මානයට පාත්‍ර වූයේ ලේඛකයා පමණි. සිතුවම් සහිත ළමා කතන්දර පොත්වල චිත්‍ර ශිල්පියා ඇගයුණේ නැත. 2024 ජුනි මස 04 දින සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේදී රැස් වූ රාජ්‍ය සාහිත්‍ය උපදේශක කාරක සභාව එහි සියලු ම සාමාජිකයන් ඒකමතික ව ගන්නා ලද තීරණයකට අනුව මේ වසරේ (2024) සිට රචකයා සහ චිත්‍රශිල්පියා යන දෙදෙනා ම සම්මානයට පාත්‍ර කෙරේ. වසර ගණනක් මුළුල්ලේ ළමා සාහිත්‍යයේ නිරත චිත්‍ර නිර්මාණ ශිල්පීන් විසින් මේ අවශ්‍යතාව පෙන්වා දී තිබුණත් එය සැලකිල්ලට භාජනය නොවිණි.

මේ නව ප්‍රවර්ගය (Category) මෙවර සම්මාන පිරිනැමීමට තෝරා ගැනුණේ ශ්‍රී ලංකා ළමා සාහිත්‍ය සංසදය සමග එක්ව ළමා සහ යෞවුන් චිත්‍රශිල්පී සහ ලේඛක එකමුතුව කළ ඉල්ලීම් සලකා බලමිනි. ඒ, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් බුවනෙක හේරත් සහ අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන) තිලක් නන්දන හෙට්ටිආරච්චිගේ මගපෙන්වීම මත තමා විසින් රාජ්‍ය සාහිත්‍ය උපදේශක සභාවට යොමු කරන ලද යෝජනාවට ඒකමතික අනුමැතිය ලැබීමේ ප්‍රතිඵලය ලෙස බව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ යසින්තා ගුණවර්ධන පවසයි. ඒ ඔස්සේ සිතුවම්කරණයේ නියුතු ශිල්පීන්ගේ වෘත්තීයභාවයත් ළමා සාහිත්‍ය කෘතිවල තිබිය යුතු ගුණාත්මකභාවය සහ ළමයාට උචිතභාවයත් වර්ධනය වීමට චිත්‍රවලින් සැලසෙන දායකත්වය තවදුරටත් ඉහළ නැංවෙනු ඇතැයි ද ඇය පැවසුවා ය.

ප්‍රවීන චිත්‍ර ශිල්පී, චිත්‍ර ආචාර්ය සහ ළමා සාහිත්‍යවේදී අරුණ කීර්ති ගමගේ ගේ අදහස වන්නේ ළමා පින්තූර කතන්දර පොතකට චිත්‍රයේ දායකත්වය 100% සිට 80% පමණ දක්වා පරාසයකින් යුක්ත වන බව ය. එවැනි දායකත්වයක් දෙන ශිල්පියා ඇගයීමට ලක්වීමෙන් ඔවුන්ට උත්තේජනයක් සහ වරප්‍රසාදයක් ලැබෙනු ඇත. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ පැවති මේ පිළිබඳ යෝජනා හා සාකච්ඡා වටවලදී ළමා සාහිත්‍යවේදීන් බලාපොරොත්තු නොවූ තරම් ඉක්මනින් සිය ඉල්ලීම පිළිගෙන, ඊට අනුමැතිය ලබාගෙන, මේ වසරේදී ම එය ක්‍රියාවට නැංවීමට පියවර ගැනීම අගයන බව ද ඔහු පැවසී ය.

කුඩා දරුවා පොතකට ආකර්ෂණය වී පොත අතට ගැනීම සඳහා මූලික පෙළඹීම ඇති වන්නේ සිතුවම් නිසා ය. ලේඛකයා බඳු ම පරිකල්පන ශක්තියකින් යුතු ව අඳින ලද උසස් තත්ත්වයේ සිතුවම්කරණයක් සහිත ළමා පොතකින් දරුවාගේ ඇති කළ හැකි වෙනස ඉතා ප්‍රබල ය.




දරුවා භාෂාව භාවිතයට ආශක්ත වන්නේ ද චිත්‍ර කියවීමෙනි. චිත්‍ර ශිල්පියාගේ වෘත්තිය ඉතා වගකිව යුතු වූවක් වන්නේ එබැවිනි. රජය ගත් මේ පියවර නිසා අනෙකුත් සාහිත්‍ය සම්මාන උළෙල සංවිධායකවරු ද ඒ පිළිබඳ ඉදිරියේදී උනන්දු වනු ඇති අතර අනාගත ශ්‍රී ලාංකේය ළමා කෘති නිර්මාණ ක්ෂේත්‍රය ජාත්‍යන්තරය සමග තරග කළ හැකි මට්ටමට පත්වීමට උත්තේජකයක් ද වනු ඇත.

# දිවියට කදිම බණවරක්


## ‘අමල්බිසෝ’ සහ ‘කුරුළු පාළුව’


කේ. බී. මානෑව

අකුරට පියමනින අවධියේදී ම ‘අපේ මුතුන්මිත්තන්’ නමින් ළමා කතාවක් ලියා විශ්මිත ළමා ලේඛකයා නමින් පටබැඳි ගාමිණී නිශාන්ත කරුණාරත්න අද විවිධ කලා ක්ෂේත්‍රවල ස්වකීය තෙවැනි ඇසින් විනිවිදින සාහිත්‍යකරුවෙකි. දුක්කන්ද පාමුල සිටි අම්මා (පද්‍ය), හිරුවඩන මඟුල (ගීත), වප්මඟුල (පද්‍ය), විසැස් කමලාව (කෙටිකතා) මෙන් ම මන්දාරම් එනුවර-සංසාර බණවර (පද්‍ය) යන ඔහුගේ වත්මන් සංකල්පික වියමන් ඊට අවිරෝධිත ව දෙස්දෙනු නොඅනුමාන ය.

රජයේ ප්‍රවෘත්ති නිලධාරියකු වන ගාමිණී නිශාන්ත කරුණාරත්නට තමා මෙතෙක් ස්පර්ශ කළ කලා කෙෂ්ත්‍ර පාදක කරගෙන සිය පෑන මෙහෙයවා පාඨක සුමුව ආකර්ෂණීයත්වයට පත් කළ නමුදු පැටි ප්‍රජාව ඇදබැඳ ගැනෙන ළමා නිර්මාණයක් සඳහා පෑන හසුරුවාලීම එතරම් සූකර නොවන බව පසක් වූයේ ළමා මනසට ගෝචරාකාරයෙන් ළමා නිරිමාණවල නියැළෙන නිර්මාපකයකු සතු ව තිබිය යුතු වගභාරය සුළුපටු නොවන හෙයිනි.

මාතෘ ගර්භගත සමයේ සිට ම මව පාදක කරගෙන නැගෙන, දැනෙන දැයින් දරුවා වින්දනයක් ලබන බව නූතන පර්යේෂණවලින් සනාථ වී ඇත. තන කිරෙන් උදර පෝෂණය ලබන සිඟිත්තා තොටිල්ල පදවද්දී සුවබර නින්දකට සමවදින්නේ ඇසෙන මවගේ නැලවිලි නාද රටාවෙන් සිත් සතන් පිනා යෑම නිසා ය. පිනා යාම යනු ද වින්දනයයි. අනතුරු ව දරුවාගේ වැඩීමත් සමග මිනිස් ප්‍රජාවගේ කතාන්දර රසයෙන් වින්දනයක් ලබයි. ඉක්බිති ව ළමා සිත්සතන් ඇදබැඳ ගන්නා අලංකාරී වූ නිර්මාණවලින් ළමා සිතට පහසුවෙන් කාවදින විනෝදාස්වාදාත්මක




සිඟිති කතාන්දර පොතපතට ළමා මනසේ ඇතිවන ලැදියාව වැඩිදියුණු වීමෙන් සාහිත රස පහසට දරුවා පෙළඹෙන්නේ අනවරතයෙනි.

මේ න්‍යාය ළමා පොත් නිර්මාණය කරන ලේඛක ලේඛිකාවන් ගැඹුරින් පසක් කරගත යුතු වේ. ළමා මනස ප්‍රමාණික ව දැනහඳුනා ගැනීම, ළමා ලොවට මනසින් පිවිසීම, ළමා මනසේ සංවර්ධනය ජනිත වන අයුරින් ආස්වාදජනක ව සුබවාදී ආකල්ප ගොඩ නැගීම, සරල කතා කලාව, පැටි මනස පුබුද්ධිත කැරෙන චිත්‍ර හා සටහන් ආදිය පිළිබඳ පරිඥානික දැනුම් සම්භාරයකින් සමන්විත ව ලියැවුණු ළමා නිර්මාණ වඩවඩාත් පරිශීලනය කිරීම ළමා පොත් නිර්මාපකයන්ගේ පරම යුතුකමකි. එම ධර්මතාව යුක්ති යුක්ත ව පහදාගෙන සතිමත් ව ළමා නිර්මාණ සඳහා යොමුවීම බරසාර වගකීමක් බව තමා තරයේ ම පුන පුනා අවධාරණය කරගතයුතු වෙයි.

මේ වගකීම් ගොන්නට තම ශක්ති ප්‍රමාණයෙන් උර දෙමින්

ළමා මනසේ සංවර්ධනය ජනිත වන අයුරින් ආස්වාදජනක ව සුබවාදී ආකල්ප ගොඩ නැගීම, සරල කතා කලාව, පැටි මනස පුබුද්ධිත කැරෙන චිත්‍ර හා සටහන් ආදිය පිළිබඳ පරිඥානික දැනුම් සම්භාරයකින් සමන්විත ව ලියැවුණු ළමා නිර්මාණ වඩවඩාත් පරිශීලනය කිරීම ළමා පොත් නිර්මාපකයන්ගේ පරම යුතුකමකි.

ගාමිණී නිශාන්ත කරුණාරත්න තදනුබද්ධ දිනෙක ළමා ප්‍රජාවට දායාද දීමේ අටියෙන් කැන්දන් ආවේ 'අමල් බිසෝ' හා 'කුරලු පාළුව' යන ළමා පොත් පිංච යුගලයි.

"එකමත් එක කැළෑවක් ළග ලස්සන ගම්මානයක් තිබුණා. ඒ ගම කෙළවර පිහිටි පුංචි ගෙදරක පුංචි පවුලක් ජීවත් වුණා. අම්මයි, අප්පච්චියි, අක්කයි, මල්ලියි, ගිරවයි, පූසයි තමයි ගෙදර සාමාජිකයෝ. අක්කගේ නම අමල් බිසෝ. මල්ලිගේ නම සපුමල්. ගිරවගේ නම පෙත්තප්පු, පූසිගේ නම සුදු මැණිකේ..."

මේ ආකාරයෙන් අමල්බිසෝ අන්දරය දිග හැරෙන්නේ දරුවාට වින්දනය මෝදු කිරීම, කරුණාව, දයාව, සහජීවනය, එඩිතරබව මෙන් ම සමාජගතවීම යන ආකල්ප අවුළුවාලමිනි. එහි යථාවබෝධය පහදාගත හැක්කේ මේ ළමා කතාව කියවා බැලීමෙනි.

'අමල්' යන්නෙහි අරුත පිරිසිදු බව ය. ළමා මනස ද නොකිලිටි ය. පැරණි ජනකතා මූලාශ්‍රයක් ගෙන ගාමිණී එය නව හැඩයක් ගන්වා පණ පිහිටුවයි. ඒ, ළමා මනසට උචිත ආකාරයට ය. ගාමිණීගේ මේ ප්‍රතිනිර්මාණය ළමා මනස වින්දනීය ඉසව් කරා රැගෙන යනවා පමණක් නොව තමාගේත් පවුලේත් ආරක්ෂාව පිළිබඳ කුඩා කල සිට ම සිතන්නට පොළඹවයි.

"දුවේ අමල් බිසෝ මල්ලි ව හොඳට බලාගන්ට ඕනේ. පූසට බත් මදි කරන්ට එපා ලිපේ චූ කරයි. ගිරවට බත් මදි කරන්ට එපා ඉගිලිළ යයි."

'අමල් බිසෝ' කතාවේ සංවාද, වර්ණනා මෙන් ම භාෂාව ද ළමා මනසට ගෝචර ය. පරිකල්පනයට මනස හුරු කරන සුළු ය. පොතට යොදා ගන්නා කුමාරසිරි ලේල්වලගේ සිතුවම් ද සිද්ධි නිරූපණයට මනාව ගැළපී ඇත.

"එකමත් එක කාලෙක ඇත පිටිසර කුරුලු බැද්ද කියලා ගම්මානයක් තිබුණා. ඒ ගම කුරුල්ලන්ගෙන් පිරී ඉතිරිල තිබුණු නිසයි කුරුලු බැද්ද කීවේ." ගාමිණී කුරුලු පාළුව යනු



**ගාමිණී නිශාන්ත කරුණාරත්න**

කුමක්දැයි ළමයාට වටහා දීමට 'කුරුලු පාළුව' පොත් පිංච ලකලෑස්ති කරන්නේ එලෙසිනි. සත්ත්ව කරුණාව, සත්ත්ව හිංසාව, වරද දඬුවම, හොඳ නරක පිළිබඳ පමණක් නොව කුරුලු පාළුව යන්න නිදසුන් සහිත ව ගෙනහැර පාන්නටත් මේ පොත් පොඩිය සමත් වී ඇති බව සත්‍ය වශයෙන් දැන ගැනීමට නම් ඊට සමවැදිම මැනවි ය.

"ඉර මාමට හැමදාම කරන්ට වැඩ ගොඩක් තිබුණා. ගස්වැල්වල මල් පුබුදුවන්න ඕනෑ. ගෙඩි හදන්ට ඕනෑ. මිනිස්සුන්ට විටමින් ඩී හදල දෙන්ට ඕනෑ. අච්ච පායන්ට ඕනෑ. වැස්ස දෙන්ට ඕනෑ. වෙලාව කියන්ට ඕනෑ. රෑ දවල් වෙන් කරන්ට ඕනෑ. වැඩ ගොඩයි. පරක්කුවෙලා ඇහැරුණ නිසා ගොඩක් වැඩ අතපසු වුණා. ඉර මාමට කේන්ති ගියේ ඒ නිසයි."

'අමල්' යන්නෙහි අරුත පිරිසිදු බව ය. ළමා මනස ද නොකිලිටි ය. පැරණි ජනකතා මූලාශ්‍රයක් ගෙන ගාමිණී එය නව හැඩයක් ගන්වා පණ පිහිටුවයි. ඒ, ළමා මනසට උචිත ආකාරයට ය. ගාමිණීගේ මේ ප්‍රතිනිර්මාණය ළමා මනස වින්දනීය ඉසව් කරා රැගෙන යනවා පමණක් නොව තමාගේත් පවුලේත් ආරක්ෂාව පිළිබඳ කුඩා කල සිට ම සිතන්නට පොළඹවයි.

ඇතැම් විද්‍යාත්මක කරුණු ළමා මනසට ගෙන එනුයේ කතා රසයට අබමල් රේණුවකවත් හානියක් නොවන පරිද්දෙනි. ගැමියා තුළ පැවති සහජීවනය දහමකි. සතා සිව්පාවා, ගහවැල. ඇළ දොළ ජීවත් වූයේ එකට ය. 'කුරුලු පාළුව' යනු එහි සංකේතයකි. භාවිතයකි.

මෙලෙස ළමා කතා රචකයන් අවධානය යොමු කළ යුතු ළමා පොතක අන්තර්ගතය, වින්දනීය ආස්වාදය, සුබවාදී ආකල්ප ජනිත කරවීම මෙන් ම ළමා මනසේ සංවර්ධනයට සානුබල සපයන තේමා පාදක කරගනිමින් ගාමිණී නිශාන්ත කරුණාරත්න 'අමල්බිසෝ' සහ 'කුරුලු පාළුව' ළමා කතා රචනා කොට ඇත. එහෙයින් ස්වභාවධර්මගත සෞන්දර්යය, වාග් ලාවණ්‍යය, සුදර්ශනාව යහ ගුණාංගවලින් සමන්විත මේ ළමා පොත් යුගල පැටවියට, ගැටි වියට, මෙන් ම හොටි වියට ද කදිම බණවරක් වනු නොඅනුමාන ය.




# ඔලිම්පික් සිරි අසිරි

**වර්නන් ගුණසේකර**

ඔලිම්පික් ක්‍රීඩා උළෙල-2024 ප්‍රංශයේ පැරිස් අගනුවර පැවැත්වෙන්නේ ලෝකය වටා අස්ථිරබව වැඩි වෙමින් තිබෙන පසුබිමක් මධ්‍යයේ ය. රුසියාව ඔවුන්ගේ යුක්රේන ආක්‍රමණය තවදුරටත් කරගෙන යන අතර ඊශ්‍රායලය හා පලස්තීනයේ හමාස් සංවිධානය අතර යුද්ධයෙන් ගාසා තීරය දෙදරා ගොස් තිබේ.

සාමයේ හා රටවල් අතර හොඳ හිත වර්ධනය කිරීමේ සංකේතයක් විය යුතු ව තිබෙන ඔලිම්පික් ක්‍රීඩා උළෙළ යුද ගැටුම් හා වෙනත් සිදුවීම්වලින් ජාත්‍යන්තර ප්‍රජාව කම්පනයට පත් ව සිටින අවස්ථාවක පැවැත්වේ. යුද්ධයෙන් බැටකන යුක්රේනය හා පලස්තීනය සීමිත තරගකරුවන් පිරිසක් ඔලිම්පික් උළෙලට සහභාගි කර තිබෙන අතර රුසියාව හා ඔවුන්ගේ යුක්රේන ආක්‍රමණයට සහයෝගය දක්වන බෙලරුසියාවේ ක්‍රීඩකයන්ට කොන්දේසි කිහිපයක් සපුරාලීම මත පමණක් ඔලිම්පික් උළෙළ තරග වැදීමට අවසර ලැබී තිබේ.

විශේෂත්ව ගණනාවකින් යුක්ත 2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙල මීට පෙර නුදුටු සමාරම්භක උත්සවයකින් ජූලි 26 දින ආරම්භ විය. මෙතෙක් ඔලිම්පික් සමාරම්භක උත්සව පවත්වා තිබුණේ ඔලිම්පික් ක්‍රීඩා උළෙළ පැවැත්වෙන ප්‍රධාන ක්‍රීඩාංගණයේදී වුවත් ප්‍රංශය මෙවර එම සම්ප්‍රදායෙන් මිදී ඔවුන්ගේ ඔලිම්පික් සමාරම්භක උත්සවය පැරිසියේ සෙන් ගංගාවේ පැවැත්වී ය. වර්ෂාව මධ්‍යයේ බෝට්ටු 94ක නැග ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෙළපාළිය සෙන් නදියේ කිලෝමීටර් 06ක් දුරක පැවැත්විණි.

මේ සමාරම්භක උත්සවයේ ප්‍රවේශපත්වලින් වැඩි සංඛ්‍යාවක් නොමිලේ ලබා දුන්න ද එම ටිකට් ලැබුණේ ආරාධිතයන්ට පමණයි. මුදල් ගෙවා ලක්ෂයක පමණ ජනතාවක් සමාරම්භක උත්සවය නැරඹූ අතර ලක්ෂ 2.2ක් පමණ ජනයා සෙන් ගංගාවේ ඉහළ ඉවුරුවල සිට නොමිලේ සමාරම්භක උත්සවය දැක බලා ගත්හ. අඩු ආදායම් ලබන අඩු පහසුකම්වලින් යුත් ප්‍රදේශවල ජනතාවට, ක්‍රීඩා මෙහෙයුම් ආයතන හා ඔලිම්පික් ක්‍රීඩා උළෙළ සංවිධානය කිරීමට උපකාර කළ නගරයේ සේවකයන් හා වෙළෙන්දන්ට මූලිකත්වය දෙමින් ප්‍රවේශ පත් 55,000ක් නොමිලේ බෙදා හැර තිබිණි. ඉහළ සිට බලන විට සෙන් ගංගාව පෙනෙන මානයේ තිබෙන මහල් නිවාස හා ගොඩනැගිලිවල සිට 200,000ක පමණ ජනතාව සමාරම්භක උත්සවය නැරඹූහ.

පැරිසිය මෙවර ඔලිම්පික් ක්‍රීඩා උළෙළට සත්කාරකත්වය දැක්වූයේ තෙවැනි වතාවට ය. පළමු වරට 1900 වසරේ පැවැත්වීමෙන් පසුව පැරිසියේ දෙවැනි ඔලිම්පික් උළෙල පැවතියේ මීට වසර 100කට පෙර 1924 වසරේදී ය. ඒ අනුව පැරිසිය ඔලිම්පික් ක්‍රීඩා උළෙළක් තෙවතාවක් පැවැත්වූ එක ම නගර දෙක ලෙස ලන්ඩනය සමග එක්විය. ලන්ඩනය 1908, 1948 හා 2012 වසරවලදී ඔලිම්පික් ක්‍රීඩා උළෙළට සත්කාරකත්වය දැක්වී ය.

රටවල් 206කින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 10,500ක් මෙවර ඔලිම්පික් උළෙලට සහභාගි වන අතර මීට අමතර ව සරණාගතයන් නියෝජනය කරන කණ්ඩායමක් ද තරග වැදීමට නියමිත ය. ජගත් ඔලිම්පික් කමිටුවේ සරණාගතයන්ගේ කණ්ඩායම ලොව නොයෙකුත් රටවලින් උන්හිටිතැන් අහිමි වූ ජනගහනය නියෝජනය කරති. ක්‍රීඩක ක්‍රීඩිකාවන් 37 දෙනකුගෙන් සමන්විත මේ කණ්ඩායම ක්‍රීඩා 12කට සහභාගි වෙති.

පැරිස් ඔලිම්පික් උළෙලේ පදක්කම් පිරිනැමෙන ඉසව් සංඛ්‍යාව 329කි. මෙයින් 152ක් කාන්තාවන් සඳහා වන අතර 20ක් පැවැත්වෙන්නේ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම වෙනුවෙනි. මෙවර ඔලිම්පික් ජයග්‍රාහකයන්ට පිරිනැමෙන සෑම පදක්කමක ම සුප්‍රසිද්ධ අයිෆල් කුලුනේ යකඩ කැබැල්ලක් අඩංගු වීම විශේෂත්වයකි. ප්‍රංශයේ සයකොන් භූගෝලීය හැඩය නිසා මේ පදක්කම් ද සයකොන් හැඩයකට නිමවා ඇත. අයිෆල් කුලුනේ යකඩ කැබලි වටා රන්, රිදී හා ලෝකඩ ඩිස්ක සවි කර තිබේ.

ඇමරිකාව මෙවරත් ඔලිම්පික් පදක්කම් සටහන අභිභවනය කරනු ඇතැයි

අපේක්ෂා කෙරේ. පසුගිය ඔලිම්පික් ක්‍රීඩා උලෙළ හතේදී ම පදක්කම් වැඩි ම සංඛ්‍යාවක් හිමිකර ගැනීමට සමත් වූයේ ඇමරිකාවයි. චීනය දෙවැනි ස්ථානයට පත්වනු ඇති වුව ද ඔවුන් වැඩි ම රන් පදක්කම් සංඛ්‍යාවක් දිනා ගනු ඇතැයි අනුමාන කෙරේ.

ජගත් ඔලිම්පික් කමිටුව විසින් රුසියාව 2022 වසරේ යුක්රේනය ආක්‍රමණය කිරීමෙන් පසුව රුසියාවේ සහ බෙලරුසියාවේ ක්‍රීඩකයන්ට ජාත්‍යන්තර ක්‍රීඩා තහනමක් පනවනු ලැබී ය. එහෙත් ඉන්පසුව එම තීරණය ලිහිල් කළ කමිටුව, දෙරට ක්‍රීඩකයන්, ඔවුන්ගේ පවුල්වල අය යුද්ධයට කුමන ආකාරයකින් හෝ සම්බන්ධ නැති බවට සහතික වීමේ කොන්දේසිය මත ඔවුන්ට මධ්‍යස්ථ ක්‍රීඩකයන් ලෙස පැරිස් ඔලිම්පික් උලෙළට සහභාගි වීම සඳහා අවසර ලබා දුන්නේ ය. ඔවුන්ට අවසර දී තිබෙන්නේ තනි ඉසව්වලට තරග කිරීමට පමණක් වන අතර කණ්ඩායම් තරගවලට සහභාගි වීමට අවස්ථාව හිමි වී නැත. මේ ක්‍රීඩකයන්ට ඔවුන්ගේ රටවල ජාතික ධජය හා ජාතික ගීතය භාවිත කිරීමට අවසර නොලැබුණු අතර සමාරම්භක උත්සවයේ ක්‍රීඩක පෙළපාළියට ද ඔවුන් සහභාගි කර ගත්තේ නැත. කොන්දේසි සපුරා නොගත් එහෙත් ඔලිම්පික් ක්‍රීඩා උලෙළට සුදුසුකම් ලැබූ රුසියානු ක්‍රීඩකයන් 245 දෙනකුට රුසියානු ඔලිම්පික් කමිටුව වන්දි මුදල් ගෙවා තිබේ.

පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උලෙළ තරග කරන වයසින් වැඩි ම ක්‍රීඩකයා වනුයේ අශ්වාරෝහක ඉසව්වට කැනඩාවෙන් ඉදිරිපත් ව සිටින Mario Deslauriers ය. ජපානයේ ටෝකියෝ නුවර පැවති පසුගිය ඔලිම්පික් ක්‍රීඩා උලෙළට ඔහු සහභාගි වූයේ 1984 හා 1988 වසරවල පැවති ඔලිම්පික් උලෙළට සහභාගි වී වසර 33කට පසුව ය. මේ ක්‍රීඩකයා 1984 වසරේ ප්‍රථම වතාවට ඔලිම්පික් තරග බිමට පිවිසෙන විට ඔහුගේ වයස අවුරුදු 19කි. 2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උලෙළ සහභාගි වන විට ඔහුගේ වයස අවුරුදු 59කි.

මෙවර ඔලිම්පික් උලෙළ ඉසව් 329ක් හා ක්‍රීඩා 32කින් සමන්විත වෙයි. එම ක්‍රීඩා වනුයේ ජල ක්‍රීඩා (පිහිනුම්, මැරතන් පිහිනුම්, කිමිදීම, ජල පෝලෝ, රිද්මයානුකූල පිහිනුම්), දුනු විදීම, මලල ක්‍රීඩා, බැඩ්මින්ටන්, බාස්කට්බෝල් (3o3, බාස්කට්බෝල්), බොක්සිං, බ්‍රේක්ඩාන්සිං, ඔරු පැදීම, පාපැදි (BMX නිදහස් ආර, BMX රේසිං, මාර්ග පාපැදි, ධාවන පථ පාපැදි), අශ්වාරෝහක ක්‍රීඩා, කඩු හරඹ, පාපන්දු, ගොල්ෆ්, ජිම්නාස්ටික්, හැන්ඩ්බෝල්, හොකී, ජූඩෝ, නවීන පංච ප්‍රයාම, රුවල් ඔරු පැදීම, රග්බි (සත් සාමාජික), යාත්‍රා පැදීම, ඉලක්කයට වෙඩි තැබීම, ස්කේට්බෝඩිං, ක්‍රීඩා කඳු නැගීම, සර්ෆිං, ටේබල් ටෙනිස්, ටයිකොන්ඩෝ, ටෙනිස්, තුන් ප්‍රයාම, වොලිබෝල් (වෙරළ වොලිබෝල්, වොලිබෝල්), බර ඉසිලීම හා මල්ලව පොර ය.


කයිල් අබේසිංහ


තරුෂි කරුණාරත්න


ගංගා සෙනෙවිරත්න


ඩිල්හානි ලේකම්ගේ


අරුණ දර්ශන


විරේන් නෙත්තසිංහ

තුන්ප්‍රයාම ඉසව්වේ පිහිනුම් අදියර හා මැරතන් පිහිනුම් තරග පැවැත්වීමට නියමිත ව තිබෙන්නේ සෙන් ගංගාවේ ය. එහෙත් මේ ගංගා ජලයේ අපවිත්‍රකම නිසා ඔලිම්පික් සංවිධායකයන් මහත් අර්බුදයකට මුහුණ පා සිටිති. මේ ගංගාවේ පිහිනීම වසර සියයක් තිස්සේ ජනතාවට තහනම් කර තිබිණි. එවැනි අපිරිසිදු ජලයක් තරගාවලිය වෙනුවෙන් පිරිසිදු කිරීම පිණිස ප්‍රංශයට අතිවිශාල මුදලක් වැය කිරීමට සිදුවිය. අවසානයේ, සෙන් ගංගාවේ ජලය පිරිසිදු බවට ඔලිම්පික් පිහිනුම් ක්‍රීඩකයන්ට ඔප්පු කිරීම පිණිස එම ජලයේ බැස පිහිනීමට පවා ප්‍රංශයේ ක්‍රීඩා ඇමතිවරිය හා පැරිස් නගරාධිපතිනියට සිදුවිය.

2021 ටෝකියෝ ඔලිම්පික් උළෙලේ තිබූ ක්‍රීඩා තුනක් පැරිස් ඔලිම්පික් තරග බිමට ඇතුළත් කර නැත. එම ක්‍රීඩා වනුයේ බේස්බෝල්, සැහැල්ලු පන්දු හා කරාටේ ය. ඔලිම්පික් ක්‍රීඩා උලෙළ දක්නට ලැබෙන තවත් විශේෂත්වයක් වනුයේ තරගකරුවන්ගේ ස්ත්‍රී-පුරුෂ සමානත්වයයි. අතිරේක ක්‍රීඩකයන් ද ඇතුළු ව 11,000කට වැඩි පිරිමි හා කාන්තා තරගකරුවන්ගේ 50ට 50ක බෙදීමක් ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව ඉලක්ක කරගෙන තිබිණි. කමිටුවේ නවතම සංඛ්‍යා අනුව සංවිධායකයන් සිටින්නේ එම ඉලක්කයට මඳක් අඩුවෙන් වීමට ඉඩ තිබේ. පදක්කම් පිරිනැමෙන තරග 329 අතරේ තවමත් පිරිමි පාර්ශ්වයේ කුඩා වැඩිවීමක් පෙනෙන්නට තිබේ. පිරිමි ඉසව් 157ක්, කාන්තා ඉසව් 152ක් හා මිශ්‍ර ඉසව් 20ක් තිබෙන බවට ජගත් ඔලිම්පික් කමිටුව ප්‍රකාශ කර ඇත. ක්‍රීඩා 32න් 28ක් ම සම්පූර්ණයෙන් ස්ත්‍රී-පුරුෂ සමානත්වයෙන් යුක්ත බව කමිටුව පවසා තිබේ.

Nonbinary ක්‍රීඩිකාවක් හා සංක්‍රාන්ති ලිංගික ක්‍රීඩිකාවක් ද පැරිස් ඔලිම්පික් උලෙළට සහභාගි වන බවට කමිටුව පවසා තිබේ. මීටර් 1500 ඉසව්වේ තරග වදින



ඇමරිකාවේ Nikki Hiltz සහ කැනඩාවේ පාපන්දු කණ්ඩායමේ සිටින Quinn එම ක්‍රීඩිකාවෝ වෙති. Hiltz පසුගිය මාසයේ පැවති ඇමරිකානු ජවන හා පිටිය ඔලිම්පික් සුදුසුකම් ලබා ගැනීමේ උළෙළහිදී මීටර් 1500 ඉසව්ව ජයග්‍රහණය කළ අතර Quinn මීට තෙවසරකට පෙර ටෝකියෝ නුවරදී කැනේඩියානු පාපන්දු කණ්ඩායම සමග ඔලිම්පික් රන් පදක්කම දිනා ගත්තා ය. ශරීරයේ පිරිමි ජාන තිබෙන බවට තහවුරු වී ඇතැයි පවසමින් ජාත්‍යන්තර බොක්සිං සංගමය විසින් පසුගිය වසරේ ලෝක ශූරතාවලියෙන් ඉවත් කෙරුණු ඇල්ජීරියාවේ ඉමාන් කලීෆ් හා තායිවානයේ ලින් යූ-ටිං යන ක්‍රීඩිකාවන් දෙදෙනාට ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව පැරිස් තරග බිමට පිවිසීමට මං විවර කර දීම තවත් විශේෂත්වයකි.

බ්‍රේක්ඩාන්සිං ලෙසින් ජනප්‍රිය 'බ්‍රේකිං' ක්‍රීඩාව පළමු වරට ඔලිම්පික් ක්‍රීඩා උළෙළට එක් කර තිබේ. ටෝකියෝ ඔලිම්පික් තරග බිමට මංගල වතාවට පැමිණි සර්ෆිං ක්‍රීඩාව නැවත වතාවක් පැරිස් ඔලිම්පික් උළෙළ ස්ථානයක් හිමිකර ගෙන සිටී. එහෙත් සර්ෆිං ක්‍රීඩාව පැවැත්වෙන්නේ පැරිසියේ හෝ ප්‍රංශයේ නොවේ. එම තරග පැවැත්වීමට නියමිත ව තිබෙන්නේ ප්‍රංශ අගනුවරින් සැතපුම් 9,000ක් ඈතින් තිබෙන ප්‍රංශ පොලිනීසියාවේ Tahiti දූපතේ පිහිටි Teahupo නමැති ගම්මානයේ ය. සර්ෆිං මෙන් ම ස්කේට්බෝඩිං හා ක්‍රීඩා කඳු තරණය ද ඔලිම්පික් ක්‍රීඩා උළෙළට මෙවර ඇතුළත් වනුයේ දෙවැනි වතාවට ය.

2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ ප්‍රධාන ක්‍රීඩක ගම්මානය ඉදිකරන ලද්දේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 15000කට නවාතැන් පහසුකම් සැලසීම අරමුණු කරගෙන ය. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විවිධ ගම්මාන පහක නවාතැන් පහසුකම් පිළියෙල කර තිබේ. ඔලිම්පික් හා පැරාලිම්පික් ගම්මානවලට අමතර ව යාත්‍රා පැදීම, බාස්කට්බෝල් සහ හෑන්ඩ්බෝල්, ඉලක්කයට වෙඩි තැබීම හා සර්ෆිං ක්‍රීඩා වෙනුවෙන් ද ක්‍රීඩක ගම්මාන පිහිටුවා තිබේ.

ඔලිම්පික් ක්‍රීඩා උළෙළ නිමා වීමෙන් පසුව එම ස්ථාන 12000කට ආසන්න පුද්ගලයන් රැකියාව කරමින් ජීවත් වන නේවාසික සංකීර්ණ, කාර්යාල සහ සාප්පුවලින් සමන්විත ස්ථිර නාගරික පෙදෙස් බවට පරිවර්තනය කිරීම 2025 වසරේ සිට ආරම්භ කරනු ඇත.

ඔලිම්පික් උළෙළ ප්‍රංශය නියෝජනය කරන මුස්ලිම් ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ චාරිත්‍රානුකූල 'හිජැබ්' වේලයෙන් හිස වසාගෙන තරගවලට සහභාගි වීම තහනම් කිරීම මහත් ආන්දෝලනයකට තුඩු දුන් කරුණක් විය.

2024 පැරිස් ඔලිම්පික් ක්‍රීඩා උළෙලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 06 දෙනෙක් සහභාගි වෙති. ඒ, මලල ක්‍රීඩා සඳහා තිදෙනෙක්, පිහිනුම් ඉසව් සඳහා දෙදෙනෙක් සහ බැඩ්මින්ටන් තරග සඳහා ක්‍රීඩකයකු වශයෙනි. මලල ක්‍රීඩාවලදී තරුෂි කරුණාරත්න හා ඩිල්හානි ලේකම්ගේ පිළිවෙළින් කාන්තා මීටර් 800 හා හෙල්ල විසිකිරීමේ තරගවලටත් අරුණ දර්ශන මීටර් 400 ඉසව්වටත් සහභාගි වන අතර පිහිනුම් තටාකයේදී ගංගා සෙනවිරත්න කාන්තා මීටර් 100 පසුපස ආර හා කයිල් අබේසිංහ පිරිමි මීටර් 100 නිදහස් ආර ඉසව්වලට සහභාගි වෙති. විරේන් නෙත්තසිංහ බැඩ්මින්ටන් තරග බිමේ ශ්‍රී ලංකාව නියෝජනය කරනු ඇත.

ඔලිම්පික් සමාරම්භක උළෙලේ ක්‍රීඩක ක්‍රීඩිකා ආචාර පෙළපාළියේදී ශ්‍රී ලංකා ධජය රැගෙන යාමේ ගෞරවය හිමිවූයේ ලේකම්ගේ හා නෙත්තසිංහට ය.




දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-